ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

இலங்கை அரச மருந்தகக் கூட்டுத்தாபனம்

State Pharmaceuticals Corporation of Sri Lanka

2018

වාර්ෂික වාර්තාව



වාර්ෂික වාර්තාව
2018

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

අන්තර්ගතය

- අපගේ දර්ශනය, මෙහෙවර, පරමාර්ථ සහ අපගේ පාඨය 01
- ප්‍රතිඵල සාරාංශය 02
- අධ්‍යක්ෂ මණ්ඩලය හා ආයතනික තොරතුරු 03-04
- කළමනාකාර මණ්ඩලය 05-07
- සභාපතිතුමාගේ ප්‍රකාශය 08
- කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ ප්‍රකාශය 09-10
- අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 11-12
- විගණන කමිටු වාර්තාව 13
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 14
- ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය 15
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 16
- ඔසුසල ආදායම් ප්‍රකාශනය 17-19
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 20
- ගිණුම්කරණ ප්‍රතිපත්ති 21-29
- ගිණුම් සඳහා සටහන් 30-57
- විගණකාධිපතිගේ වාර්තාව 58-67
- විගණකාධිපතිගේ වාර්තාව සම්බන්ධව සභාපතිතුමාගේ අදහස් දැක්වීම 68-76
- මානව සම්පත් විශ්ලේෂණය 77
- ආදායම් වාර්තාව සම්බන්ධ වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු 78
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සම්බන්ධ වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු 79
- විකුණුම් ජාලය 80

ඔබේ සුවසෙත අපේ පැතුමයි

අපගේ දර්ශනය

නිරෝගිමත් ජාතියක් ගොඩනැංවීමේ ප්‍රධාන සහකරු බවට පත්වීම.

අපගේ මෙහෙවර

ඖෂධීය නාමයෙන් යුතු ඖෂධ භාවිතය ප්‍රවර්ධනය කරමින්, උසස් තත්ත්වය සහතික කල ආරක්ෂාකාරී හා ප්‍රතිඵලදායක ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ සාධාරණ මිලට සපයා ජනතාවට සේවා සපයන ප්‍රමුඛ ආයතනය බවට පත්වීම.

අපගේ පරමාර්ථ

ජනතා සේවයට ප්‍රමුඛතාවය
ගුණාත්මක බව හා ආරක්ෂාව
අසමසම අවංකභාවය
විශ්වාසදායක හවුල්කරුවෙකු සහ ක්‍රියාකාරී සාමාජිකයෙකු වීම
විශිෂ්ඨ කාර්යසාධනය සඳහා බැඳීම
අවශ්‍යතා හඳුනාගැනීම.

අපගේ පාඨය

ඔබේ සුවසෙත අපේ පැතුමයි.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

ප්‍රතිඵල සාරාංශය

විස්තරය	2018 රු. "000"	2017 රු. "000"	විචලනය (%)	2016 රු. "000"
රාජ්‍ය ඖෂධ සංස්ථාවේ විකුණුම්	7,458,320	6,593,401	13.1	6,127,478
රාජ්‍ය බෙහෙත් ගබඩාවට කල සැපයුම්	31,436,986	25,970,290	21.0	26,127,912
මුළු ආදායම	**38,895,306**	**32,563,691**	19.4	**32,255,390**
දළ වෙළඳ ලාභය - රා.ඖ.සං	1,810,383	1,680,368	7.7	1,656,938
දළ අතිරික්තය - රා.බෙ.ග	2,125,052	1,887,026	12.6	1,850,649
දළ අතිරික්තය	**3,935,435**	**3,567,394**	10.3	**3,507,587**
වෙනත් ආදායම්	73,072	53,004	37.9	43,084
පරිපාලන වියදම්	(1,535,277)	(1,288,184)	(19.2)	(1,101,435)
වෙනත් මෙහෙයුම් වියදම්	(691,968)	(741,459)	6.7	(580,844)
මූල්‍ය පිරිවැය	(1,512)	(1,295)	(16.8)	(1,071)
බැංකු අයිරා පොළී	(67,405)	(35,199)	(91.5)	(5,434)
මූල්‍ය ආදායම්	7,436	5,765	29.0	5,721
බදු ගෙවීමට පෙර ලාභය	**1,719,781**	**1,560,026**	10.2	**1,867,608**
විශ්‍රාමික පාරිතෝෂික	30,453	(59,575)	(151.1)	10,049
බදු ගෙවීම්	(766,631)	(470,595)	(62.9)	(625,864)
එකතු විස්තිරණ ආදායම	**983,603**	**1,029,856**	(4.5)	**1,251,793**
භාණ්ඩාගාර අයබදු/ලාභාංශ	-	**(222,000)**	-	**(216,000)**
රඳවාගත් ලාභ	8,794,490	6,792,893	29.5	5,985,037
කොටස් ප්‍රාග්ධනය හා සංචිත	125,117	125,117	-	125,117
ජංගම නොවන වත්කම්	2,222,544	2,179,335	2.0	2,166,630
ජංගම වත්කම්	20,480,515	10,699,807	91.4	7,353,933
ජංගම නොවන වගකීම්	271,308	264,651	(2.5)	192,212
ජංගම වගකීම්	13,512,143	5,696,481	(137.2)	3,218,196
ශුද්ධ ජංගම වත්කම්	6,968,372	5,003,326	39.3	4,135,737
මූලික අනුපාත				
දළ ලාභ අනුපාතය (%) රා.ඖ.සං	24.3	25.5		27.0
දළ ලාභ අනුපාතය (%) රා.බෙ.ග	6.8	7.3		7.1
දළ අතිරික්තයට විකුණුම් අනුපාතය (%)	10.1	11.0		10.9
යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ (%)	19.5	22.2		29.7
පොළී ආවරණය (වාර)	26.5	45.3		344.7
ස්කන්ධයට මුළු වත්කම් අනුපාතය (%)	1:2.5	1:1.8		1:1.5
යෙදවූ ප්‍රාග්ධනයට විකුණුම් (වාර)	4.23:1	4.53:1		5.12:1
ජංගම අනුපාතය (වාර)	1:1.5	1:1.8		1:2.29
ද්‍රවශීලතා අනුපාතය (වාර)	1:1.3	1:1.56		1:1.66
තොග පිරිවැටුම් අනුපාතය (වාර)	2.46	2.58		2.04
වෙනත් තොරතුරු				
සේවක සංඛ්‍යාව	931	909		889
සේවකයෙකුගේ ඉපයීම (රු)	1,847	1,716		2,101
සේවකයෙකුට විකුණුම් (රු)	41,778	35,824		36,283

අධ්‍යක්ෂ මණ්ඩලය හා ආයතනික තොරතුරු

අධ්‍යක්ෂ මණ්ඩලය

සරත් ලියනගේ මහතා - සභාපති

සරත් ලියනගේ මහතා වසර 33 ක පළපුරුද්ද ඇති නීතිවේදියෙකු හා දිවුරුම් කොමසාරිස්වරයෙකු වේ. ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා වූ සියළුම අධිකරණ වල පෙනී සිට ඇති ඔහු ජෙනරල් කොඩිබැකඩුව හා විජය විමලරත්න අනතුරට ලක්වූ කයිට්ස් හි නැවත පිපිරීමක් ඇති කර පරීක්ෂා කිරීමට පත්කරනු ලැබූ විශේෂ ජනාධිපති කොමිසම වෙනුවෙන් මුල සිට පෙනී සිට ඇති අතර ලන්ඩනයේ පොදුරාජ්‍ය මණ්ඩල ශාලාවේ රැස්වූ අග්‍රවිනිශ්චයකාරවරු දෙදෙනෙකුගෙන් හා නයිට්වරයෙකුගෙන් සමන්විත ජාත්‍යන්තර කොමිසමක මුල සිට පෙනී සිට ඇත.

විධායක අධ්‍යක්ෂ හා සභාපති ලෙස රජයේ ආයතන ගණනාවක පළපුරුද්ද ඇති ඔහු ප්‍රසිද්ධ සමාගම් සමූහයක නීති උපදේශක ලෙසත් සමාගම් අධ්‍යක්ෂවරයෙකු ලෙසත් කටයුතු කර ඇත.

දේශපාලන නොවන සංවිධානයක් වන ලංකාවේ දුප්පතුන් වෙනුවෙන් වූ PME අරමුදලේ සභාපතිවරයා ලෙස ශ්‍රී ලංකාවේ දුප්පත් ජනතාව වෙනුවෙන් කටයුතු කරයි. සරත් ලියනගේ මහතා 2015 ජනවාරි මස සිට ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති වරයා ලෙස කටයුතු කරයි.

ආචාර්ය එම්.එච්.එම් රූමි - කළමනාකාර අධ්‍යක්ෂ

ආචාර්ය එම්.එච්.එම් රූමි මහතා ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂයෙන් පරිගණක, පරිගණක පද්ධති හා පරිගණක ජාල පිළිබඳව යුක්‍රේනයේ තාක්ෂණික විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධිධාරියෙකු හා විද්‍යාපති උපාධිධාරියෙකි. ඔහු යුක්‍රේන ජාතික තාක්ෂණික විශ්වවිද්‍යාලයේ ආධුනික කථිකාචාර්ය වරයෙකු ලෙස කටයුතු කර තිබූ අතර දර්ගා නගරයේ අලිප් ජාත්‍යන්තර පාසැලේ ස්වේච්ඡා අධ්‍යක්ෂවරයෙක් ලෙසද දායකවී ඇත.

ආචාර්ය එම්.එච්.එම් රූමි මහතාට වසර දහතුනකට වඩා කළමනාකරණ අද්දැකීම් ඇති අතර දැනට සිලෝන් ටී ලැන්ඩ් ප්‍රයිවට් ලිමිටඩ්, රෝයල් පැකේජින් සොලුසන් ප්‍රයිවට් ලිමිටඩ්, ට්‍රෙන්ඩ් සෙරමික්ස් පුද්ගලික සමාගම, කොන්ට්‍රෝනික්ස් ලංකා පුද්ගලික සමාගම යන සමාගම්වල සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ වශයෙන්ද ස්කිල් එන්ටප්‍රයිස් ආයතනයේ කළමනාකාර හවුල්කරු වශයෙන්ද කටයුතු කරයි.

ආචාර්ය එම්.එච්.එම් රූමි මහතාට වෙළඳ කටයුතු පිළිබඳ මනා පළපුරුද්දක් ඇති අතර ඔහු ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා අපනයන සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකාවේ තේ ප්‍රවර්ධනය වෙනුවෙන් සංවිධානය කල ප්‍රදර්ශන පනහකට වැඩි ප්‍රමාණයකට සිලෝන් ටී ලැන්ඩ් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වෙනුවෙන් සහභාගි වී ඇත. ආචාර්ය එම්.එච්.එම් රූමි මහතා 2015 ජනවාරි මස සිට ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරයි.

වෛද්‍ය බී.පී.එන් රත්නසේන මහතා F.R.C.S England, MS (Surgery), and M.B.B.S (Ceylon)

වෛද්‍ය බී.පී.එන් රත්නසේන මහතා විශේෂඥ ශල්‍ය වෛද්‍ය වරයෙකි. ඔහු එංගලන්ත රාජකීය ශල්‍ය වෛද්‍ය විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකත්වය හිමි විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයෙක් වන අතර ශල්‍ය වෛද්‍යවරුන්ගේ සංගමයේ හිටපු සභාපතිවරයාද වේ. විශේෂඥ වෛද්‍ය සංගමයේ සභාපතිවරයා මෙන්ම ශල්‍යකර්ම අධ්‍යයන මණ්ඩලයේ හා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශාස්ත්‍රීය අධ්‍යයන හා විනය කමිටුවේ කමිටු සාමාජිකයෙක් ලෙස 2017 මාර්තු මස දක්වා කටයුතු කර ඇති අතර වර්තමානයේ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ කමිටු සාමාජිකයෙක් ලෙස ක්‍රියා කරයි.

වෛද්‍ය රත්නසේන මහතා විසින් සිදුකරන ලද විශිෂ්ඨ පර්යේෂණ කටයුතු වෙනුවෙන් 2014 ජනවාරි මස දී ජනාධිපති සම්මානයෙන් පිදුම් ලබන ලදී.

ආනන්ද කිත්සිරි සෙනවිරත්න මහතා

ආනන්ද කිත්සිරි සෙනවිරත්න මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු ශ්‍රේණියේ නිලධාරියෙකි. (SLAS) සෙනවිරත්න මහතා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් වරයා ලෙස 2018 ජනවාරි මස සිට කටයුතු කරයි. සෙනවිරත්න මහතා කැළණිය විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිධාරියෙකි. ඔහු වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යාපාර හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවත්, කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විශාරද උපාධියත් ලබාගෙන ඇත.

ඔහු 1995 දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට සම්බන්ධවූ අතර වසරක පුහුණු කාලය නිමවීමෙන් පසු මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වරයෙක් ලෙස 1996 දී පත්කරන ලදී. 2006 වසරේදී ඔහු මුදල් අමාත්‍යාංශයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වරයෙක් ලෙස පත්විය. 2015 දී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා ලෙස පත්වූ අතර 2018 වසරේ මුදල් අමාත්‍යාංශයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් වරයා ලෙස පත්වන තුරු ඔහු එහි කටයුතු කරන ලදී.

සෙනවිරත්න මහතා දැනට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේත්, ශ්‍රී ලංකා නැවි සංස්ථාවේ හා De La Rue Lanka Currency & Security Print (pvt)Ltd යන ආයතන වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් ලෙස කටයුතු කරයි.

වෛද්‍ය ඒ.කේ.එස්.වී. ද අල්විස් මහතා

වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා ඔහුගේ ප්‍රථම උපාධිය 1987 දී යුක්‍රේනයේ (පෙරදි සෝවියට් සංගමය) රාජ්‍ය වෛද්‍ය ආයතනයෙන් Lvov, ලබාගෙන ඇත. 1989 දී ශ්‍රී ලංකා රජයේ වෛද්‍ය සේවයට සම්බන්ධවූ වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ශ්‍රාස්ත්‍රපති උපාධිය 1996 දිත්, වෛද්‍ය පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය 2006 දිත්, කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් ලබාගෙන ඇත.

වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා රත්නපුර ප්‍රාදේශිය මහරෝහලේ රෝහල් අධ්‍යක්ෂවරයා ලෙසත්, පසුව ප්‍රාදේශිය අධ්‍යක්ෂවරයා ලෙස වයඹ පළාතේත් වසර අටකට වැඩි කාලයක් සේවය කර ඇත.

ඔහු 2009 වසරේදි ක්ෂය රෝගය හා ලයරෝග මර්ධන ජාතික වැඩසටහනේ අධ්‍යක්ෂවරයා ලෙස පත්වූ අතර 2012 වසරේ දී සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් - වෛද්‍ය සේවා, අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ ලෙස උසස් කරන ලදී. වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා 2018 ජූලි මස සිට සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් - වෛද්‍ය සේවා ලෙස කටයුතු කරයි.

වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා වෛද්‍ය සේවාවට දක්වන ලද දායකත්වය වෙනුවෙන් ජාතික වීලදායිතා සම්මානය කිහිපවරක්ද, සෞඛ්‍ය සඳහා මානව සම්පත් පිළිබඳ ආසියා-පැසිපික් ක්‍රියාකාරී සන්ධානය (AAAH) 2018 වසරේදීද ඔහුව ඇගයීමට ලක්කර ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
ආයතනික තොරතුරු

අධ්‍යක්ෂ මණ්ඩලය

සරත් ලියනගේ මහතා	සභාපති	
ආචාර්ය එම්.එච්.එම් රුමි	කළමනාකාර අධ්‍යක්ෂ	
මුක්තාර් මරික්කාර් මහතා	අධ්‍යක්ෂ	(2018.08.28 දක්වා)
වෛද්‍ය බී.සී.එන් රත්නසේන	අධ්‍යක්ෂ	
ආර්.පුෂ්පකුමාර ද සොයිසා මහතා	අධ්‍යක්ෂ	(2018.09.26 දක්වා)
ඒ.කේ. සෙනවිරත්න මහතා	අධ්‍යක්ෂ	
ආචාර්ය සරත් අමුණුගම මහතා	අධ්‍යක්ෂ	(2018.04.30 දක්වා)
වෛද්‍ය ඒ.කේ.එස්.බී. ද අල්විස්	අධ්‍යක්ෂ	(2018.05.01 සිට)

විගණන කමිටුව

ඒ.කේ. සෙනවිරත්න මහතා	සභාපති	
මුක්තාර් මරික්කාර් මහතා	අධ්‍යක්ෂ	(2018.08.28 දක්වා)
වෛද්‍ය බී.සී.එන් රත්නසේන	අධ්‍යක්ෂ	

විගණකවරු
විගණකාධිපතිතුමා, ජාතික විගණන කාර්යාලය, අංක. 306/72,
පොල්දුව පාර, බත්තරමුල්ල.

බැංකු කරුවෝ

ලංකා බැංකුව
ආයතනික ශාඛාව, ලංකා බැංකු මාවත, කොළඹ 01.

මහජන බැංකුව
ජාත්‍යන්තර අංශය, තැ.පෙ.437 ඒ.එන්.සී.එල්. ගොඩනැගිල්ල,
ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.

ස්ටෑන්ඩර්ඩ් චාටඩ් බැංකුව
තැ.පෙ. 112, 37. යෝර්ක් වීදිය, කොළඹ 01.

කොමර්ෂල් බැංකුව
නගර ශාඛාව, 98. යෝර්ක් වීදිය, කොළඹ 01.

ලියාපදිංචි කාර්යාලය
නො. 75 ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.

සංස්ථාපනය කල දිනය
1971 සැප්තැම්බර් 22.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
කළමනාකරණ මණ්ඩලය



කේ. එම්. ඩී. ආර්. දසනායක මහතා - සාමාන්‍යාධිකාරී

දිනූෂ දසනායක මහතා කළමනාකාර අභ්‍යාසලාභියෙකු ලෙස 1999 දෙසැම්බර් 1 වන දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සම්බන්ධ වූ අතර 2009 ජූනි මස 1වන දින සිට මේ වන තෙක් සාමාන්‍යාධිකාරිධූරය උසුලයි. දිනූෂ දසනායක මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වාණිජවේදී ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ ගෞරව උපාධිධාරියෙකි. ජපානයේ නගෝයා විශ්ව විද්‍යාලයේ ජාත්‍යාන්තර වෙළඳ නීතිය විශේෂිතවූ ජාත්‍යාන්තර සහයෝගිතාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙකු වන ඔහු ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකි. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීතිය පිළිබඳ උසස් අධ්‍යාපන ආයතනයේ ජාත්‍යාන්තර වෙළඳ නීතිය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාධාරියෙකි. ඔහු බලයලත් වාණිජ සමථකරුවෙකු වශයෙන්ද සුදුසුකම් ලබා ඇත.



ඩබ්ලිව්. ඒ. එස්. ඩී. කේ. පෙරේරා මහත්මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි

සුරංගනි පෙරේරා මහත්මිය 1984 සිට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සේවය කරයි. 2004 නොවැම්බර් මස 01 වන දින සිට 2006 ජූනි මස 01 වන දින දක්වා අලෙවි අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස කටයුතු කල අතර 2006 ජූනි මස 01 වන දින සිට 2014 අගෝස්තු 01 වන දින දක්වා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තාක්ෂණ, රසායනාගාර හා නිෂ්පාදන ලෙස කටයුතු කරන ලදි 2014 අගෝස්තු 01 වන දින සිට නැවතත් අලෙවි අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස කටයුතු කරයි. සුරංගනි පෙරේරා මහත්මිය භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිධාරිනියක් වන අතර කළමනාකරණ ඩිප්ලෝමාව, ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමාව හා ව්‍යාපාර පරිපාලනවේදී ශාස්ත්‍රපති උපාධිධාරිනියකි. ඇය රජයේ ලියාපදිංචි ඖෂධවේදිනියකි.



පී.කේ.එස්.එස්. කුලසූරිය මහත්මිය
වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී - ප්‍රසම්පාදන හා ආනයන

සුමුදු කුලසූරිය මහත්මිය කළමනාකාර අභ්‍යාසලාභියෙකු ලෙස 1997 දී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සම්බන්ධ වූ අතර 2015 ජූලි මස සිට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ප්‍රසම්පාදන හා ආනයන ලෙස කටයුතු කරයි. ඇය කොළඹ විශ්ව විද්‍යාලයේ පිව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිධාරිනියක් වන අතර ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරිනියකි. (MBA) සුමුදු කුලසූරිය මහත්මිය සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකාරිත්ව ආයතනයේ මිලදී ගැනීම් හා ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරිනියක් වන අතර සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකාරිත්ව ආයතනයේ සාමාජිකාවකි. එයට අමතරව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලොමාධාරිනියක් වේ. (DIPPCA)



ප්‍රියන්ති දසනායක මහත්ඩිය -
වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී - ප්‍රසම්පාදන හා ආනයන (ශල්‍ය උපකරණ)

ප්‍රියන්ති දසනායක මහත්මිය කළමනාකාර අභ්‍යාසලාභියෙකු ලෙස 1987 සිට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සම්බන්ධ වූ අතර 2015 ජූලි මස සිට වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ප්‍රසම්පාදන හා ආනයන ලෙස කටයුතු කරයි. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිධාරිනියක් වන ඇය කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරිනියකි. ප්‍රියන්ති දසනායක මහත්මිය සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකාරිත්ව ආයතනයේ මිලදී ගැනීම් හා ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරිනියක් වන අතර සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකාරිත්ව ආයතනයේ සාමාජිකාවකි.



හිරන්‍යා සම්මන්දප්පෙරුම මහත්මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී- මූල්‍ය

හිරන්‍යා සම්මන්දප්පෙරුම මහත්මිය කළමනාකරණ ගණකාධිකාරිවරිය ලෙස 2007 ජූලි මස 01 වන දින රාජ්‍ය ඖෂධ සංස්ථාවට සම්බන්ධ විය. මූල්‍ය කළමනාකරණය, කළමනාකරණ ගණකාධිකරණය හා විගණනය යන අංශ පිළිබඳ වසර 20 කට වඩා පළපුරුද්දක් ඇති ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) වරලත් ගණකාධිකාරිවරියක් ද, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ (CMA) ගණකාධිකාරිවරියක් ද වේ. එක්සත් රාජධානියේ වරලත් සහතිකපත්‍ර ගණකාධිකාරී ආයතනයේ (ACCA-UK) සාමාජිකත්වයද අපේක්ෂාවෙන් සිටී.

හිරන්‍යා සම්මන්දප්පෙරුම මහත්මිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය කළමනාකරණයට විශේෂිත ව්‍යාපාර පරිපාලනය, පිළිබඳ ගෞරව උපාධියක් 2001 වසරේදී ලබාගෙන ඇති අතර කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරිණියකි.



කේ.පී.සී. ශාන්තිමාලා මහත්ඩිය
වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී- තාක්ෂණ, රසායනාගාර හා නිෂ්පාදන

කේ.පී.සී. ශාන්තිමාලා මහත්මිය කළමනාකාර අභ්‍යාසලාභියෙකු ලෙස 1986 මැයි මස 15 වන දින රාජ්‍ය ඖෂධ සංස්ථාවට සම්බන්ධ වූ අතර 2018 ජූලි මස 3 වන දින සිට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී - තාක්ෂණ, රසායනාගාර හා නිෂ්පාදන තනතුරෙහි කටයුතු කරයි.

ඇය කැළණිය විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිධාරිනියක් වන අතර විවෘත විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිධාරිනියකි. ඇය රජයේ ලියාපදිවි ඖෂධවේදිනියකි.



නිමිමිකා තුෂාරි මහත්ඩිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී- (මානව සම්පත් සහ පරිපාලන)

එම්. ආර්. නිමිමිකා තුෂාරි මහත්මිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී - (මානව සම්පත් සහ පරිපාලන) ලෙස 2018 අගෝස්තු මස 1 වන දින රාජ්‍ය ඖෂධ සංස්ථාවට සම්බන්ධ විය.

ඇය ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ (මානව සම්පත්) විද්‍යාවේදී විශේෂ උපාධිධාරිණියක් වන අතර කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් ප්‍රවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇත. මානව සම්පත් කළමනාකරණ හා පරිපාලන ක්ෂේත්‍රය පිළිබඳ වසර 20ක පමණ පළපුරුද්දක් ඇය සතුවේ.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

කළමනාකරණ මණ්ඩලය - ජේෂ්ඨ කළමනාකරණය

යූ. ලොකුසූරිය මහතා	අභ්‍යන්තර විගණක	
පී.ඩී. ගුණසේකර මහත්මිය	ගණකාධිකාරිණී - ගෙවීම්	(2018.07.09 දින දක්වා)
පී.කේ. විජේරත්න මහත්මිය	තත්ත්ව ආරක්ෂණ රසායනාගාර කළමනාකාරිණී	
ඩබ්ලිව්.ඒ.එස්. වික්‍රමාරච්චි මහතා	කළමනාකරු - පර්යේෂණ හා නව ව්‍යාපෘති	
ඩී.පී. අපිත් ලියනගේ මහතා	කළමනාකරු - තොරතුරු පද්ධති	
එම්.ඒ.වි.අයි. කුමාරසිරි මහතා	ක්ෂේත්‍ර කළමනාකරු - බෙදාහැරීම් පද්ධති සමාලෝචන	
පී.කේ.ආර්. ප්‍රනාන්දු මහතා	වාප්පු කළමනාකරු	
සී.එස්. විතානගේ මෙනවිය	අලෙවි කළමනාකාරිණී	
එච්.එච්. පියදිගම මහත්මිය	ගණකාධිකාරිණී - තොග හා මිලකිරීම්	
ඩී.එන්. දේවසුරේන්ද්‍ර මහත්මිය	ගණකාධිකාරිණී - ආදායම්	
පී.ඒ.යූ. විජේවර්ධන මහත්මිය	නීති නිළධාරිණී සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	
පී.එම්.බී.ආර්. සෝමතිලක මහතා	නිෂ්පාදන කළමනාකරු	
ඒ.එච්. අල්විස් මහත්මිය	කළමනාකාරිණී - පසු බෙදාහැරීම් කටයුතු	
එම්.කේ.ඒ.පී ගුණතිලක මහත්මිය	කළමනාකාරිණී - ප්‍රවර්ධන හා ප්‍රචාරක	
ඩී.පී.ඩී.ජේ. පුෂ්පකුමාර මහතා	කළමනාකරු - ගබඩා හා තොග පාලන	
ඒ.පී. හපන්ගම මහතා	ගණකාධිකාරි - මූල්‍ය ගිණුම්කරණ	
එච්.ඩී.එන්.ආර්.ගුණසේකර මහතා	කළමනාකරු - ඔසුසල කොළඹ 04	(2018.01.16 දින දක්වා)
එල්.ඩබ්ලිව්. දමයන්ති මහත්මිය	ගණකාධිකාරිණී - වැටුප් හා වේතන	
ඩී.කේ.ඒ.පී දසනායක මහතා	කළමනාකරු - පරිපාලන	
එම්.ඒ.එස් කරුණාරත්න මහත්මිය	ගණකාධිකාරිණී - රාජ්‍ය ඔසුසල	
කේ.ඩී.එෆ්.එන්. පෙරේරා මහතා	විකුණුම් කළමනාකරු	
ඩබ්ලිව්. ජයන්ත මහතා	කළමනාකරු - ම.මි.ගැ. ඒකකය	(2018.09.18 දින දක්වා)
	කළමනාකරු - ඔසුසල කොළඹ 7	(2018.10.18 දින සිට)
යූ.වී. පියසේන මහතා	කළමනාකරු - ආනයන	(2018.04.27 දින දක්වා)
බී.ඒ.කේ. මධුසංක	කළමනාකරු - මානව සම්පත්	
ඩී.ඩී.එස්. තරංගමාලා මහත්මිය	කළමනාකරු - ප්‍රසම්පාදන	(2018.02.15 දින සිට)
ආර්.පී. විතානගේ	කළමනාකරු - ප්‍රසම්පාදන	(2018.02.15 දින සිට)
කේ.පී.එස්. පෙරේරා	ගණකාධිකාරිණී - ගෙවීම්	(2018.08.01 දින සිට)
එම්.ඒ.ඩී.එස්.එස්. මුණසිංහ	කළමනාකරු - ආනයන	(2018.09.13 දින සිට)
සී.යූ.එම්.එම්. බණ්ඩාර	කළමනාකරු - ගබඩා හා තොග පාලන	(2018.09.25 දින සිට)

සභාපතිතුමාගේ ප්‍රකාශනය



ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවේ 2018 වසරට අදාල වාර්ෂික වාර්තාව ඉතා සතුටින් ඔබ වෙත ඉදිරිපත් කරමි.

2018 වසරේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස ක්‍රියා කරමින් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවේ ක්‍රියාකාරකම් වර්ධනය කරගැනීම සඳහා වූ මාගේ කැපවීම 2019 වසරේ ජනවාරි මස සංස්ථාවේ සභාපති තනතුර භාර ගැනීමට මාර්ගය විවර කරවන ලදි.

2015 වසරේ සිට ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවේ ලාභ දායකත්වය රුපියල් බිලියනය ඉක්මවා පවත්වා ගැනීමට අපට හැකි විය. අපගේ සේවක මණ්ඩලයේ ප්‍රශංසනිය කාර්ය සාධනය ඇගයීම සඳහා ගරු අමාත්‍ය රාජිත සේනාරත්න මහතා සහතික වූ පරිදි 2017 ජූනි මසට යෙදී තිබූ රාජ්‍ය ඖෂධ සංස්ථාවේ සාමූහික ගිවිසුම අලුත් කිරීමේදී සංස්ථාවේ සියළුම සේවකයන්ට 50% කට වඩා ඉහල පඩි වැඩිවීමක් ලබාදෙන ලදි. 2018 වසර මෙම වේතන වැඩිවීමේ පිරිවැය සම්පූර්ණයෙන්ම බලපෑ වසර විය. එසේ වූවත් 2018 වසරේ දී සම්පූර්ණ පිරිවැය ද දරාගනිමින් රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව වාර්තාගත රුපියල් බිලියන 1.7 ක ලාභයක් අත්කර ගැනීමට හැකිවිය.

රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව ඔසුසල ශාඛා ජාලය, බෙදාහරින්නන් ඇතුලත් රා.ඖ.ස විකිණුම් හා රජයේ බෙහෙත් ගබඩාවට කරන ලද සැපයුම් යන අංශ දෙකෙහිම 19% ක වර්ධනයක් වාර්තා කර ගන්නා ලදි. මගේ මෙහෙයවීම හා අධීක්ෂණය යටතේ මෙම වසර තුල පේරාදෙණිය, මොණරාගල හා අක්කරයිපත්තුවේ නව රාජ්‍ය ඔසුසල් පිහිටුවීමට හැකිවිය.

වෙළඳ පොළේ විශාලතම ඖෂධ ආනයනය කරන්නා හා සාධාරණ මිලක් වෙළඳපළ තුල පවත්වාගෙන යන්නා වශයෙනුත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව ඖෂධ ප්‍රභේද 400 ක් දක්වා වන ඖෂධ 48 ක උපරිම සිල්ලර මිල පාලනය ක්‍රියාත්මක කිරීමට දායක වන ලදි. අක්ෂිකාව හා පිළිකා ඖෂධ ඇතුළු ඖෂධ වර්ග ගණනාවක උපරිම ටෙන්ඩර් වටිනාකම් තීරණය කරන ලදි. "නව ඖෂධ ප්‍රතිපත්තිය" ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරන අතර ඖෂධ මිල පාලනය හා ඖෂධ නාමයෙන් යුතු ඖෂධ ප්‍රවර්ධනය කිරීම මඟින් ඉදිරියටද කටයුතු කිරීමට කැපවෙයි.

දේශීයව ඖෂධ නිෂ්පාදනය කිරීමේ "නව ඖෂධ ප්‍රතිපත්තිය" ක්‍රියාත්මක කිරීමට මුල පිරීමත් සමඟ ඉදිරි වර්ෂ වලදී රාජ්‍ය ඖෂධ සංස්ථාවේ කාර්යභාරය කැපිපෙනෙන හා අභියෝගාත්මක කාර්යභාරයක් බවට පත්වෙනු ඇත.

මා හට ලබාදුන් සහයෝගය හා මාර්ගෝපදේශකත්වය වෙනුවෙන් ගරු සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාටත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තුමාටත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන්ට, විගණකාධිපති තුමා හා එම නිලධාරීන්ටත්, මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ටත්, සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂකතුමා හා අධ්‍යක්ෂ මණ්ඩලයටත්, කළමකාකරණයට හා සේවක මණ්ඩලයටත් මාගේ ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාව කර ගනිමි.

මගේ එකම පැතුම වන්නේ ඉදිරියේ දී මවුබිම වෙනුවෙන් වඩාත් අඟනා සේවාවක් සැපයීමට ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවට හැකි වේවා යන්නයි.

ආචාර්ය. එම්.එච්.එම්.රුමි
සභාපති.

කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ ප්‍රකාශය



රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවේ 2018 වසරේ කාර්යසාධනය පිළිබඳ මෙම වාර්තාව, කළමනාකරණ අධ්‍යක්ෂවරයා ලෙස මම සතුටින් ඉදිරිපත් කරමි. මෙම වසරේ ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව ගුණාත්මක හා තත්ත්ව සහතික කල ඖෂධ සහ සනීපාරක්ෂක උපකරණ ජාතියට සපයන 47 වන වසර සම්පූර්ණ කරයි.

රජයේ රෝහල් වලට ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ අඛන්ඩව බෙදාහැරීම සඳහා රජයේ බෙහෙත් ගබඩාවට තත්ත්ව ආරක්ෂිත ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ සපයන එකම ආනයනකරු වන්නේ රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවයි.

මූල්‍ය කාර්යසාධනය

මෙම වසරේදි රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව මෙතෙක් වාර්තා කරගන්නා ලද ඉහලම පිරිවැටුමවූ රු.මි. 38,895 වාර්තා කරගන්නා ලදි. මෙය පෙර වර්ෂයේ වාර්තා වූ රු.මි. 32,564 ක පිරිවැටුම සමඟ සැසඳිමේදි 19.4% ක වර්ධනයකි. මෙම වසරේදි රු.මි. 31.437 ක ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ රජයේ බෙහෙත් ගබඩාවට සපයන ලදි. එය 2017 වසරේ සපයන ලද වටිනාකම වූ රු.මි. 25.970 හා සසඳනවිට 21 % වර්ධනයක් වේ. නව රාජ්‍ය ඔසුසැල් පිහිටුවීම මඟින් සංස්ථාවේ බෙදාහැරීමේ ජාලය පුළුල් කිරීමත්, රජයේ බෙහෙත් ගබඩාවට සැපයුම් වැඩිකිරීමත්, මෙම වසරේ විකුණුම් වර්ධනය වීමට ප්‍රධානතම කරුණ විය.

මුළු පිරිවැටුම (රු. මිලියන)



2018 වසරේදි වෛද්‍ය සැපයුම් අංශයට කරන ලද සැපයුම් හැර පිරිවැටුම රු.මි. 7458 ක් ලෙස වාර්තා විය. එය 2017 වසරේ වාර්තා වූ රු.මි.6,593 හා සසඳන කල 13.1% ක වර්ධනයක් විය.

2018 වසරේ බදු පෙර ලාභය රු.මි. 1.720 ක් විය. පෙර වසරේ වාර්තා වූ රු.මි. 1.560 හා සසඳන කල මෙය 10.2% ක වර්ධනයකි. විකුණුම් වර්ධනයත්, වියදම් පාලනය කරගැනිමත් මෙම වර්ධනයට බලපෑ මූලික හේතූන්වේ.

ඖෂධ වෙළඳාම හා ප්‍රවර්ධනය

සලකා බලන වර්ෂයේදි අක්කරෙයිපත්තුව, මොණරාගල, හා පේරාදෙණිය යන නගරවල නව රාජ්‍ය ඔසුසල තුනක් පිහිටුවීම මඟින් රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව තම වෙළඳපළ තත්ත්වය තවදුරටත් තහවුරු කර ගන්නා ලදි. වර්ෂය අවසානය වන විට රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවේ බෙදාහැරීමේ ජාලය සතුව, රාජ්‍ය ඔසුසල 39ක්, වරලත් ඔසුසල 98 ක්, බෙදාහරින්නන් 50 ක් හා බලයලත් වෙළඳුන් 9 ක් දිවයින පුරා ක්‍රියාත්මකව පැවතුනි.

රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව වෛද්‍ය හා වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගිවී වෙළඳ හා ප්‍රවර්ධන කුටි මඟින් ඖෂධ නාමයෙන් යුතු ඖෂධ නිවැරදි භාවිතය හා එහි ප්‍රයෝජන පිළිබඳව "නිවැරදි ඖෂධ භාවිතය" යන තේමාවෙන් මහජනතාව දැනුවත් කරන ලදි. වෛද්‍ය වෘත්තිකයන්ගේ වෛද්‍ය ක්ෂේත්‍රය ආශ්‍රිත විශේෂ අවස්ථා ගණනාවක ප්‍රවර්ධන කුටි පවත්වා ගෙනයාමට අමතරව මුළු දිවයිනම ආවරණය වන පරිදි වෛද්‍ය ක්ෂේත්‍රය ආශ්‍රිත අවස්ථා ගණනාවකට රාජ්‍ය ඖෂධ සංස්ථාව අනුග්‍රහය දක්වන ලදි. ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවේ නිර්මාතෘ මෙන්ම ආරම්භක සභාපතිවරයා වූ මහාචාර්ය සේනක බිබිලේ මහතා සිහිකිරීමක් වශයෙන් අප විසින්, මහාචාර්ය සේනක බිබිලේ ගුණානුස්මරණ ශිෂ්‍යත්ව, වැඩ සටහන තවදුරටත් පවත්වාගෙන යමින් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයන්හි වෛද්‍ය පීඨ හයක ඖෂධ විද්‍යාව **(Pharmacology)** පිළිබඳව ඉහල දැනුමක් ඇති සිසුන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදි.

තාක්ෂණ හා රසායනාගාරය

රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවේ රසායනාගාරයේ ගුණාත්මක භාවය වර්ධනය කරගනිමින් ඉහල මට්ටමකින් පවත්වා ගෙනයාමට තවදුරටත් කැපවන අතර සංස්ථාවේ ඖෂධ සෑම විටම ගුණාත්මක භාවයෙන් පවත්වාගෙනයාම සඳහා "ටෙන්ඩර් නියැදි පරීක්ෂාව", "නැවිගත කිරීමට පෙර ලබාගත් නියැදි පරීක්ෂාව", "බෙදාහැරීමට පෙර නියැදි පරීක්ෂාව" සහ මහජනතාව වෙත බෙදාහැරීමෙන් පසු "වෙළඳපොළ පැමිණිලි මත නියැදි පරීක්ෂාව" යන අදියර හතරක් යටතේ පරීක්ෂාවට ලක්කරයි.

මානව සම්පත් සංවර්ධනය

සලකා බලන වර්ෂය අවසානයේ දී අපගේ ශ්‍රම බලකාය පුහුණුවන්නන් ද ඇතලුව 931 ක් විය. අපගේ දක්ෂ, පළපුරුදු හා කැපවීමෙන් යුතු වෘත්තීමය ශ්‍රම බලකාය සංස්ථාව ලබා ඇති සාර්ථකත්වයට හේතුවූ ප්‍රධානම කරුණ වශයෙන් දැක්විය හැක. ආයතනය තුලදීම ඔවුන්ගේ වෘත්තිය අභිවෘද්ධිය ඇති කරලීම හා ඔවුන්ගේ දක්ෂතා වැඩිදියුණු කරලීමේ අරමුණෙන් දේශීය හා විදේශ පුහුණු වැඩසටහන් ගණනාවකට සහභාගි කරවන ලදී.

පුහුණු ආකාරය	පුහුණු වැඩසටහන් ගණන	සේවක සංඛ්‍යාව
දේශීය පුහුණු වැඩසටහන්	24	69
සමූහ පුහුණු වැඩසටහන්	7	717
විදේශ පුහුණු වැඩසටහන්	12	34
එකතුව	43	820

මෙයට අමතරව 2017 වසරට පෙර සිට සංස්ථාවේ පැවති සියලු සේවක සුභසාධන ප්‍රතිලාභ 2018 වසරේ ද ක්‍රියාත්මක කරන ලදී.

සංයුක්ත සමාජ සුභසාධන වගකීම

අපගේ සමාජ සුභසාධන වගකීමෙහි කොටසක් ලෙස වසර 5 ට අඩු දරුවන්, ගැබිනි මව්වරුන්, වයස 55 ට වඩා වැඩි වැඩිහිටියන් මිලදිගන්නා බෙහෙත් වෙනුවෙන් 5% වට්ටමක් ලබාදීම මෙම වසරේත් ක්‍රියාත්මක කරන ලදී. රටේ විවිධ ප්‍රදේශ වල සංවිධානය කරන ලද වෛද්‍ය කඳවුරු ගණනාවක් සඳහා අප විසින් අනුග්‍රහය දක්වන ලදී.

ස්තූතිය පුද කිරීම

මෙම වර්ධනය සහ ලාභදායකත්වය ලබා ගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කල අපගේ ගරු. සභාපතිතුමාටත්, කළමනාකරණ මණ්ඩලයටත්, සියළුම මට්ටම් වල සේවකයන්ටත් මාගේ අවංක ස්තූතිය පුදකරමි. වසරේ දී අපවෙත දැක්වූ සහයෝගය හා මගපෙන්වීම වෙනුවෙන් ගරු සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය ඇමතිතුමාට මගේ හෘදයාංගම ස්තූතිය පිරිනමමි. ඔබේ පෙර නොවූ විරූ වගකීම හා කැපවීම තුළින් ඉදිරියේදී රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව ඖෂධ වෙළඳපළේ විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය වන බව මගේ විශ්වාසයයි.



වෛද්‍ය. එම්.වයි. කේ. විල්ෆ්‍රඩ්
කළමනාකාර අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ සමඟ ඉදිරිපත් කරමි.

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාවසාය මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.5.1 වගන්තිය ට අනුව රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු මස 07 වන දින විගණකාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදි.

ආරම්භය

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 වගන්තිය යටතේ අංක 14976/8 දරණ ගැසට් නිවේදනය මඟින් 1971 සැප්තැම්බර් 22 දින ශ්‍රී ලංකා රජයේ අනුමැතිය හා එවකට කාර්මික හා විද්‍යා කටයුතු අමාත්‍යතුමාගේ නියෝගය මත රුපියල් මිලියනයක මූලික ප්‍රාග්ධනයකින් යුක්තව රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව පිහිටුවන ලදි.

ගණකාධිකරණ ප්‍රතිපත්ති

මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පිටු අංක 21 සිට 29 දක්වා ඉදිරිපත් කර ඇත.

ප්‍රතිවිල

ප්‍රවර්ථන වසරෙහි මූල්‍ය ප්‍රතිවිල සහ ස්කන්ධය වෙනස් වීම පිළිබඳ දත්ත ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය මඟින් අනාවරණය කර ඇත.

ව්‍යාපාර සමාලෝචනය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය ශේෂ පත්‍රයෙහි දක්වා ඇති අතර ඒ පිළිබඳ ඇගයීමක් කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාවෙහි ඇතුලත් කර ඇත.

දේපළ, පිරියත හා උපකරණ

මූල්‍ය ප්‍රකාශනයෙහි ප්‍රවර්ථන වසරට අදාලව දේපළ, පිරියත හා උපකරණ වල සිදුවූ වෙනස්කම් සටහන් අංක 16 මඟින් පැහැදිලි කර ඇත. මෙම සටහනෙහි පෙන්වන වටිනාකම් ඒවායේ වර්තමාන වෙළඳපොල අගය හා ප්‍රමාණාත්මක වෙනස්කම් නොපවතී.

ප්‍රධාන ක්‍රියාකාරකම්

රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- විවෘත වෙළඳපොල වෙත ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය, මිලදී ගැනීම, විකිණීම සහ බෙදාහැරීම.
- සෞඛ්‍ය සේවා දෙපාර්තවේන්තුව වෙත ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය කර සැපයීම.
- ජීවනී, ග්ලූකෝස් සහ බෙන්සිල් බෙන්සොවේට් ක්‍රිමි නිෂ්පාදනය කිරීම සහ විකිණීම.
- රසායනාගාර පහසුකම් සහ වෛද්‍ය පරීක්ෂණ පහසුකම් සැපයීම.

පසුගිය මූල්‍ය වර්ෂය තුල සංස්ථාවේ ක්‍රියාකාරකම් වල මූලික වෙනස්වීමක් පෙන්නුම් නොකරයි.

සංචිත

ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය තුල සංස්ථාවේ මූල්‍ය සංචිත වල වටිනාකම හා එහි සංයුතිය දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

2018 දෙසැම්බර් 31 වන දිනට පත්ව සිටි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

සරත් ලියනගේ මහතා	සභාපති	
ආචාර්ය එම්.එච්.එම් රුමි	කළමනාකාර අධ්‍යක්ෂ	
මුක්තාර් මරික්කාර් මහතා	අධ්‍යක්ෂ	(2018.08.28 දක්වා)
වෛද්‍ය බී.ජී.එන් රත්නසේන	අධ්‍යක්ෂ	
ආර්.පුෂ්පකුමාර ද සොයිසා මහතා	අධ්‍යක්ෂ	(2018.09.26 දක්වා)
වෛද්‍ය සරත් අමුණුගම මහතා	අධ්‍යක්ෂ	(2018.04.30 දක්වා)
ඒ.කේ. සෙනවිරත්න මහතා	අධ්‍යක්ෂ	
වෛද්‍ය ඒ.කේ.එස්.බී ද අල්විස්	අධ්‍යක්ෂ	(2018.01.05 සිට)

විගණන කමිටුව

රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට **(Public Enterprises Guidline)** අනුකූලව සංස්ථාවේ විගණන කමිටුව පිහිටුවා ඇත.

සාංගමික යහපාලනය/ අභ්‍යන්තර පාලනය
ශක්තිමත් සාංගමික යහපාලන මූලධර්ම ක්‍රියාත්මක කිරීම සඳහා සංස්ථාව මඟින් විධික්‍රම හා ක්‍රියාපටිපාටින් ක්‍රියාත්මක කර ඇත. පිටු අංක .. හි විගණන කමිටු වාර්තාව දක්වා ඇත.

සේවා නියුක්තිය
සේවකයන්ගේ නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා යෝග්‍ය වන මානව සම්පත් කළමනාකරණ ක්‍රියාමාර්ග හා ප්‍රතිපත්ති සංස්ථාව මඟින් ක්‍රියාත්මක කරයි.

ව්‍යවස්ථාපිත ගෙවීම්
රජයට සහ සේවකයන් හට ගෙවීමට නියමිත සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත පරිදි ගෙවා නිමකර ඇත.

පාරිසරික ආරක්ෂාව
පරිසරයට අහිතකර කිසිදු ක්‍රියාකාරකමකට සංස්ථාව මැදිහත්වී නොමැත.

රජයට දායකත්වය
ලාභ ලබන රාජ්‍ය සංස්ථාවක් ලෙස මෙම වසරේදී රුපියල් මිලියන 638.7 ක් ආදායම් බදු ලෙස රාජ්‍ය භාණ්ඩාගාරයට ගෙවා ඇත.

සංයුක්ත සමාජමය වගකීම
සමාජමය වගකීම් ලෙස සලකා සංස්ථාව විසින් රු 2,213,964/- ක ප්‍රදානයන් ප්‍රවර්ථන වර්ෂය තුලදී සිදුකර ඇත.

ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්
ශේෂ පත්‍ර දිනට පසු ගිණුම් මඟින් ගැලපීමට හෝ හෙළිදරව් කිරීම සඳහා කිසිදු සිදුවීමක් වාර්තාවී නොමැත.

විගණකවරු
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන රජයේ විගණකාධිපතිතුමා විසින් විගණනය කරන ලදි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග මත

.....
අනුරාධා විජයවර්ධන
නීති නිළධාරිණී/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

විගණන කමිටුවේ වාර්තාව

විගණන කමිටුවේ සංයුතිය

විගණන කමිටුවට අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකු ඇතුලත්වන අතර කමිටුවේ සභාපතිවරයා ලෙස මහා භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන අධ්‍යක්ෂවරයා කටයුතු කරයි. 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ ගිණුම් වර්ෂය තුල පහත සාමාජිකයන් විගණන කමිටුවට සහභාගිවිය.

ඒ.කේ. සෙනවිරත්න මහතා	-	විගණන කමිටුවේ සභාපති
වෛද්‍ය බී.පී.එන්. රත්නසේන මහතා	-	සාමාජික
මුක්තාර් මරික්කාර් මහතා	-	සාමාජික

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරිතුමා හා ඖෂධ නිතිගත සංස්ථාවේ රජයේ විගණන අංශයේ විගණන අධිකාරිතුමිය නිරීක්ෂකයන් ලෙස කමිටු රැස්වීම් වලට සහභාගි විය. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්තුමිය හා අභ්‍යන්තර විගණක, විගණන කමිටු ලේකම් හා කැඳවුම්කරු ලෙස පිළිවලින් කටයුතු කරන ලදි.

විගණන කමිටුවේ කාර්යභාරය

විගණන කමිටුවේ ප්‍රධාන කාර්යය වනුයේ සංස්ථාවේ පවත්නා අභ්‍යන්තර පාලන පිළිවෙත් අධීක්ෂණය කිරීම හා සමාලෝචනය කිරීමත්, සංස්ථාවේ විගණන කටයුතු සහ මූල්‍ය කටයුතු පිළිබඳව සමාලෝචනයන් හා නිර්දේශයන් ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම නිසියාකාරව ඉටු කිරීම සඳහා ඔවුනට සහාය වීමත් වේ. සමාලෝචිත වර්ෂය තුලදි කමිටුව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් වල නියැලෙන ලදි.

01. අභ්‍යන්තර විගණන සැලසුම් ඇගයීම, සමාලෝචනය හා අවශ්‍ය අවස්ථාවන්හි සංශෝධනය කිරීමට නිර්දේශ කිරීම.
02. 2018 වසරට අදාල අභ්‍යන්තර විගණන සැලසුම් සමාලෝචනය කිරීම හා අනුමත කිරීම.
03. අභ්‍යන්තර විගණනය මඟින් පෙන්වා දී ඇති කරුනු හා නිර්දේශ, සඳහා කළමනාකරනයේ ප්‍රතිචාරයන් විමර්ෂණය කිරීම හා අභ්‍යන්තර විගණන වාර්තාවන් සමාලෝචනය කිරීම.
04. 1971 අංක 38 දරණ මූල්‍ය පනතේ 13(7)(ඒ) සහ 14(2)(සි) වගන්ති ප්‍රකාරව විගණකාධිපති විසින් නිකුත් කර ඇති වාර්තාවන්හි දක්වා ඇති කරුණු සමාලෝචනය කිරීම.
05. රාජ්‍ය ව්‍යාවසාය කමිටුවේ (COPE) නිර්දේශ ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම.

අභ්‍යන්තර විගණන අංශය

විගණන කමිටුවේ මඟපෙන්වීම යටතේ, සමාලෝචිත වර්ෂයේ අනුමත විගණන සැලැස්ම අභ්‍යන්තර විගණන අංශය මඟින් ක්‍රියාත්මත කරන ලදි. තවද අභ්‍යන්තර විගණන අංශයේ පද්ධති හා මූල්‍ය විගණන ක්‍රියා මාර්ග තුලින් අකාර්යක්ෂම පිළිවෙත් බැහැර කිරීමත්, අභ්‍යන්තර පාලනය වැඩිදියුණු කිරීමත්, සිදුවිය හැකි වැරදි, වංචා හා පාඩු අවම කර ගැනීමටත් කටයුතු කරන ලදි.

රැස්වීම්

2018 වර්ෂය තුල විගණන කමිටු රැස්වීම් තුනක් පවත්වන ලදි. එහිදි හඳුනාගන්නා ලද අඩුලුහුඩුකම් හා නිර්දේශ කළමනාකාරිත්වයට ඉදිරිපත් කරන ලදි. එම අඩුලුහුඩුකම් හා නිර්දේශ සැලකිල්ලට ගනිමින් ඒවා නිවැරදි කර ගැනීමට කටයුතු කොට ඇත.

.....

ඒ.කේ. සෙනවිරත්න
විගණන කමිටුවේ සභාපති

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව
2018 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන	2018 රු.	2017 රු.
වත්කම්			
දේපල පිරියත හා උපකරණ	17	2,102,558,703	2,062,760,822
දිගුකාලීන බදු ඉඩම් - රත්මලාන		9,720,000	9,880,000
නොනිමි වැඩ - ප්‍රාග්ධනය		95,588,879	89,595,739
අස්පෘශ්‍ය වත්කම්	18	-	1,804,647
වෙනත් ජංගම නොවන වත්කම්	19	14,676,643	15,294,117
මුළු ජංගම නොවන වත්කම්		**2,222,544,225**	**2,179,335,325**
ජංගම වත්කම්			
තොගය - රා.ඖ.සං	20	2,792,111,371	1,798,402,955
මාර්ගස්ථ තොගය - ර.බෙ.ග	21	286,587,344	630,130,363
වෙළඳ හා වෙනත් ණයගැතියෝ	22	16,319,412,639	7,901,244,022
පෙරගෙවීම්	23	61,219,447	57,979,683
මුදල් සහ බැංකු ශේෂය	24	1,021,184,699	312,050,502
මුළු ජංගම වත්කම්		**20,480,515,499**	**10,699,807,525**
මුළු වත්කම්		**22,703,059,724**	**12,879,142,849**
ස්කන්ධය හා වගකීම්			
දායක ප්‍රාග්ධනය		59,055,258	59,055,258
රඳවාගත් ඉපයුම්		8,794,490,995	6,792,893,602
පොදු සංචිතය		66,061,447	66,061,447
මුළු ස්කන්ධය		**8,919,607,700**	**6,918,010,307**
ජංගම නොවන වගකීම්			
විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව	25	221,192,102	232,516,523
විලම්බිත බදු වගකීම	26	50,116,492	32,134,929
මුළු ජංගම නොවන වගකීම්		**271,308,595**	**264,651,453**
ජංගම වගකීම්			
වෙළඳ හා අනෙකුත් ණයහිමියෝ	27	10,423,896,495	3,996,134,208
ආදායම් බදු බැඳියාව		447,868,696	337,976,089
විලම්බිත ආදායම්		1,345,422	926,953
ජංගම මූල්‍ය වගකීම්	28	2,639,032,817	1,361,443,839
මුළු ජංගම වගකීම්		**13,512,143,429**	**5,696,481,089**
මුළු ස්කන්ධය හා වගකීම්		**22,703,059,724**	**12,879,142,849**

මෙම මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලදි.

ආචාර්ය. එම්.එච්.එම්. රුමි සභාපති	වෛද්‍ය/ එම්.එයි.කේ. විල්ප්‍රඩ් කළමනාකරන අධ්‍යක්ෂ	කේ.එම්.ඩී.ආර්. දසනායක සාමාන්‍යාධිකාරී	හිරන්‍යා සම්මන්දජ්පෙරුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය

පිටු අංක 21 සිට 57 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම ගිණුම් වාර්තාව හා සබැඳි අත්‍යාවශ්‍ය කොටස්වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

	දායක ප්‍රාග්ධනය රු	පොදු සංචිතය රු	ඒකාබද්ධ ලාභාලාභ ගිණුම රු	එකතුව රු
2016 ජනවාරි 1 වන දිනට ශේෂය	**59,055,258**	**66,061,447**	**4,949,243,062**	**5,074,359,767**
වසරේ මුළු විස්තිරණ ආදායම				
වසරේ ශුද්ධ ලාභය			1,241,744,631	1,241,744,631
වසරට අදාල විශ්‍රාමික පාරිතෝෂික අතිරික්තය/හිඟය			10,049,455	10,049,455
රාජ්‍ය භාණ්ඩාගාරය සමඟ ගනුදෙනු				
භාණ්ඩාගාර අයබදු ගෙවීම්			(216,000,000)	(216,000,000)
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	**59,055,258**	**66,061,447**	**5,985,037,149**	**6,110,153,853**
2017 ජනවාරි 1 වන දිනට ශේෂය	59,055,258	66,061,447	5,985,037,149	6,110,153,853
වසරේ මුළු විස්තිරණ ආදායම				
වසරේ ශුද්ධ ලාභය			1,089,431,741	1,089,431,741
වසරට අදාල විශ්‍රාමික පාරිතෝෂික අතිරික්තය/හිඟය			(59,575,287)	(59,575,287)
රාජ්‍ය භාණ්ඩාගාරය සමඟ ගනුදෙනු				
භාණ්ඩාගාර අයබදු ගෙවීම්			(222,000,000)	(222,000,000)
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	**59,055,258**	**66,061,447**	**6,792,893,602**	**6,918,010,307**
2018 ජනවාරි 1 වන දිනට ශේෂය	59,055,258	66,061,447	6,792,893,602	6,918,010,307
වසරේ මුළු විස්තිරණ ආදායම				
වසරේ ශුද්ධ ලාභය			953,149,764	953,149,764
ගිණුම්කරණ ප්‍රමිත (SLFRS 9) ප්‍රථම වරට යොදා ගැනීමේ දී අදාල තිරණ හා තක්සේරු කිරීම්වල වෙනස් වීම (සටහන 34)			1,017,994,355	1,017,994,355
වසරට අදාල විශ්‍රාමික පාරිතෝෂික අතිරික්තය/හිඟය			30,453,274	30,453,274
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**59,055,258**	**66,061,447**	**8,794,490,995**	**8,919,607,700**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

	සටහන	ක්‍රියාකාරකම් රා.ඖ.ස. රු.	ක්‍රියාකාරකම් රා.බෙ.ග. රු.	මුළු ක්‍රියාකාරකම් 2018 රු.	මුළු ක්‍රියාකාරකම් 2017 රු.
ආදායම	**8**	**7,458,320,575**	**31,436,985,958**	**38,895,306,533**	**32,563,691,374**
අඩු කළා					
සෘජු වියදම් - රා.බෙ.ග	**9**		29,311,933,710	29,311,933,710	24,083,263,984
විකුණුම් පිටිවැය - රා.ඖ.ස	**10**	5,558,886,605		5,558,886,605	4,832,202,660
නිෂ්පාදන පිටිවැය - ජීවනී ඒකකය	**11**	89,050,781		89,050,781	80,829,820
දළ ලාභය/අතිරික්තය		**1,810,383,189**	**2,125,052,248**	**3,935,435,437**	**3,567,394,910**
එකතු කළා- වෙනත් මෙහෙයුම් ආදායම්	**12**	73,072,867		73,072,867	53,004,143
අඩු කළා					
පරිපාලන වියදම්	**13**	1,037,779,045	497,498,613	1,535,277,658	1,288,183,698
වෙනත් මෙහෙයුම් වියදම්	**14**	218,835,580	473,132,331	691,967,911	741,458,980
මෙහෙයුම් ලාභය		**626,841,431**	**1,154,421,304**	**1,781,262,734**	**1,590,756,376**
අඩු කළා- මූල්‍ය වියදම්	**15**	1,870,302	67,047,779	68,918,081	36,494,698
එකතු කළා-මූල්‍ය ආදායම් (සේවක ණය පොලි)		7,436,916	-	7,436,916	5,765,380
බදු වලට පෙර ලාභය		**632,408,045**	**1,087,373,524**	**1,719,781,569**	**1,560,027,058**
ආදායම් බදු වියදම	**16**	281,910,290	484,721,515	766,631,805	470,595,316
බදු වලට පසු ලාභය		**350,497,755**	**602,652,009**	**953,149,764**	**1,089,431,741**
අනෙකුත් විස්තිරණ ආදායම්					
පාරිතෝෂික වෙන්කිරීම් මත අතිරික්තය/ඌනතාව		13,399,440	17,053,833	30,453,274	(59,575,287)
වසරේ මුළු විස්තිරණ ආදායම		**363,897,195**	**619,705,842**	**983,603,037**	**1,029,856,454**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඔසුසල ආදායම් ප්‍රකාශය

	ඔසුසල වෙළඳාම අනුරාධපුර	ඔසුසල වෙළඳාම මහරගම	ඔසුසල වෙළඳාම ජයවර්ධනපුර	ඔසුසල වෙළඳාම කරාපිටිය	ඔසුසල වෙළඳාම මිගමුව	ඔසුසල වෙළඳාම බදුල්ල	ඔසුසල වෙළඳාම දියතලාව	ඔසුසල වෙළඳාම ගාපනය	ඔසුසල වෙළඳාම පොළොන්නරුව	ඔසුසල වෙළඳාම රත්මලාන	ඔසුසල වෙළඳාම තංගල්ල	ඔසුසල වෙළඳාම රාගම	ඔසුසල වෙළඳාම බණ්ඩාරගම	ඔසුසල වෙළඳාම කොටුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
විකුණුම්	113,279,398	103,646,604	185,833,784	107,828,274	89,265,534	103,260,438	21,075,221	103,481,261	95,059,236	11,584,734	38,860,765	95,217,760	44,948,559	50,495,220
විකුණුම් පිරිවැය හා මාරු කිරීම්	92,732,384	84,091,963	154,877,603	90,939,176	72,651,099	86,143,946	16,948,650	95,868,950	77,781,167	8,955,639	31,630,606	78,390,628	36,357,034	39,086,191
විකුණුම් හා මාරු කිරීම් මත														
දළ වෙළඳ ලාභය	**20,547,014**	**19,554,641**	**30,956,181**	**16,889,098**	**16,614,435**	**17,116,491**	**4,126,571**	**7,612,311**	**17,278,069**	**2,629,095**	**7,230,159**	**16,827,132**	**8,591,525**	**11,409,030**
ආයතන හා පරිපාලන වියදම්														
සේවක පඩි හඩි	9,534,336	12,720,408	29,113,798	12,391,081	9,180,750	10,422,879	5,136,443	7,553,142	9,088,764	3,266,553	6,831,293	9,494,398	6,985,800	5,472,515
ගමන් වියදම්	100	1,552	2,300	11,980	1,600	13,112	2,025	26,190	3,940	6,326	4,707	26,670	6,616	13,626
සැපයුම් හා අවශ්‍යතා	72,631	374,122	434,735	206,571	138,260	177,929	65,637	91,940	245,583	26,187	179,026	96,407	146,790	131,093
අලුත්වැඩියා හා නඩත්තු	100,224	200,247	179,198	113,954	89,194	217,198	44,868	156,185	153,415	3,938	55,946	47,129	40,952	81,511
ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගිතා	3,439,514	2,939,060	4,861,248	4,140,111	3,303,900	2,376,302	365,529	3,366,541	2,857,143	298,067	1,852,886	2,706,019	1,259,178	2,547,561
හා වෙනත් සේවා														
වෙනත් මෙහෙයුම් වියදම්														
විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය	441,563	633,126	215,225	384,910	322,724	353,241	130,798	117,168	257,101	44,907	174,373	606,293	177,235	199,213
මුළු පිරිවැය	**13,588,368**	**16,868,514**	**34,806,504**	**17,248,607**	**13,036,429**	**13,560,661**	**5,745,300**	**11,311,165**	**12,605,946**	**3,645,979**	**9,098,230**	**12,976,915**	**8,616,572**	**8,445,518**
ශුද්ධ ලාභය/අලාභය	**6,958,646**	**2,686,127**	**(3,850,323)**	**(359,509)**	**3,578,006**	**3,555,830**	**(1,618,729)**	**(3,698,854)**	**4,672,123**	**(1,016,883)**	**(1,868,071)**	**3,850,217**	**(25,047)**	**2,963,512**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඔසුසල ආදායම් ප්‍රකාශය

	ඔසුසල වෙළඳාම අනුරාධපුර	ඔසුසල වෙළඳාම මහරගම	ඔසුසල වෙළඳාම ජයවර්ධනපුර	ඔසුසල වෙළඳාම කරාපිටිය	ඔසුසල වෙළඳාම මිගමුව	ඔසුසල වෙළඳාම බදුල්ල	ඔසුසල වෙළඳාම දියතලාව	ඔසුසල වෙළඳාම ගාපනය	ඔසුසල වෙළඳාම පොළොන්නරුව	ඔසුසල වෙළඳාම රත්මලාන	ඔසුසල වෙළඳාම තංගල්ල	ඔසුසල වෙළඳාම රාගම	ඔසුසල වෙළඳාම බණ්ඩාරගම	ඔසුසල වෙළඳාම කොටුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
විකුණුම්	113,279,398	103,646,604	185,833,784	107,828,274	89,265,534	103,260,438	21,075,221	103,481,261	95,059,236	11,584,734	38,860,765	95,217,760	44,948,559	50,495,220
විකුණුම් පිරිවැය හා මාරු කිරීම්	92,732,384	84,091,963	154,877,603	90,939,176	72,651,099	86,143,946	16,948,650	95,868,950	77,781,167	8,955,639	31,630,606	78,390,628	36,357,034	39,086,191
විකුණුම් හා මාරු කිරීම් මත														
දළ වෙළඳ ලාභය	**20,547,014**	**19,554,641**	**30,956,181**	**16,889,098**	**16,614,435**	**17,116,491**	**4,126,571**	**7,612,311**	**17,278,069**	**2,629,095**	**7,230,159**	**16,827,132**	**8,591,525**	**11,409,030**
ආයතන හා පරිපාලන වියදම්														
සේවක පඩි නඩි	9,534,336	12,720,408	29,113,798	12,391,081	9,180,750	10,422,879	5,136,443	7,553,142	9,088,764	3,266,553	6,831,293	9,494,398	6,985,800	5,472,515
ගමන් වියදම්	100	1,552	2,300	11,980	1,600	13,112	2,025	26,190	3,940	6,326	4,707	26,670	6,616	13,626
සැපයුම් හා අවශ්‍යතා	72,631	374,122	434,735	206,571	138,260	177,929	65,637	91,940	245,583	26,187	179,026	96,407	146,790	131,093
අලුත්වැඩියා හා නඩත්තු	100,224	200,247	179,198	113,954	89,194	217,198	44,868	156,185	153,415	3,938	55,946	47,129	40,952	81,511
ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගිතා	3,439,514	2,939,060	4,861,248	4,140,111	3,303,900	2,376,302	365,529	3,366,541	2,857,143	298,067	1,852,886	2,706,019	1,259,178	2,547,561
හා වෙනත් සේවා														
වෙනත් මෙහෙයුම් වියදම්														
විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය	441,563	633,126	215,225	384,910	322,724	353,241	130,798	117,168	257,101	44,907	174,373	606,293	177,235	199,213
මුළු පිරිවැය	**13,588,368**	**16,868,514**	**34,806,504**	**17,248,607**	**13,036,429**	**13,560,661**	**5,745,300**	**11,311,165**	**12,605,946**	**3,645,979**	**9,098,230**	**12,976,915**	**8,616,572**	**8,445,518**
ශුද්ධ ලාභය/අලාභය	**6,958,646**	**2,686,127**	**(3,850,323)**	**(359,509)**	**3,578,006**	**3,555,830**	**(1,618,729)**	**(3,698,854)**	**4,672,123**	**(1,016,883)**	**(1,868,071)**	**3,850,217**	**(25,047)**	**2,963,512**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඔසුසල ආදායම් ප්‍රකාශය

	ඔසුසල වෙළඳාම මොරැල්ල	ඔසුසල වෙළඳාම ඇම්පිපිටිය	ඔසුසල මහනුවර දුම්රියපළ	ඔසුසල වෙළඳාම ගම්පහ	ඔසුසල වෙළඳාම නාගොඩ	ඔසුසල වෙළඳාම බේරුවල	ඔසුසල වෙළඳාම පිළියන්දල	ඔසුසල වෙළඳාම නිත්දුවර්	ඔසුසල වෙළඳාම අක්කරෙයිපත්තුව	ඔසුසල වෙළඳාම මොනරාගල	ඔසුසල වෙළඳාම ජේරාදෙණිය	ප්‍රාදේශීය ගබඩාව මහනුවර	සමස්ථ ඔසුසල වෙළඳ ලිඛාකාරකම්
\	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
විකුණුම්	52,096,391	45,057,188	49,111,035	66,520,015	40,857,281	38,054,517	35,099,923	19,031,090	8,836,484	20,155,323	16,617,194	145,423,947	4,761,113,560
විකුණුම් පිරිවැය හා මාරු කිරීම්	45,014,804	36,856,958	38,646,480	54,758,630	32,568,917	30,002,425	28,846,934	15,957,408	6,464,889	14,746,395	13,336,043	103,161,825	3,961,295,386
විකුණුම් හා මාරු කිරීම් මත													
දළ වෙළඳ ලාභය	**7,081,588**	**8,200,230**	**10,464,556**	**11,761,385**	**8,288,364**	**8,052,092**	**6,252,989**	**3,073,682**	**2,371,596**	**5,408,928**	**3,281,151**	**42,262,122**	**799,818,174**
ආයතන හා පරිපාලන වියදම්													
සේවක පඩි නඩි	6,786,891	6,754,629	6,689,062	8,806,035	6,397,338	6,575,281	7,465,339	4,176,171	2,645,572	3,948,870	2,804,191	8,542,364	458,350,345
ගමන් වියදම්	8,150	7,580	6,638	20,228	12,800	-	1,270	-	9,000	3,320	1,450	28,402	455,406
සැපයුම් හා අවශ්‍යතා	61,840	74,390	155,703	134,844	26,021	56,017	30,774	73,235	37,428	63,061	84,214	133,670	6,450,712
අලුත්වැඩියා හා නඩත්තු	37,773	123,266	20,419	25,994	41,870	10,229	25,901	7,041	20,446	13,099	14,313	48,418	5,603,061
ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගිතා	1,849,538	2,166,135	2,140,956	3,554,937	2,482,767	3,190,176	3,535,804	1,817,923	1,486,874	1,519,045	701,277	2,957,053	119,270,609
හා වෙනත් සේවා													-
වෙනත් මෙහෙයුම් වියදම්													
විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය	186,337	342,134	235,641	451,024	64,104	245,632	381,325	253,491	69,618	93,133	34,599	970,994	16,104,842
මුළු පිරිවැය	**8,930,530**	**9,468,135**	**9,248,418**	**12,993,063**	**9,024,900**	**10,077,335**	**11,440,412**	**6,327,862**	**4,268,939**	**5,640,528**	**3,640,045**	**12,680,901**	**606,234,975**
ශුද්ධ ලාභය/අලාභය	**(1,848,942)**	**(1,267,904)**	**1,216,138**	**(1,231,678)**	**(736,536)**	**(2,025,243)**	**(5,187,423)**	**(3,254,179)**	**(1,897,344)**	**(231,600)**	**(358,894)**	**29,581,220**	**193,583,199**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2018 රු.	2017 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
බදු වලට පෙර ශුද්ධ ලාභය	**1,719,781,569**	**1,560,027,058**
ගැලපීම්		
ක්ෂය කිරීම්	76,385,267	61,697,188
විශ්‍රාමික පාරිතෝෂික වෙන්කිරීම්	40,771,844	32,216,995
කල්බදු ක්‍රමක්ෂය - රත්මලාන	160,000	160,000
බදු කුලි ක්‍රමක්ෂය	617,474	617,474
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය (මෘදුකාංග)	1,804,647	1,804,647
නොඉපයූ ලාභ	15,067,318	6,694,960
පෙර වසර වලට අදාල ගැලපුම්	1,017,994,355	-
බොල් ණය සඳහා වෙන්කිරීම	267,293,781	511,091,735
තොග අලාභ	1,498,172	5,213,537
හානි වූ හා යල් පැනගිය තොග සඳහා වෙන්කිරීම - රා.ඖ.ස	56,755,361	104,395,904
හානි වූ හා යල් පැනගිය තොග සඳහා වෙන්කිරීම - රා.බෙ.ග	29,389,174	2,474,920
පොලි වියදම්	67,405,970	35,199,403
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය	**3,294,924,931**	**2,321,593,820**
වෙළඳ සහ වෙනත් ණයගැතියෝ වැඩිවීම/අඩුවීම	(8,685,462,398)	(3,891,160,432)
තැන්පතු සහ පෙර ගෙවීම් වැඩිවීම/අඩුවීම	(3,239,763)	(20,365,354)
තොග වැඩිවීම/අඩුවීම	(1,066,110,633)	99,181,735
මාර්ගස්ථ තොගය වැඩිවීම/අඩුවීම	313,235,212	(96,298,779)
වෙළඳ ණයහිමියෝ වැඩිවීම/අඩුවීම	6,427,762,286	1,338,513,886
විලම්බිත ආදායම්	418,469	(176,531)
මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය	**281,528,105**	**(248,711,655)**
ආදායම් බදු ගෙවීම්	(638,757,636)	(659,031,538)
පාරිතෝෂික ගෙවීම්	(21,642,992)	(12,711,078)
පොලි ගෙවීම්	(67,405,970)	(35,199,403)
භාණ්ඩාගාර අයබදු හා ලාභාංශ ගෙවීම්	-	(222,000,000)
විශේෂිත අයිතම වලට පෙර මුදල් ප්‍රවාහය	**(727,806,597)**	**(928,942,019)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**(446,278,493)**	**(1,177,653,674)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම	(116,183,149)	(143,489,633)
නොනිමිවැඩ වැඩිවීම/අඩුවීම	(5,993,140)	66,505,362
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් උපයෝජනය	**(122,176,289)**	**(76,984,271)**
මුදල් හා මුදල් වලට සමාන දෑවල ශුද්ධ වැඩිවීම	(568,454,782)	(1,254,637,945)
වර්ෂය මුල මුදල් හා මුදල් වලට සමාන දෑ	**(1,049,393,337)**	**205,244,608**
වර්ෂය අග මුදල් හා මුදල් වලට සමාන දෑ (සටහන-අ)	**(1,617,848,119)**	**(1,049,393,337)**

සටහන (අ) මුදල් හා මුදල් වලට සමාන දෑ	2018 රු.	2017 රු.
අතැති මුදල් සහ බැංකු මුදල්	956,829,749	252,633,564
භාණ්ඩාගාර බිල්පත් ආයෝජන	64,354,949	59,416,938
බැංකු අයිරාව	(2,639,032,817)	(1,361,443,839)
වර්ෂය අග මුදල් හා මුදල් වලට සමාන දෑ	**(1,617,848,119)**	**(1,049,393,337)**

ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. ආයතනික තොරතුරු

1.1 පොදු තොරතුරු

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1971 දී රාජ්‍ය සංස්ථාවක් ලෙස ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති අතර අංක 75, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01 යන ස්ථානයේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ සංස්ථාව දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මාස දොලහක කාල සීමාව සඳහා මූල්‍ය වාර්තා සකස් කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම ගිණුම් වාර්තා අනුමත කරයි.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම්

සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ,

- ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂිත අයිතම විවෘත වෙළඳපොලට ආනයනය කිරීම, මිලදී ගැනීම, විකිණීම සහ බෙදාහැරීම.
- රාජ්‍ය බෙහෙත් ගබඩාවට අවශ්‍ය ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය කර සැපයීම.
- ජීවනි, ග්ලුකෝස් සහ බෙන්සිල් බෙන්සෝවේට් ක්‍රීම් (B.B. Cream) ඇතුළු අයිතම ගණනාවක් නිෂ්පාදනය කර විකිණීම.
- රසායනාගාර පහසුකම් සැපයීම සහ ඖෂධ නියැදි පරීක්ෂාව.

2. පිළියෙල කිරීමේ පදනම

2.1 පිළියෙල කිරීමේ පදනම

මෙම මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී.ල.මූ.වා.ප්‍ර හා ශ්‍රී.ල.ගි.ප්‍ර ඇතුලත් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරන ප්‍රමිතියනට අනුව පිළියෙල කර ඇත. (SLFRS & LKAS)

2.2 ගිණුම් පදනම

සාධාරණ වටිනාකම අනුව දක්වා ඇති වත්කම් හා වගකීම් හැරුනුවිට සියළු මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැයට අනුව පිළියෙල කර ඇත. සංස්ථාවේ ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේදී එහි නිල හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය ලෙස ශ්‍රී ලංකා රුපියල භාවිතා කරයි.

2.3 අඛණ්ඩ පැවැත්ම

දිගින් දිගට පැවැත්මේ සංකල්පය අනුව සංස්ථාවේ ගිණුම් ප්‍රකාශන පිළියෙල කර ඇත.

3. ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඇස්තමේන්තු හා තීරණයන් ගේ වෙනස් කිරීම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරීම්

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව SLFRS 9 හා SLFRS 15 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 2018 ජනවාරි මස 1වන දින සිට ගිණුම් තැබීමට යොදාගත් අතර එය පෙර ගිණුම් ප්‍රකාශන තුල දැක්වූ වටිනාකම් වලට අදාල ගිණුම් ප්‍රතිපත්ති හා ගැලපීම් වල වෙනස්කම් ඇති වීමට හේතු විය. සංස්ථාව මෙයට පෙර ගිණුම් කාලපරිච්ඡේද සඳහා ප්‍රමිත SLFRS 9 කලින් යොදාගෙන නොතිබුණි.

මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත යොදා ගැනීමට අදාල සංක්‍රාන්තිය විධිවිධාන වලට අනුකූලව SLFRS 9 හා SLFRS 15 ට අනුකූලවීමේදී පෙර වසර වල සංසන්දනාත්මක දත්ත නැවත සකසා නොදැක්වීමට සංස්ථාව තිරණය කරණ ලදි.

මූල්‍ය වත්කම් මූල්‍ය හා වගකීම් හා ගනුදෙනුකරුවන් ගෙන් ලද කොන්ත්‍රාත් ආදායම් වල ශුද්ධ පොත් අගයන්ට අදාල ගැලපීම් නව ගිණුම් ප්‍රමිතයනට මාරුවන දිනදී ආරම්භක රඳවාගත් ලාභය හා මෙම කාලපරිච්ඡේදයට අදාල අනෙකුත් සංචිත ලෙස හඳුනා ගෙන ඇත.

ඒ අනුව හෙලිදරවු කිරීමේ සටහන් සඳහා SLFRS 7 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයට අදාල ප්‍රධාන සංශෝධන හෙලිදරවු කිරීම් ප්‍රවර්ථන වර්ශයේම භාවිතා කර ඇති අතර පෙර වසරට අදාල සංසන්දනාත්මක දත්ත සටහන් පෙර පරිදිම දක්වා ඇත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත SLFRS 15 යොදාගැනීම හේතුවෙන් ආදායම් හඳුනාගැනීම හා අගය කිරීම සම්බන්ධ වෙනසක් පැනනැගී නොමැත. කෙසේ වුවත්, නව ප්‍රමිතය යොදාගැනීම හේතුවෙන් ආදායම් හඳුනා ගැනීමේ දී ඇතිවන බලපෑම සටහන් අංක 8A මඟින් විස්තරාත්මකව දක්වා ඇත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත SLFRS 9 යොදාගැනීම හේතුවෙන් මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හා මූල්‍ය වත්කම් වල අගය අඩුවීම ආදිය හඳුනාගැනීම, වර්ගීකරණය හා ගණනය කිරීමට අදාල ගිණුම් ප්‍රතිපත්ති වෙනස් විය. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත SLFRS 9 මූල්‍ය මෙවලම් හා සම්බන්ධිත SLFRS 7 "මූල්‍ය සාධන පත්‍රශ්‍රී හෙලිදරවු කිරීම" වැනි වෙනත් ප්‍රමිතයන්ද සැලකිය යුතු ලෙස සංශෝධනයවී ඇත

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත SLFRS 9 ට අනුගතවීමේ දී රාජ්‍ය ඖෂධ සංස්ථාවට ඇතිවූ බලපෑම (සංසන්දනය කරනු ලබන කාල සීමාව කලින් පැවති බණී 39 ගිණුම්කරණ ප්‍රමිතයට අනුව වන බැවින්) සටහන් අංක 34 හි සවිස්තරාත්මකව හෙලිදරවු කර දක්වා ඇත.

4. මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

4.1.1 මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

ප්‍රථම වරට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත SLFRS 9 හා SLFRS 15 ගිණුම් තැබීමට යොදා ගැනීමේ දී ඇතිවූ ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්කම් හැර සංස්ථාව විසින් භාවිතා කරන ලද මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේ භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුරූපවේ. ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම සඳහා සංස්ථාව වෙනස්කල නැවත සකස් කිරීමේ ක්‍රමය (Modified Restatement Method) භාවිතා කර ඇති බැවින් පෙර වර්ෂයේ සංඛ්‍යා ප්‍රවර්ථන වටිනාකම් හා සංසන්දනය කළ නොහැක.

4.1.2 දේපල, පිරියත හා උපකරණ

අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයකට අනුව, 2015 වසරේදී, විශ්‍රාමික රජයේ නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු හා ශ්‍රී ලංකා තක්සේරු කරුවන්ගේ ආයතනයේ හිටපු උපසභාපති වරයෙකු වන ජේ. එම්. සේනානායක බණ්ඩාර මහතා විසින් ගෘහභාණ්ඩ, උපකරණ හා පරිගණක තක්සේරු කරන ලදි. සත්‍ය වශයෙන් පවතින ගෘහ භාණ්ඩ, උපකරණ හා පරිගණක හඳුනා ගැනීම, ලේබල් කිරීම/සංකේත අංක යොදා භෞතික සත්‍යාපනය කිරීම 2015 දෙසැම්බර් 31 දිනට ලාල් නානායක්කාර සහ සමාගම (වරලත් ගණකාධිකාරිවරු) විසින් සිදුකරන ලදි.

ගෘහභාණ්ඩ, උපකරණ හා පරිගණක තක්සේරුවේදී හටගත් රු. 26,978,382/- ක ප්‍රත්‍යාගණන ඌනතාවය 2016 වසරේ ලාභාලාභ ගිණුමට හර කරන ලදි.

ගෘහභාණ්ඩ, උපකරණ හා පරිගණක හැර දේපල, පිරියත හා උපකරණ සටහන් කර ඇත්තේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානි වටිනාකම් ඇත්නම් ඒවා ද අඩුකළ ශුද්ධ පිරිවැයට වේ. එබඳු පිරිවැය අගයයන්ට දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ වෙනුවෙන් වූ උපාංග ප්‍රතිෂ්ඨාපන පිරිවැය සහ පිරිවැය නිර්ණායක වලට අනුකූල වන්නේ නම්, දිර්ඝ කාලීන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ණය ගැනීමේ පිරිවැයද ඇතුලත්වේ. යම් නියමිත කාලයකට වරක් දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ වල වැදගත් කොටස් වෙනුවට අලුත් ඒවා යෙදීම අවශ්‍ය වන්නේ නම්, අදාල ඉවත් කරනු ලබන කොටසට අදාල වටිනාකම ඉවත්කරන අතර නව කොටස එහි ප්‍රයෝජනවත් ආයුකාලය හා ක්ෂය සමඟින් පිරිවැයට එකතු කරනු ලැබේ. එලෙසම, ප්‍රධාන පරීක්ෂාවක් සිදුකරනු ලබන අවස්ථාවේදි එහි පිරිවැය, පිරිවැය නිර්ණායක සපුරාලන්නේ නම්, ප්‍රතිෂ්ඨාපන පිරිවැයක් වශයෙන් දේපල හා පිරියත හා උපකරණ ලෙස හඳුනාගැනේ. අනෙකුත් අලුත් වැඩියා කිරීම් හා නඩත්තු වියදම් ආදායම් ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ.

4.1.2.1 කල්බදු දේපල - රත්මලාන

රාජ්‍ය ඖෂධ සංස්ථාව විසින් කඳවල වත්ත 2 වන කොටස ලෙස හඳුන්වන ඉඩමේ 1 සිට 9 දක්වා ලකුණු කර දක්වන භූමිය හා දේපල 1981 සැප්තැම්බර් මස 11 වන දින 99 වසරක කාලයක් සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් දිගුකාලීන බද්දට ලබාගන්නා ලදි.

වරලත් ගණකාධිකාරී ආයතනය දේපල භාවිතා කිරීමට ඇති අයිතිය සම්බන්ධයෙන් නිකුත්කර ඇති (SOAT) ප්‍රකාශනයට අනුව ප්‍රත්‍යාගණන වටිනාකම් ද ඇතුලත් ගිණුම් ප්‍රකාශයේ ඉදිරියට ගෙන ආ බදු දේපල වටිනාකම ඉතිරි බදුකාලය පුරා ක්‍රමක්ෂය කරයි.

කල්බදු දේපල	2018 දෙසැම්බර් 31 රු.	2017 දෙසැම්බර් 31 රු.
ප්‍රත්‍යාගණන වටිනාකම	11,000,000	11,000,000
සමුච්චිත ක්‍රමක්ෂය වටිනාකම		
ආරම්භක ශේෂය	1,120,000	960,000
වසරට අදාල ක්‍රමක්ෂය	160,000	160,000
වසර අවසානයේදි ක්‍රමක්ෂය	1,180,000	1,120,000
අවසාන ශේෂය	9,720,000	9,880,000

කල්බදු දේපල වෙතිහාසික පිරිවැයට දැක්වුයේ නම් ශුද්ධ පොත් අගය පහත සඳහන් පරිදි වේ.

	දෙසැම්බර් 31 රු.	දෙසැම්බර් 31 රු.
කල්බදු දේපල		
පිරිවැය	2,400,000	2,400,000
සමුච්චිත ක්‍රමක්ෂය වටිනාකම	896,969	872,727
අවසාන ශේෂය	1,503,031	1,527,273

4.1.3 ක්ෂය කිරීම්

අනුපාතික පදනම අනුව, දේපල, පිරියත හා උපකරණ අත්පත් කරගත් හා ඉවත්කල වර්ෂය තුල ක්ෂය කිරීම සිදුකරයි. දේපල, පිරියත හා උපකරණ වල ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ආයුකාලය පහත පරිදි වේ.

ගොඩනැගිලි	වසර 20 - 40	පිරියත හා උපකරණ	වසර 8
රථ වාහන	වසර 3 සිට 17	බයිසිකල්	වසර 6 සිට 7
ලි බඩු සහ සවිකිරීම්	වසර 10	පරිගණක	වසර 4
උපකරණ	වසර 5		

4.1.4 නොනිමි වැඩ - ප්‍රාග්ධනය

ප්‍රවර්ථන වර්ෂයේ දී දරා ඇති එහෙත් ශේෂපත්‍ර දින දී ප්‍රාග්ධනිත නොකල ප්‍රාග්ධන වියදම් නොනිමි වැඩ ප්‍රාග්ධනය ලෙස දක්වා ඇති අතර ප්‍රවර්ථන වර්ෂයේදී ප්‍රාග්ධනිත ගත කර ප්‍රයෝජනයට ගන්නා ප්‍රාග්ධන වත්කම් දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇත.

4.1.5 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කර ගන්නා අස්පෘශ්‍ය වත්කම් වල මූලික පිරිවැය වශයෙන් සළකනු ලබන්නේ අත්පත් කරගැනිමේ පිරිවැයයි. මූලික පිරිවැය හඳුනා ගැනිමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම් ඉදිරියට ගෙනයන අගය තිරණය කරනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානි කරන අලාභ අඩු කරමිනි. බැහැරකළ ප්‍රාග්ධන සංවර්ධන වියදම්, අභ්‍යන්තරිකව ජනනය කරන ලද අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධන ගත කරනු නොලබන අතර අදාල වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ වර්ෂය තුල දැරා ඇති වියදම දක්වනු ලැබේ.

සංස්ථාවේ අස්පෘශ්‍ය වත්කම් වල පිරිවැය ඒවායේ තක්සේරු කල ඵලදායි ජීවිත කාලය තුල සරල රේඛීය ක්‍රමය භාවිතයෙන් පහත පරිදි ක්‍රමක්ෂය කර ඇත.

පරිගණක මෘදුකාංග වසර 3යි.

4.1.6 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

වත්කම් හානි විය හැකි බව දක්වන සංඥාවක් ඇතිදැයි සංස්ථාව එක් එක් වාර්තා කරන දිනයේ දී තක්සේරු කරයි. කවර හෝ සංඥාවක් පවති නම්, හෝ වත්කමක් සඳහා වාර්ෂික හානි පිරික්සුමක් අවශ්‍ය වූ විට, සංස්ථාව අදාල වත්කමේ අයකර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරයි.

4.1.7 බදුකරණය

4.1.7.1 වර්තමාන බදුකරණය

වර්තමාන බදු වත්කම් හා බදු වගකිම් වනුයේ, බදු බලධාරින්ට ප්‍රවර්ථන වර්ෂය හා අතීත වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු වන හා ඔවුන්ගේන් අයකරගත යුතු වන වටිනාකම් වේ. එම බදු ප්‍රමාණයන් ගණනය කිරීමට යොදා ගන්නා ලද බදු අනුපාතික හා බදු නීති වනාහි ශේෂපත්‍ර දින වන විට බලාත්මක කරන ලද ඒවා වේ.

ඒ අනුව, 2017 අංක 24 දරණ දේශිය ආදායම් පනත හා එයට කරන ලද සංශෝධන වල විධිවිධාන වලට අනුකූලව හා පනතේ නියම කර ඇති අනුපාතයනට අනුව බදු ගෙවීමේ කාර්යය සඳහා ගලපන ලද වර්ෂයේ ලාභය පදනම් කර ගෙන බදු ප්‍රතිපාදනය කරන ලැබේ. සමාලෝචිත වර්ෂයේ බදු සඳහා ප්‍රතිපාදන සලස්වා ඇත්තේ පනතේ නියම කර ඇති අනුපාතික වලට යටත්ව ගිණුම්ගත ලාභය පදනම් කරගෙනය.

4.1.7.2 විලම්බිත බදුකරණය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල හඳුනාගෙන ඇති සැම වර්ගයකම තාවකාලික වෙනස්කම්, විලම්බිත බදු වත්කම් හා බැරකම් ගණනය සඳහා සලකා බලා ඇත. මූල්‍ය ප්‍රකාශය තුල ප්‍රධාන වශයෙන් ස්ථාවර වත්කම්, විශ්‍රාම පාරිතෝෂිකය සඳහා වූ ප්‍රතිපාදනය, ණයගැති අගය අඩුවීම් විලම්බිත බදු ගණනය සඳහා සලකා බලා ඇත. සංස්ථාවේ විලම්බිත වත්කම් හා බැරකම් ආදායම් බදු අනුපාතය අනුව ගණනය කර දක්වයි.

4.2. භාණ්ඩ තොග

සංස්ථාවේ භාණ්ඩ තොග වටිනාකම් ගණනය කරනු ලබන්නේ කල් ඉකුත්වූ හා විකිණිය නොහැකි භාණ්ඩ සඳහා නිසි වෙන්කිරීම් කල පසුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මතවේ. ප්‍රථමයෙන් ලැබූ අයිතම ප්‍රථමයෙන් නිකුත් කිරීමේ (FIFO) පදනමට තොග වටිනාකම තක්සේරු කරයි.

4.2.1. තොග අගය කිරීම

4.2.2 තොග පිරිවැය

අමුද්‍රව්‍ය තොග - පීවනී ඒකකය

අමතර වියදම්ද ඇතුලත්ව මිල දී ගැනීමේ පිරිවැයට

නොනිමි වැඩ

අමුද්‍රව්‍ය පිරිවැය හා විවල්‍ය නිෂ්පාදන වියදම මුළුමනින්ම

නිමි භාණ්ඩ

අමුද්‍රව්‍ය පිරිවැය හා විවල්‍ය නිෂ්පාදන වියදම මුළුමනින්ම

4.2.3 මුදල් හා මුදල් වලට සමාන දෑ

මුදල් හා මුදල් වලට සමාන දෑ වලට අයත් වන්නේ අතැති මුදල් හා බැංකු මුදල්, භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන, මාස දොලහක් හෝ අඩු කාලයක් තුල කල්පිරෙන ද්‍රවශීල තාවයෙන් ඉහල ආයෝජනයි. බැංකු අයිරාව ශේෂපත්‍රයේ ජංගම වගකීම් යටතේ දක්වා ඇත.

4.2.4 පර්යේෂණ පිරිවැය

නව විද්‍යාත්මක හෝ තාක්ෂණික දැනුම හා අවබෝධය ලබා ගැනීමේ අරමුණෙන් සිදුකරන පර්යේෂණ කටයුතු සඳහා වූ වියදම් ඇතිවූ අවස්ථාවේ දීම ලාභයට ගලපනු ලබයි.

5. බැරකම් සහ ප්‍රතිපාදන

5.1 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

5.1.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම - විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට සංස්ථාව බැඳී සිටී. සේවකයෙකුට ගෙවිය යුතු පාරිතෝෂිකය සඳහා බැරකමක් පැන නගින්නේ සේවකයෙකු සංස්ථාව සමඟ අවුරුදු පහක අඛන්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන අවස්ථාවේදීය. ශේෂ පත්‍රයේ පෙන්නුම් කරන මෙම වගකීම ශේෂපත්‍ර දිනයේ දී ප්‍රක්ෂිප්ත ඒකක බැර ක්‍රමය ට අනුව (Projected Unit Credit Method) තක්සේරු කළ විශ්‍රාම ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකමයි. මෙම විශ්‍රාම ප්‍රතිලාභ වගකීම සඳහා බාහිර අරමුදලක් ඇති කර නොමැත. විශ්‍රාම ප්‍රතිලාභ වගකීමට අදාලව තක්සේරු වන සියලු ආයුගණක ලාභ හා අලාභ අනෙකුත් විස්තිරණ ආදායම් යටතේ වහාම ගිණුම්ගත කිරීමට සංස්ථාව කටයුතු කරයි.

වෘත්තිය ආයුගණක තක්සේරුකාර ආයතනයක් වන **Actuarial and Management Consultants (Pvt) Ltd.** ආයතනයේ එම්. පුපාලනාදන් මහතා විසින් 2018 දෙසැම්බර් 31 දිනට ආයුගණක තක්සේරුව සිදු කරන ලදි. විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව ගණනය කිරීමේදි පහත උපකල්පන හා දත්ත ආයුගණක තක්සේරු කරු විසින් භාවිතා කර ඇත.

අපේක්ෂිත වාර්ෂික වැටුප් වර්ධන අනුපාතය %	-	5 %
දීමනා වර්ධන අනුපාතය %	-	10 %
වට්ටම්/පොලී අනුපාතය	-	11.5 %
සේවක පිරිවැටුම් අනුපාතය	-	2 %
විශ්‍රාමික වයස	-	වයස 60

5.1.2 නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයට හා සේවක භාරකාරත්ව අරමුදල් දායකත්වයට සේවකයන් වෙනුවෙන් ලබාදෙන දායකත්වයන් අදාළ අරමුදල් රෙගුලාසි වලට අනුකූලව අදාළ දායකත්ව අරමුදල් මඟින් ආවරණය කරනු ලැබේ. සේවකයන් ආවරණය කරමින් අර්ථසාධක අරමුදලට හා භාරකාර අරමුදලට සැපයෙන දායකත්වයන් ආදායම් ප්‍රකාශය තුල වියදම් වශයෙන් හඳුනා ගනු ලැබේ.

සේවක අර්ථසාධක අරමුදල

පිළිවෙලින් සංස්ථාව හා සේවකයන් ගමන් වියදම් දීමනා හැර දළ වැටුපෙන් 12% ක් හා 10% ක් ලෙස සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය සපයයි.

සේවක භාරකාර අරමුදල

සංස්ථාව ගමන් වියදම් දීමනා හැර දළ සේවක වැටුපෙන් 3%ක් සේවක භාරකාර අරමුදලට දායකත්වය සපයයි.

6. ආදායම් ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යානුගත වියදම් ක්‍රමය යොදා ගෙන ඇත්තේ එමඟින් සංස්ථාවේ කාර්යසාධනයෙහි මූලිකාංග සාධාරණව නිරූපණය වන බැවිණි.

6.1.1 ආදායම් හඳුනා ගැනීම

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත SLFRS 15 ගනුදෙනුකරුවන් සමඟ කොන්ත්‍රාත් ආදායම් ප්‍රමිතයේ පියවර පහ ප්‍රවේශයට අනුව සංස්ථාව ආදායම් හඳුනා ගැනීම හා නිර්ණය කිරීම සිදුකරයි. තෙවන පාර්ශවයන් වෙනුවෙන් රැස්කළ වටිනාකම් හැර ගනුදෙනුකරු සමඟ කොන්ත්‍රාත්තුවේ නිරූපිත ප්‍රතිඵලාව පදනම් කරගෙන සංස්ථාව සිය ආදායම නිර්ණය කරයි. සංස්ථාව ආදායම් හඳුනාගන්නේ කාර්යසාධන බැඳීම් පිළිබඳ සැහීමට පත්වන්නේ නම් පමණි.

සංසන්දනාත්මක කාලපරිච්ඡේදයේදී, ආර්ථික ප්‍රතිලාභය සංස්ථාව වෙත ගලා ඒමේ හැකියාව නිශ්චිත, ආදායම හා ඊට සම්බන්ධ පිරිවැය නිවැරදිව ගණනය කළහැකි ආදායම්, ගෙවීම්කර ඇති නැති බව නොසලකා උපචිත පදනමට හඳුනා ගන්නා ලදි. ගිවිසුම් ගතව නිර්වචනය කරන ලද ගෙවීම් නියමයන් සැලකිල්ලට ගනිමින් ලැබුණු හෝ අයවිය යුතු ප්‍රතිඵලාවේ සාධාරණ වටිනාකමට ආදායම ගණනය කරනු ලැබිය.

6.1.1.1. භාණ්ඩ හා සේවාවල ස්වභාවය

සංස්ථාව තම ආදායම් ජනනය කරනු ලබන ප්‍රධාන ක්‍රියාකාරකම් හා එම ක්‍රියාකාරකම් වලට අදාල ආදායම් හඳුනා ගැනීමේ ප්‍රතිපත්තීන් පහතින් දැක්වේ.

(අ) ඖෂධ හා සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය හා වෙළඳාම මඟින් ලද ආදායම්

සංස්ථාව පහත ප්‍රභවයන්ගෙන් ආදායම් හඳුනා ගනියි:

බෙදාහරින්නන් /වරලත් වෙළඳුන්	සංස්ථාව ආදායම හඳුනාගන්නේ මාසිකව, පාරිභෝගිකයා භාණ්ඩ තම භාරයට ලබාගත් මොහොතේ දිය. ගනුදෙනු කරුවන්ට විටින්විට දැනුම් දෙනු ලබන සංස්ථාව විසින් තීරණය කරන ලද මිලකට ගනුදෙනු කරුවන්ට භාණ්ඩ අලවිකරයි. නිකුත් කරනු ලබන අවස්ථාවේ නරක්වී, අවපැහැගැන්වී හෝ අත්වැරදීමකින් වැරදි අයිතමයක් බෙදාහරින්නන්ට නිකුත් වුවහොත් හැර සංස්ථාව භාණ්ඩ බෙදාහරින්නන්ට අලෙවිකල භාණ්ඩ නැවත භාර ගැනීම හෝ වෙනත් භාණ්ඩයකට හුවමාරු කිරීම සිදුනොකරයි. ගනුදෙනු කරුවන් විසින් මුලදී ගැනීමට බලාපොරොත්තු වන වටිනාකමට සමාන අවලංගු කල නොහැකි කොන්දේසි විරහිත බැංකු ඇපකරයක් ඖෂධ සංස්ථාව වෙත ලබාදිය යුතු වේ. බැංකු ඇපකරය ගිවිසුම් කාලය ආරම්භයේ සිට මාස 26 ක් දක්වා වලංගු කාලයක් සඳහා වියයුතු වන අතර ගිවිසුම් කාලය පුරා බලාත්මක විය යුතු වේ.
රජයේ හමුදාවන්/රජයේ රෝහල්/ පුද්ගලික රෝහල්	සංස්ථාව ආදායම හඳුනාගන්නේ මාසිකව, ගනුදෙනුකරුට භාණ්ඩ භාරදුන් අවස්ථාවේදී වේ. ගනුදෙනු කරුවන්ට විටින්විට දැනුම් දෙනු ලබන සංස්ථාව විසින් තීරණය කරන ලද මිලට ගනුදෙනු කරුවන්ට භාණ්ඩ අලවිකරයි. නිකුත් කරනු ලබන අවස්ථාවේ නරක්වී, අවපැහැගැන්වී හෝ අත්වැරදීමකින් වැරදි අයිතමයක් බෙදාහරින්නන්ට නිකුත් වුවහොත් හැර සංස්ථාව අලෙවිකල භාණ්ඩ නැවත භාර ගැනීම හෝ වෙනත් භාණ්ඩයකට හුවමාරු නොකරයි.

(ආ) වෛද්‍ය සේවා දෙපාර්තමේන්තුවට ඖෂධ හා සෞඛ්‍ය ආරක්ෂිත අයිතම සැපයීමෙන් ලද ආදායම්

වෛද්‍ය සේවා දෙපාර්තමේන්තුවට භාණ්ඩ ලබාදුන් අවස්ථාවේදී ආදායම හඳුනා ගනියි. නිකුත් කරනු ලබන අවස්ථාවේ නරක්වී, අවපැහැගැන්වී හෝ අත්වැරදීමකින් වැරදි අයිතමයක් නිකුත් වුවහොත් හැර සංස්ථාව අලෙවිකල භාණ්ඩ නැවත භාර ගැනීම හෝ වෙනත් භාණ්ඩ වලට හුවමාරු කිරීම සිදු නොකරයි.

(ඇ) ඖෂධ හා සෞඛ්‍ය ආරක්ෂිත අයිතම නිෂ්පාදනය

ඖෂධ සංස්ථාව පහත ඖෂධ වර්ග නිෂ්පාදනය කර අලවි කරයි.

- ජීවනී
- ග්ලූකෝස්
- බෙන්සිල් බෙන්සොවේට් ක්‍රිමි

භාණ්ඩ ගනුදෙනු කරුවන්ට භාරදුන් අවස්ථාවේදී නිෂ්පාදිත භාණ්ඩ විකුණුම් ලෙස හඳුනා ගනියි. නිකුත් කරනු ලබන අවස්ථාවේ නරක්වී, අවපැහැගැන්වී හෝ අත්වැරදීමකින් වැරදි අයිතමයක් නිකුත් වුවහොත් හැර සංස්ථාව අලෙවිකල භාණ්ඩ නැවත භාර ගැනීම හෝ වෙනත් භාණ්ඩයකට හුවමාරු කිරීම සිදු නොකරයි.

ආදායම් හඳුනා ගැනීමේදී සංස්ථාව පහත විශේෂිත නිර්ණායකයන් ද සලකා බලයි.

6.1.1.2. ආපසු එවීමේ හිමිකම සහිත විකුණුම්

සංස්ථාව විසින් ආපසු එවීමේ හිමිකම සහිතව භාණ්ඩයේ පාලනය ගනුදෙනුකරුට ලබාදෙනුයේ,

- විකුණනු ලබන භාණ්ඩය කල් ඉකුත්වීමට ආසන්නවී
- නිකුත් කරනු ලබන අවස්ථාවේ භාණ්ඩය නරක්වී හෝ අවපැහැගැන්වී
- අත්වැරදීමකින් වැරදි අයිතමයක් නිකුත්වූ

ආපසු එවීමේ හිමිකම සහිතව විකුණූ භාණ්ඩ සංස්ථාව විසින් පහත පරිදි හඳුනා ගනියි.

- සංස්ථාව හිමිකම් ලැබීමට අපේක්ෂා කරන ප්‍රමාණයට මාරුකළ අයිතමයේ ආදායම
- ආපසු ගෙවීමේ වගකීම, හා
- වත්කමක් (එයට අනුරූප විකුණුම් පිරිවැය ගැලපීම) සඳහා මුදල් ආපසු ගෙවීමේ වගකීම පියවීම මත ගනුදෙනුකරුවන්ගේ භාණ්ඩ ආපසු ලබාගැනීම

එක් එක් වාර්තා කරන කාලපරිච්ඡේදය අවසානයේදී, මාරු කරන ලද භාණ්ඩ සඳහා හුවමාරු වශයෙන් හිමිකම් ලැබීමට අපේක්ෂා කරන මුදල් තක්සේරු කිරීම සංස්ථාව විසින් යාවත්කාලීන කළ යුතු අතර අවශ්‍යවූ විට ගනුදෙනු මිලට අනුරූප වෙනසක් සිදුකරයි.

මුදල් ආපසු ගෙවීමේ ප්‍රමාණයන් පිළිබඳ අපේක්ෂා වෙනස් කිරීම සඳහා සංස්ථාව එක් එක් වාර්තා කරන කාලසීමාව අවසානයේ මුදල් ආපසු ගෙවීමේ වගකීම යාවත්කාලීන කල යුතුය. අනුරූප ගැලපීම සංස්ථාවේ ආදායම (හෝ ආදායමේ අඩුවීමක්) ලෙස හඳුනා ගනියි.

මුදල් ආපසු ගෙවීමෙන් වගකීම පියවීම මත ගනුදෙනු කරුවන්ගෙන් භාණ්ඩ ලබාගැනීමට සංස්ථාව හඳුනාගෙන ඇති වත්කමක් මුලින් ගණනය කරනු ලබන්නේ එම භාණ්ඩයේ ශුද්ධ අගයෙන් භාණ්ඩය ආපසු ගැනීම සඳහා අපේක්ෂිත පිරිවැයක් ඇත්නම් අඩුකිරීමෙනි. එක් එක් වාර්තා කරන කාලපරිච්ඡේදය අවසානයේදී, ආපසු ලැබිය හැකි භාණ්ඩ පිළිබඳ අපේක්ෂාවන් හි වෙනස්වීම් හේතුවෙන් පැන නගින වත්කම් ඇගයීම සංස්ථාව යාවත්කාලීන කළ යුතුය.

6.1.1.3. අනෙකුත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනම අනුව හඳුනාගනියි.

6.1.1.4 සැපයුම් කරුවන්ගෙන් ලැබිය යුතු වන්දි

අතිරේක ගබඩා ගාස්තු, ඩෙමරේජ් ගාස්තු, හිඟ සැපයුම් සහ තොග හානි වෙනුවෙන් අයවිය යුතු හිමිකම් ඒවායේ අවිනිශ්චිත භාවය නිසා මුල්‍ය ප්‍රකාශනයන්හි සැලකිල්ලට ගෙන නොමැත. කෙසේ වෙතත් ආදායම උපලබ්ධි වන බව නිශ්චිතව දන්නා විට එම හිමිකම් මුල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර ඇත.

සංස්ථාව SLFRS 15 යොදාගෙන ඇත්තේ (Modified Restatement Method) භාවිතා කරමින් එබැවින් සංසන්දනාත්මක තොරතුරු නැවත දක්වා නොමැති අතර LKAS18 යටතේ පෙර පරිදිම දක්වා ඇත. LKAS 18 යටතේ ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති SLFRS 15 යටතේ ඇති ඒවාට වඩා වෙනස් නම් ඒවා වෙන වෙනම හෙලිදරව් කර ඇති අතර වෙනස් කම් වල බලපෑම සටහන 8A හි අනාවරණය කර ඇත.

6.1.2 වියදම්

වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී ව්‍යාපාරය පවත්වා ගෙන යාමෙන් ඇති වූ සියළුම වියදම් ආදායමෙන් අඩුකර ඇත. අලත්වැඩියාවන් හා අලුත් කිරීම් එම වියදම ඇතිවූ වර්ෂයේ ලාභාලාභ වලට ගලපයි.

6.1.3 මූල්‍ය වියදම්

ප්‍රයෝජනයට ගත හැකි මට්ටමට ගෙන ඒමට සැලකිය යුතු කාලයක් ගතවන වත්කම්, අත්පත්කර ගැනීම, ගොඩනැගීම. නිෂ්පාදනය වෙනුවෙන් කෙලින්ම අදාලවන ණය පිරිවැය, අදාල වත්කමේ පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධන ගත කරයි. අනෙක් සියළුම ණය පිරිවැයන් පිරිවැය දරන ලද වර්ෂයේ වියදම් ලෙස සලකයි. සංස්ථාවේ මූල්‍ය වියදම් තුල බැංකු අයිරාපොලි, ණයවර ලිපි ආරම්භ කිරීමේ වියදම් සහ ණය ගිවිසුම් ගාස්තු ඇතුලත්වේ.

6.1.4 පොදුකාර්ය වියදම් බෙදා වෙන්කිරීම

රාජ්‍ය ඖෂධ සංස්ථාව සහ රාජ්‍ය බෙහෙත් ගබඩාවට සම්බන්ධ ක්‍රියාකාරකම් විශ්ලේෂණය කර ගොඩනගාගත් ප්‍රතිශතයන් අනුව පොදුකාර්ය පිරිවැය බෙදා වෙන්කර දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශනයේ පොදුකාර්ය වියදම් බෙදා ඇති ආකාරය පහත දැක්වේ.

		ර.බෙ.ග	රා.ඕ.ස
(a)	සේවක වේතන	56%	44%
(b)	ගමන් වියදම්	10%	90%
(c)	සැපයුම් සහ අවශ්‍යතා	25%	75%
(d)	අලුත්වැඩියා සහ නඩත්තු	50%	50%
(e)	ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගිතා හා වෙනත් සේවා	50%	50%
(f)	පර්යේෂණ හා සංවර්ධන	65%	35%
(g)	බැංකු අයිරා පොලි	(සත්‍ය වියදම)	(සත්‍ය වියදම)

7. මූල්‍ය සාධන පත්‍ර - මූලික හඳුනාගැනීම සහ පසු අගය කිරීම

7.1. මුල් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හඳුනාගනු ලබන්නේ අස්විත්වය සාධනපත්‍රයේ ගිවිසුම් ප්‍රතිපාදන වලට පාර්ශව කරුවෙකු වූ අවස්ථාවේදිය. සාමාන්‍ය පරිදි නියමාකාර මූල්‍ය වත්කම් මිලදි ගැනීම හා විකිණීම හඳුනාගන්නේ භුවමාරු දිනයේදී, එනම් සංස්ථාව වත්කම විකිණීමට හෝ මිලදි ගැනීමට බැඳී සිටින දිනදිය.

මූලික හඳුනා ගැනීමේ දී, සංස්ථාව මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් සාධාරණ වටිනාකමට අඩු හෝ වැඩි ලෙස මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට හඳුනා නොගන්නා අවස්ථාවකදී, මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් අත්පත්කර ගැනීම හෝ නිකුත් කිරීම වෙනුවෙන් වැඩිවූ හා සෘජුවම අදාලවන ගනුදෙනු පිරිවැයට ද වේ.

7.1.1. මූල්‍ය වත්කම්

7.1.1.1 වර්ගීකරණය හා පසු තක්සේරුව

2018 ජනවාරි 1 වන දින සිට, සංස්ථාව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත SLFRS 9 අනුගමනය කරමින් මූල්‍ය වත්කම් පහත මිනුම් කාණ්ඩ යටතේ වර්ග කර ඇත.

- ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකම (FVPL)
- වෙනත් විස්තිරණ ආදායම් ගිණුම හරහා සාධාරණ වටිනාකම (FVOCI) හෝ
- ක්‍රමක්ෂය පිරිවැය

ණය හා ප්‍රාග්ධන උපකරණ වර්ගීකරණයේ අවශ්‍යතා පහතින් විස්තරකර ඇත.

ණය මෙවලම්

ණය මෙවලම් යනු නිකුත් කරනු ලබන්නාගේ දෘෂ්ටිකෝණයෙන් බලන විට මූල්‍ය වගකීමක් ලෙස නිර්වචනය කලහැකි මෙවලමිය. ණය මෙවලම් වල වර්ගීකරණය හා පසු තක්සේරුව පහත කරුණු මත රඳා පවති.

අ. වත්කම කළමනාකරණය සඳහා වන සංස්ථාවේ ව්‍යාපාරික ආකෘතිය :හා

ආ. වත්කමේ මුදල් ප්‍රවාහයේ ලක්ෂණ

මෙම කරුණු පදනම්ව, සංස්ථාව තම ණය මෙවලම් පහත සඳහන් මිනුම්කාණ්ඩ තුනට වර්ගීකරණය කර දක්වයි.

7.1.1.1.1. ක්‍රමක්ෂේපිත පිරිවැය

මුදල් ගලාඒම නියෝජනය කරන එම ගෙවීම මුල් මුදල හා පොලිය පමණක් වන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහය රැස්කිරීම සඳහා තබාගන්නා වත්කම් (SPPI) හා ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකම (FVPL) දැක්වීමට නියම කර නොමැති, වත්කම් ක්‍රමක්ෂේපිත පිරිවැයට දක්වනු ලැබේ. මෙම මූල්‍ය වත්කම් වලින් ලද පොලි ආදායම ඵලදායී පොලි අනුපාත ක්‍රමයට ගණනයකර වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ දක්වනු ලැබේ. අතැති මුදල් හා බැංකු මුදල්, සේවක ණය, වෙළඳ ණයගැතියෝ හා කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත් ආයෝජන දැනට සංස්ථාව මෙම වර්ගීකරණය යටතේ දක්වයි.

7.1.1.1.2. වෙනත් විස්තිරණ ආදායම් ගිණුම හරහා සාධාරණ වටිනාකම (FVOCI)

මුදල් ගලාඒමේදී මුල් මුදල හා පොලිය පමණක් නියෝජනයවන ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකම (FVPL) දැක්වීමට නියම කර නොමැති, ගිවිසුම්ගත මුදල් ප්‍රවාහය රැස්කිරීමට හෝ වත්කම විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් වෙනත් විස්තිරණ ආදායම් ගිණුම හරහා සාධාරණ වටිනාකමට නිර්ණය කර දක්වයි. (FVOCI) මූල්‍ය වත්කම් හානිකරන ලාභ හෝ අලාභ හඳුනා ගැනීම් ද, පොලි ආදායම හා ලාභාලාභ ගිණුමෙහි හඳුනා ගත් මූල්‍ය සාධන පත්‍ර ක්‍රමක්ශේපිත පිරිවැය මත විදේශ මුදල් භුවමාරු ලාභ හෝ අලාභ ද හැර ධාරණ අගයෙහි විචලනයන් විස්තිරණ ආදායම් ගිණුමේ ගලපයි. මූල්‍ය වත්කමක් හඳුනා ගැනීමෙන් බැහැර කරන විට, කළින් විස්තිරණ ආදායම් ගිණුම හරහා හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ ස්කන්ධය වෙනස්වීමේ සිට ලාභ හෝ අලාභ ලෙස වර්ග කර ලාභාලාභ ගිණුමට ගලපයි. මෙම මූල්‍ය වත්කම් වල පොලි ආදායම ඵලදායී පොලි අනුපාත ක්‍රමයට ගණනය කර වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස දක්වයි. මෙම වර්ග කිරීම යටතේ ගැනෙන කිසිදු මූල්‍ය වත්කමක් දැනට සංස්ථාව සතුව නොමැත.

7.1.1.1.3. ලාභ ලාභ ගිණුම හරහා සාධාරණ මිල

ක්‍රමක්ෂේපිත පිරිවැය හෝ වෙනත් විස්තිරණ ආදායම් ගිණුම හරහා සාධාරණ මිල (FVOCI) යන නිර්ණායක වලට නොගැනෙන වත්කම් ලාභාලාභ ගිණුම හරහා සාධාරණ මිල ක්‍රමයට අගය කරයි. ණය ආයෝජන ලාභය හෝ අලාභය ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට පසු ගණනය කරන හා හෙජින් ගිවිසුමක කොටසක් නොවන විට එය පැන නගින කාල සිමාවට අදාල ලාභාලාභ ගිණුමේ ලාභය හෝ අලාභය ලෙස හඳුනා ගනියි. එය සාධාරණ මිලට නම් කරන ලද හෝ විකිණීම සඳහා නොවන ණය උපකරණයකින් පැන නගින්නක් නොවන්නේ නම් ලාභාලාභ ප්‍රකාශයේ වෙනමම ඉදිරිපත් කරයි. මෙම මූල්‍ය වත්කම් වලින් ලැබෙන පොලි ආදායම ඵලදායි පොලි අනුපාත ක්‍රමයට අනුව ගණනය කර වෙනත් මෙහෙයුම් ආදායමට ඇතුලත් කරයි. දැනට සංස්ථාව සතුව මෙම කාණ්ඩය යටතට ගැනෙන කිසිදු වත්කමක් නොමැත.

- **ව්‍යාපාර ආකෘතිය**

මුදල් ප්‍රවාහය ජනනය කිරීම සඳහා සංස්ථාව වත්කම් කළමනාකරණය කරන ආකාරය ව්‍යාපාරික ආකෘතියෙන් පිළිබිඹුවේ. එනම් සංස්ථාවේ පරමාර්ථය තනිකරම වත්කම් වලින් ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය ලබාගැනීම හෝ ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය හා වත්කම විකිණීමෙන් පැනනගින ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය යන දෙකම සඳහා ද යන්නයි. එසේ නොවන විට (විකිණීම අරමුණු කරගත් මූල්‍ය වත්කම්) එවිට මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියෙන් වෙනත් කොටසක් ලෙස වර්ගීකරණය කර ලාභාලාභ ගිණුම හරහා සාධාරණ අගයට ගණනය කරනු ලබයි. වත්කම් සමූහයක් සඳහා ව්‍යාපාර ආකෘතිය තීරණය කිරීමේදී සංස්ථාව, වත්කම සඳහා මුදල් ප්‍රවාහය එකතු කරන ආකාරය පිළිබඳ පෙර අත්දැකීම්, වත්කම් වල ක්‍රියාකාරිත්වය ඇගයීමට ලක්කර ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරින්ට වාර්තා කරන ආකාරය, අවදානම් තක්සේරුකර කළමනාකරණය කරන්නේ කෙසේද, හා කළමනාකරුවන්ට හානිපූරණය කරන්නේ කෙසේද යන්න සලකා බලයි.

- **මුළු මුදල හා පොලිය පමණක් ගෙවීම** (SPPI)

ව්‍යාපාර ආකෘතිය විසින් වත්කම් ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය ලබාගැනීම හෝ ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය ලබාගැනීම හා විකිණීම සඳහා වත්කම් තබාගන්නා අවස්ථාවල දී, සංස්ථාව විසින් මූල්‍ය උපකරණයේ මුදල් ප්‍රවාහය මුළු මුදල හා පොලිය පමණක් නියෝජනය කරන බවට තක්සේරු කරයි. (SPPI Test) මෙම තක්සේරු කිරීමේදී, සංස්ථාව විසින් ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය මූලික ණය දිමේ විධිවිධාන වලට අනුකූලද යන්න සළකා බලයි උදා. පොලියට ඇතුලත් වන්නේ මුදල් වල කාල වටිනාකම, ණය අවදානම, වෙනත් මූලික ණයදිමේ අවදානම් හා මූලික ණය විධි-විධානයන්ට අනුව ලාභ ආන්තිකය. මූලික ණය විධිවිධානයන්ට නොගැලපෙන අවදානම් හෝ අස්ථාවරත්වයට නිරාවරණය වීම් ගිවිසුම් කොන්දේසි මඟින් හඳුන්වා දෙන විට අදාල මූලික වත්කම ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට වර්ගීකරණය කර ගණනය කරණු ලබයි. සංස්ථාව ණය ආයෝජන නැවත වර්ගීකරණය කරන්නේ එම වත්කම් කළමනාකරණය කිරීමේ ව්‍යාපාර ආකෘතිය වෙනස්වූවිට පමණි. නැවත වර්ගීකරණය සිදුවන්නේ වෙනස් වීමෙන් පසු පළමු වාරතා කරන කාලපරිච්ඡේදයේ ආරම්භයේ සිටය. එවැනි වෙනස්කම් ඉතා කලාතුරකින් සිදුවනු ඇතැයි අපේක්ෂා කරන අතර සලකා බලන කාලය තුල එවැනි කිසිවක් සිදුවී නොමැත.

7.1.1.2 වත්කම් හානිකරණය

ක්‍රමක්ෂය පිරිවැයට හා (FVOCI) ක්‍රමයට ඉදිරියට ගෙන එන ලද සංස්ථාවේ ණය උපකරණ වත්කම් වල අපේක්ෂිත ණය අලාභ (ECL) අනුව ඉදිරියට ගෙනයන පදනම තක්සේරු කරයි. එක් එක් වාර්තා කරන දිනයේදී එවැනි පාඩු සඳහා වෙන්කිරීමක් සිදුකරයි. අපේක්ෂිත ණය අලාභ (ECL) ඇගයීම පහත කරුණු අනුව වේ.

- සිදුවිය හැකි ප්‍රතිඵල පරාසය තක්සේරු කළ අපක්ෂපාති හා බරතැබූ සම්භාවිතා වටිනාකම
- මුදලේ කාල වටිනාකම ; හා
- අතීත සිදුවීම්, වර්තමාන තත්ත්වයන් හා අනාගත ආර්ථික තත්ත්වයන් පිළිබඳ අනවශ්‍ය පිරිවැයක් හෝ උත්සාහයක් නොමැතිව වාර්තා කරන දිනයේදී ලබාගත හැකි සාධාරණ හා සහාය තොරතුරු

7.1.1.2.1. අපේක්ෂිත ණය පාඩු දීමනාව (ECL) ගණනය කිරීම

ක්‍රමක්ෂය පිරිවැයට හා FVOCI ක්‍රමයට ගණනය කරන මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණයපාඩු දීමනාව ගණනය කිරීම යනු සංකීර්ණ ආකෘතීන් භාවිතා කිරීම හා අනාගත ආර්ථික තත්ත්වයන් හා ණය හැසිරීම පිළිබඳ සැලකිය යුතු උපකල්පන අවශ්‍යවන ක්ෂේත්‍රයකි. (උදා : ශ්‍රී ගනුදෙනුකරුවන් පැහැර හැරීමේ සම්භාවිතාව සහ එහි ප්‍රතිඵල වශයෙන් ඇතිවන පාඩු) අපේක්ෂිත ණය පාඩු (ECL) ගණනය කිරීම සඳහා ගිණුම්කරණ අවශ්‍යතා ක්‍රියාවට නැංවීමේදී සැලකිය යුතු විනිශ්චයන් ගණනාවක් අවශ්‍ය වේ.

- සැලකිය යුතු ලෙස ණය අවදානම වැඩි කරනු ලබන නිර්ණායක තීරණය කිරීම
- (ECL) ගණනය කිරීම සඳහා සුදුසු ආකෘති හා උපකල්පන තෝරා ගැනීම
- සෑම වර්ගයකම භාණ්ඩ/වෙළඳපල හා ඒ ආශ්‍රිත ECL වෙනුවෙන් වූ අවස්ථා අගය කිරීම හා සාපේක්ෂ බරතැබීම් ප්‍රතිෂ්ඨාපනය : හා
- ECL ගණනය කිරීම සඳහා සමාන මූල්‍ය වත්කම් කාණ්ඩ පිහිටුවීම

ECL ගණනය කිරීම සඳහා සංස්ථාව විසින් ගන්නා ලද තීන්දු හා කරන ලද ඇස්තමේන්තු පහත පරිදිවේ.

- අපේක්ෂිත ණය පාඩු යනු පැහැර හැරීමේ සම්භාවිතාව (PD) පැහැර හැරීම් මතවූ අලාභ (LGD) හා ආර්ථික සාධක ගැලපුම් (EFA) අඩුකරන ලද අගයකි. (PD) යනු ණයගැතියෙකු සිය මූල්‍ය වගකීම පැහැර හැරීමේ සම්භාවිතාවය, එනම් ඉදිරි මාස 12 තුල හෝ වගකීමේ ඉතිරි ජීවකාලය තුලවේ.
- පැහැර හැරීම්වලට අනාවරණය වීම තුලින් සංස්ථාව අපේක්ෂා කරන අලාභයේ ප්‍රමාණය LGD මඟින් නියෝජනය කරයි. LGD ගණනය කරනු ලබන්නේ ජීවකාලය පදනම් කරගෙන වන අතර, ජීවකාලය තුල LGD යනු ණයෙහි ඉතිරි අපේක්ෂිත ජීව කාලය තුල පැහැර හැරීමක් සිදුවුවහොත් සිදුවීමට අපේක්ෂිත අලාභයේ ප්‍රතිශතයයි.

- සංස්ථාව වසර අටක ආර්ථික දත්ත පදනම් කරගනිමින් වසර 5ක් සඳහා ආර්ථික වර්ධනය පිළිබඳව පුරෝකථනය කර ඇති අතර වර්ධනයේ බලපෑම පිළිබඳ බරතැබූ සම්භාවිතාව භාවිතා කරමින් ආර්ථික සාධක ගැලපුම (EFA) පිළියෙල කරයි. ප්‍රධාන ගණුදෙනු කරුවන්ගේ ස්වභාවය හේතුවෙන් සංස්ථාවේ වර්ධනයට බලපාන ප්‍රධාන සාධකය ලෙස ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය EFA ගණනය සඳහා යොදා ගනියි.

7.1.1.3. හඳුනා ගැනීමෙන් ඉවත්කිරීම

මූල්‍ය වත්කම්, හෝ එයින් කොටසක්, හඳුනා ගැනීමෙන් ඉවත් කරනුයේ වත්කම් වලින් මුදල් ප්‍රවාහය ලැබීමේ කොන්ත්‍රාත් කාලය අවසන් වූ විට, හෝ ඒවා මාරු කලවිට හෝ (i) සංස්ථාව තම හිමිකාරත්වයේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කලවිට, හෝ (ii) සංස්ථාව තම හිමිකාරත්වයේ සියලු අවදානම් හා ප්‍රතිලාභ මාරු නොකරන අතර වත්කමේ පාලනයද වෙනස් නොකරන විට.

සංස්ථාව වත්කම් වලින් මුදල් ප්‍රවාහ ලබාගැනීම සඳහා ගිවිසුම් ගත අයිතිවාසිකම් රඳවා ගන්නා ගනුදෙනු වලට ඇතුල් වන නමුත් එම මුදල් ප්‍රවාහයන් වෙනත් ආයතන වලට ගෙවීමට ගිවිසුම් ගත බැදීම් ඇති විට හා සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කරනවිට. මෙවැනි ගනුදෙනු “pass through” මාරුකිරීම් ලෙස සැලකෙන අතර ගණුදෙනු හඳුනා නොගැනෙන්නේ සංස්ථාව :

- වත්කම් වලින් සමාන මුදලක් එකතු කිරීම හැර ගෙවීම් කිරීමට බැඳි නැති විටදී
- වත්කම විකිණීමට හෝ ඇපයට තැබීම තහනම් : හා
- වෙනත් වත්කමකින් එකතු කරන යම් මුදලක් ද්‍රව්‍යමය ප්‍රමාදයකින් තොරව ප්‍රේෂණය කිරීමට බැඳි ඇතිවිට.

7.1.2. මූල්‍ය වගකීම්

7.1.2.1. වර්ගීකරණය හා පසු අගය කිරීම

ප්‍රවර්ථන වර්ෂයේ හා පෙර වර්ෂ වල, ලාභාලාභ ගිණුම හරහා සාධාරණ මිලට අගය කරන මූල්‍ය වගකීම් හැර අනෙක් මූල්‍ය වගකීම් වර්ගීකරණය හා පසු ඇගයීම ක්‍රමක්ෂය පිරවැයට සිදුකරයි. මෙම වර්ගීකරණය ව්‍යුත්පන්න, විකිණීම සඳහා ඇති මූල්‍ය වගකීම් හා මූලික හඳුනා ගැනීමේදි නම්කරන ලද වෙනත් මූල්‍ය වගකීම් සඳහා අදාල වේ.

සාධාරණ මිලට ලාභාලාභ ගිණුම හරහා අගය කිරීමට නම් කරන ලද මූල්‍ය වගකීම් වලින් ජනනය වූ ලාභ හෝ අලාභ වලින් කොටසක් වෙනත් විස්තිරණ ආදායම් යටතේ දක්වයි (වගකීම් වල ණය අවදානමේ වෙනස්වීම් වලට හේතු වන මූල්‍ය වගකීම්වල සාධාරණ වටිනාකමේ වෙනස, එය වෙළඳපල අවදානමට තුඩු දෙන වෙළඳපල තත්ත්වයන් හා වෙනස්වීම් වලට ආරෝපණය නොවන ප්‍රමාණය) ඉතිරි කොටස වන (වගකීම්වල සාධාරණ වටිනාකමෙහි ඉතිරි වෙනස) ලාභාලාභ ගිණුමේ දක්වයි. මෙය එවැනි ඉදිරිපත් කිරීමක් මඟින් ගිණුම්කරණ නොගැලපීම් ඇති වීම හෝ විශාල වීමක් සිදුනොවේ නම්, වගකීම්වල ණය අවදානමේ වෙනස්වීම් නිසා ඇති වන වාසි හා අවාසි ද ලාභය හෝ අලාභය ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

සංස්ථාවේ මූල්‍ය වගකීම් යටතට වෙළඳ හා වෙනත් ගෙවිය යුතු වටිනාකම් හා බැංකු අයිරාව ඇතුලත්වේ.

7.1.2.2. හඳුනා ගැනීමෙන් ඉවත්කිරීම

මූල්‍ය වගකීම් හඳුනා ගැනීමෙන් ඉවත් කරනු ලබන්නේ එම වගකීම් අවසන්වූ විටය. (උදා: කොන්ත්‍රාත්තුවේ සඳහන් කරඇති කරුණු වලින් නිදහස්වූ විට, අවලංගුවූ විට හෝ අවසන්වූ විට වේ.)

7.2. ගණනය කිරීමේ ක්‍රමය

ක්‍රමක්ෂය පිරිවැය හා සවිල පොලී අනුපාතය

ක්‍රමක්ෂය පිරිවැය යනු මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් මුලිකව හඳුනා ගැනීමේ දි ගණනය කර අඩුකරන මූලික ආපසු ගෙවීම්, එකතු හෝ අඩු කල සවිල පොලී අනුපාතයට අනුව ගණනය කරන මූලික හඳුනාගැනීමේ වටිනාකම හා කල්පිරීමේ වටිනාකම හා, මූල්‍ය වත්කම් වල අලාභ සඳහා වෙන්කිරීම් තිබේ නම් ගැලපූ අගයයි.

සවිල පොලී අනුපාතය යනු මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් වල ඇස්තමේන්තුගත අනාගත කාලය සඳහා නිවැරදිව වට්ටමිකල මුදල් ගෙවීම් හෝ ලැබීම් සිට දළ වශයෙන් මූල්‍ය වත්කමක ඉදිරියට ගෙනඒ අගයෙහි අනුපාතය වේ. (එනම් කිසියම් හානිකරණ දිමනාවක් ඇත්නම් එය ගැලපීමට පෙර ක්‍රමක්ෂය පිරිවැය) හෝ මූල්‍ය වගකීමක ක්‍රමක්ෂය පිරිවැයවේ.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිර්මාණ සංස්ථාව
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

සටහන 08

ආදායම	2018 රු.	2017 රු.
ආදායම - රා.ඖ.ස		
තොග වෙළඳාම	2,567,562,214	2,477,326,454
පිවතී වෙළඳාම	102,989,475	115,799,633
ඔසුසල වෙළඳාම	4,761,113,560	3,971,193,491
නොඉපයූ ලාභ සඳහා වෙන්කිරීම්	(15,067,318)	(6,694,960)
ණය රක්ෂණ යෝජනා ක්‍රමය	1,887,969	1,765,594
සැපයුම්කරුවන්ගෙන් අයවූ වන්දි	39,834,675	34,010,744
එකතුව	**7,458,320,575**	**6,593,400,956**
ආදායම - රා.ඖ.ග		
ආනයනික සැපයුම්	17,942,708,792	18,025,527,483
දේශීය සැපයුම්	8,015,266,843	7,604,857,767
ම.මි.ගැ ඒකකය හරහා සැපයුම්	5,072,292,258	-
සැපයුම්කරුවන්ගෙන් අයවූ වන්දි	349,972,173	339,905,167
ප්‍රමාදවී සැපයුම් මත දඩ	56,745,892	-
එකතුව	**31,436,985,958**	**25,970,290,418**
මුළු ආදායම	**38,895,306,533**	**32,563,691,374**

සටහන 08 අ

ආපසු එවීමේ පදනම ගැටලේ විකිණුම්.
විකුණුම් ආපසු එවීම් හා සංස්ථාවේ සමස්ථ විකුණුම් හා සසඳන කළ ප්‍රමානාත්මක නොවේ. කෙසේ වුවත්, විකුණුම් ආපසු හරවා එවීමේ සම්භාවිතාව හා එවැනි හරවා එවීම් වල ප්‍රමාණාත්මක බලපෑම් ගලපා ගැනීම සඳහා සංස්ථාව අවධානය යොමු කරයි.

සටහන 09

විකුණුම් පිරිවැය/ඍජු වියදම් ඍජු වියදම් - රා.ඖ.ග	2018 රු.	2017 රු.
ආදායම	**31,436,985,958**	**25,970,290,418**
ඍජු වියදම්		
ර.ඖ.ග ඇණවුම් වල පිරිවැය (මි.ර.ගැ)	16,179,994,614	16,455,725,318
තිරු ගාස්තු සහ බදු	455,574,179	444,831,083
දේශීය සැපයුම් පිරිවැය	7,715,060,316	7,313,131,719
ම.මි.ගැ ඒකකය හරහා සැපයුම් (ර.ඖ.ග)	4,877,204,094	-
එකතුව	**29,227,833,203**	**24,213,688,120**
බැංකු වියදම් (මුද්දර ගාස්තු, කොමිස්, ණයවර ලිපි ගාස්තු සහ අනෙකුත්)	269,174,820	265,781,348
ගොඩබෑමේ වියදම්	27,100,728	31,669,757
ආනයන බලපත්‍ර ගාස්තු	40,841,939	10,782,684
එකතුව	**337,117,486**	**308,233,788**
අඩු කළා : මාර්ගස්ථ තොග	253,016,979	438,657,925
ඍජු වියදම්/විකුණුම් පිරිවැය	**29,311,933,710**	**24,083,263,984**
දළ ලාභය/අතිරික්තය	**2,125,052,248**	**1,887,026,434**

සටහන 10

විකුණුම් පිරිවැය - රා.ඖ.ස	තොග වෙළඳාම රු.	ඔසුසල වෙළඳාම රු.	මුළු වෙළඳාම රා.ඖ.ස-2018 රු.	මුළු වෙළඳාම රා.ඖ.ස-2017 රු.
වර්ෂය ආරම්භයේ වෙළඳ තොගය	987,908,212	773,931,152	1,761,839,364	1,870,806,566
එකතු කළා				
ආනයනික බෙහෙත්	2,665,737,168		2,665,737,168	1,953,899,794
රසායනාගාර අමුද්‍රව්‍ය	3,088,247		3,088,247	2,903,123
ර.ඖ.ස. ටෙන්ඩර් සඳහා දේශීය මිලදි ගැනුම්	1,247,979,355		1,247,979,355	922,397,459
ම.මි.ගැ ඒකකයේ මිලදි ගැනුම්	521,171,149		521,171,149	269,941,302
දේශීය මිලදි ගැනුම් (ඔසුසල)	-	2,132,303,865	2,132,303,865	1,700,598,981
තොග මාරු කිරීම්	(1,978,852,611)	1,978,852,611	-	-
විකිණීම සඳහා තිබූ වෙළඳ තොගය	**3,447,031,520**	**4,885,087,628**	**8,332,119,149**	**6,720,547,226**
අඩු කළා : වර්ෂය අවසානයේ වෙළඳ තොගය	1,849,440,302	923,792,242	2,773,232,544	1,888,344,565
විකුණුම් පිරිවැය හා මාරුකිරීම්	**1,597,591,219**	**3,961,295,386**	**5,558,886,605**	**4,832,202,660**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

සටහන -10අ

විකුණුම් පිටිවැය	ඔසුසල වෙළඳාම කොළඹ 07	ඔසුසල වෙළඳාම කොළඹ 04	ඔසුසල වෙළඳාම කොළඹ 01	ඔසුසල වෙළඳාම මහනුවර	ඔසුසල වෙළඳාම නුගේගොඩ	ඔසුසල වෙළඳාම අවිස්සාවේල්ල	ඔසුසල වෙළඳාම රත්නපුර	ඔසුසල වෙළඳාම මිනුවන්ගොඩ	ඔසුසල වෙළඳාම පානදුර	ඔසුසල වෙළඳාම ගාල්ල	ඔසුසල වෙළඳාම මාතර	ඔසුසල වෙළඳාම කුරුණෑගල	ඔසුසල වෙළඳාම අම්පාර	ඔසුසල වෙළඳාම හම්බන්තොට
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ආරම්භක වෙළඳ තොගය	117,589,031	22,762,074	39,241,303	56,501,730	41,837,024	16,001,553	17,884,059	11,484,333	20,392,066	20,007,011	16,662,871	38,301,153	9,634,798	7,356,908
දේශීය මිලදිගැනීම්	695,330,810	316,178,068	84,651,004	201,527,628	47,435,534	16,382,837	26,865,317	12,083,032	42,322,119	29,232,927	31,159,686	61,037,767	7,254,976	23,029,327
තොග මාරුකිරීම්	265,852,567	124,078,246	68,316,073	111,092,919	61,348,270	41,423,004	48,554,411	23,981,452	52,696,721	53,454,829	41,935,022	71,178,848	67,081,167	26,206,716
විකිණීම සඳහා ඇති තොගය	**1,078,772,409**	**463,018,388**	**192,208,380**	**369,122,277**	**150,620,828**	**73,807,394**	**93,303,787**	**47,548,818**	**115,410,906**	**102,694,766**	**89,757,580**	**170,517,767**	**83,970,942**	**56,592,950**
වර්ෂය අවසානයේ වෙළඳ තොගය	114,203,916	68,614,205	43,552,858	60,075,394	34,278,881	15,697,128	20,659,874	12,412,989	29,658,818	19,311,941	18,798,156	42,861,833	16,467,908	16,274,647
විකුණුම් පිටිවැය හා මාරුකිරීම්	**964,568,493**	**394,404,183**	**148,655,522**	**309,046,883**	**116,341,947**	**58,110,266**	**72,643,914**	**35,135,828**	**85,752,088**	**83,382,826**	**70,959,424**	**127,655,934**	**67,503,033**	**40,318,303**
මුළු වෙළඳාම													-	
විකුණුම්	1,133,783,872	470,798,998	184,104,349	357,288,076	138,619,782	71,063,340	89,221,651	43,335,775	105,168,585	101,988,205	86,060,968	155,647,458	75,106,335	48,228,990
අඩු කලා- විකුණුම් පිටිවැය	964,568,493	394,404,183	148,655,522	309,046,883	116,341,947	58,110,266	72,643,914	35,135,828	85,752,088	83,382,826	70,959,424	127,655,934	67,503,033	40,318,303
දළ වෙළඳ ලාභය	**169,215,379**	**76,394,815**	**35,448,827**	**48,241,193**	**22,277,834**	**12,953,073**	**16,577,737**	**8,199,947**	**19,416,497**	**18,605,380**	**15,101,545**	**27,991,524**	**7,603,301**	**7,910,687**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

සවිහන -10අ

විකුණුම් පිටිවැය	ඔසුසල වෙළඳාම අනුරාධපුර	ඔසුසල වෙළඳාම මහරගම	ඔසුසල වෙළඳාම ජයවර්ධනපුර	ඔසුසල වෙළඳාම කරාපිටිය	ඔසුසල වෙළඳාම මිගමුව	ඔසුසල වෙළඳාම බදුල්ල	ඔසුසල වෙළඳාම දියතලාව	ඔසුසල වෙළඳාම ගාපනය	ඔසුසල වෙළඳාම පොළොන්නරුව	ඔ.තො.ය ගබඩාව රත්මලාන	ඔසුසල වෙළඳාම තංගල්ල	ඔසුසල වෙළඳාම රාගම	ඔසුසල වෙළඳාම බණ්ඩාරගම	ඔසුසල වෙළඳාම කොටුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ආරම්භක වෙළඳ තොගය	18,617,409	24,471,466	34,591,436	27,047,892	12,975,001	15,767,442	4,487,924	14,970,820	19,487,005	2,307,620	13,899,179	16,163,772	8,347,415	8,921,007
දේශීය මිලදිගැනිම්	39,859,110	36,254,395	84,308,267	40,210,821	27,790,627	42,127,438	4,219,190	68,572,001	18,937,751	2,012,664	13,533,026	23,421,417	10,712,502	14,235,955
තොග මාරුකිරීම්	58,132,760	51,044,477	66,252,442	54,463,026	43,900,005	50,838,279	13,449,626	29,833,507	62,772,900	6,949,815	22,089,201	58,172,353	26,744,489	27,035,451
විකිණීම සඳහා ඇති තොගය	**116,609,280**	**111,770,338**	**185,152,146**	**121,721,738**	**84,665,633**	**108,733,160**	**22,156,739**	**113,376,329**	**101,197,656**	**11,270,100**	**49,521,406**	**97,757,543**	**45,804,407**	**50,192,413**
වර්ෂය අවසානයේ වෙළඳ තොගය	23,876,895	27,678,376	30,274,543	30,782,562	12,014,534	22,589,214	5,208,089	17,507,378	23,416,489	2,314,461	17,890,800	19,366,915	9,447,372	11,106,222
විකුණුම් පිටිවැය හා මාරුකිරීම්	**92,732,384**	**84,091,963**	**154,877,603**	**90,939,176**	**72,651,099**	**86,143,946**	**16,948,650**	**95,868,950**	**77,781,167**	**8,955,639**	**31,630,606**	**78,390,628**	**36,357,034**	**39,086,191**
මුළු වෙළඳාම														
විකුණුම්	113,279,398	103,646,604	185,833,784	107,828,274	89,265,534	103,260,438	21,075,221	103,481,261	95,059,236	11,584,734	38,860,765	95,217,760	44,948,559	50,495,220
අඩු කලා- විකුණුම් පිටිවැය	92,732,384	84,091,963	154,877,603	90,939,176	72,651,099	86,143,946	16,948,650	95,868,950	77,781,167	8,955,639	31,630,606	78,390,628	36,357,034	39,086,191
දළ වෙළඳ ලාභය	**20,547,014**	**19,554,641**	**30,956,181**	**16,889,098**	**16,614,435**	**17,116,491**	**4,126,571**	**7,612,311**	**17,278,069**	**2,629,095**	**7,230,159**	**16,827,132**	**8,591,525**	**11,409,030**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

සටහන -10අ

විකුණුම් පිටුවැය	ඔසුසල වෙළඳාම බොරැල්ල	ඔසුසල වෙළඳාම ඇඹිලිපිටිය	ඔසුසල මහනුවර දුම්රියපළ	ඔසුසල වෙළඳාම ගම්පහ	ඔසුසල වෙළඳාම නාගොඩ	ඔසුසල වෙළඳාම බේරුවල	ඔසුසල වෙළඳාම පිළියන්දල	ඔසුසල වෙළඳාම නින්දවූර්	ඔසුසල වෙළඳාම අක්කරෙයිපත්තුව	ඔසුසල වෙළඳාම මොනරාගල	ඔසුසල වෙළඳාම පේරාදෙණිය	ප්‍රාදේශිය ගබඩාව මහනුවර	සමස්ත ඔසුසල වෙළඳ ක්‍රියාකාරකම්
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ආරම්භක වෙළඳ තොගය	11,622,021	11,055,354	7,364,518	12,588,295	14,043,536	12,728,342	13,054,102	9,749,104	-	-	-	24,014,579	773,931,152
දේශීය මිලදිගැනීම්	13,043,871	13,001,632	9,096,086	17,471,435	10,277,951	13,245,552	13,862,643	3,032,819	4,655,159	7,012,705	6,917,815	-	2,132,303,865
තොග මාරුකිරීම්	27,850,946	24,642,274	34,587,281	37,304,484	24,502,843	18,605,935	17,046,216	9,608,275	9,666,095	25,564,230	20,965,801	99,629,652	1,978,852,611
විකිණීම සඳහා ඇති තොගය	**52,516,838**	**48,699,260**	**51,047,885**	**67,364,215**	**48,824,330**	**44,579,829**	**43,962,962**	**22,390,198**	**14,321,254**	**32,576,936**	**27,883,616**	**123,644,230**	**4,885,087,628**
වර්ෂය අවසානයේ වෙළඳ තොගය	7,502,034	11,842,302	12,401,405	12,605,585	16,255,413	14,577,404	15,116,028	6,432,790	7,856,366	17,830,541	14,547,573	20,482,405	923,792,242
විකුණුම් පිටුවැය හා මාරුකිරීම්	**45,014,804**	**36,856,958**	**38,646,480**	**54,758,630**	**32,568,917**	**30,002,425**	**28,846,934**	**15,957,408**	**6,464,889**	**14,746,395**	**13,336,043**	**103,161,825**	**3,961,295,386**
මුළු වෙළඳාම													
විකුණුම්	52,096,391	45,057,188	49,111,035	66,520,015	40,857,281	38,054,517	35,099,923	19,031,090	8,836,484	20,155,323	16,617,194	145,423,947	4,761,113,560
අඩු කලා- විකුණුම් පිටුවැය	45,014,804	36,856,958	38,646,480	54,758,630	32,568,917	30,002,425	28,846,934	15,957,408	6,464,889	14,746,395	13,336,043	103,161,825	3,961,295,386
දළ වෙළඳ ලාභය	**7,081,588**	**8,200,230**	**10,464,556**	**11,761,385**	**8,288,364**	**8,052,092**	**6,252,989**	**3,073,682**	**2,371,596**	**5,408,928**	**3,281,151**	**42,262,122**	**799,818,174**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

ග්ලූකෝස්. පිවනි සහ බී.බී ක්‍රිම් නිෂ්පාදන පිරිවැය **සටහන 11**

	2018 රු.	2017 රු.
අමුද්‍රව්‍ය ආරම්භක තොගය	671,326	1,086,686
එකතු කළා : අමුද්‍රව්‍ය මිලදි ගැනිම්	25,551,471	24,089,587
අඩු කළා : අමුද්‍රව්‍ය අවසන් තොගය	1,648,357	671,326
පරිභෝජිත අමුද්‍රව්‍ය පිරිවැය	**24,574,440**	**24,504,947**
එකතු කළා : නිෂ්පාදන පිරිවැය - සටහන 11අ	64,440,211	56,877,791
භාණ්ඩ වල නිෂ්පාදන පිරිවැය	**89,014,651**	**81,382,739**

පිවනි වෙළඳාම	2018 රු.	2017 රු.
ආරම්භක තොගය (නිමි භාණ්ඩ)	1,953,393	1,400,474
එකතු කළා භාණ්ඩවල නිෂ්පාදන පිරිවැය	89,014,651	81,382,739
අඩු කළා අවසාන තොගය (නිමි භාණ්ඩ)	1,917,263	1,953,393
විකුණුම් පිරිවැය	**89,050,781**	**80,829,820**
විකුණුම්	102,989,475	115,799,633
අඩුකලා විකුණුම් පිරිවැය	89,050,781	80,829,820
දළ වෙළඳ ලාභය	**13,938,694**	**34,969,814**

සටහන 11අ

නිෂ්පාදන පිරිවැය	2018 රු.	2017 රු.
වැටුප්, වේතන හා දිමනා	23,837,121	20,145,585
අතිකාල දිමනා	2,196,432	1,641,856
නිල ඇදුම්	15,870	121,439
රෝහල් ගාස්තු ප්‍රතිපූරණය	182,808	38,426
අර්ථසාධක	2,834,583	2,354,115
වාර්ෂික ප්‍රසාද දිමනා	417,825	432,000
පැමිණීමේ ප්‍රසාද දිමනා	785,400	768,000
වාර්ෂික ලාභාංශ ප්‍රසාද දිමනා	4,689,249	3,213,199
සේවක සුභසාධන වියදම්	1,362,409	1,378,421
වෛද්‍ය වියදම්	477,531	479,130
විදුලිය	3,584,128	3,437,282
ක්ෂය කිරීම්	10,816,537	8,678,575
අලුත්වැඩියා හා නඩත්තු	911,676	2,151,522
ඇසුරුම් ද්‍රව්‍ය	12,328,641	12,038,242
එකතුව	**64,440,211**	**56,877,791**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

අනෙකුත් මෙහෙයුම් ආදායම් **සටහන 12**

	2018 රු.	2017 රු.
ටෙන්ඩර් හා ආකෘති පත්‍ර විකුණුම්	48,844,896	32,345,910
ගෙවල් කුලි ලැබීම්	444,648	623,070
භාණ්ඩාගාර බිල්පත් පොළිය	5,396,705	5,440,476
අඛලි ද්‍රව්‍ය විකුණුම්	10,155	68,114
අරමුදල් කළමනාකරණ ආදායම	-	1,687,847
විවිධ ආදායම්	4,923,686	4,207,528
නිවාඩු නිකේතනයන්ගේ ආදායම්	824,445	774,500
පෙර සුදුසුකම් ලබා දීමේ ගාස්තු	1,506,000	3,381,750
සාමිපල් පරීක්ෂාකිරීමේ ආදායම්	2,929,849	2,103,193
රක්ෂණ වන්දි ලැබීම්	6,335,373	-
නිෂ්කාශනය නොවූ හා ප්‍රමාදවූ චෙක්පත් මත දඩ ය	1,857,110	2,371,756
එකතුව	**73,072,867**	**53,004,143**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

සටහන 13

පරිපාලන පිරිවැය	රා.ඖ.ස. වෙළඳ කටයුතු			මුළු වෙළඳාම රා.ඖ.ස.	මුළු වෙළඳාම රා.ඖෙ.ග.	මුළු වෙළඳාම 2018	මුළු වෙළඳාම 2017
	ඔසුසල	පිටනි ඒකකය	තොග වෙළඳාම				
සේවක වේතන	රු	රු	රු	රු	රු	රු	රු
වැටුප්, වේතන හා දීමනා	310,490,636	-	194,642,432	505,133,068	247,726,732	752,859,800	625,414,944
අතිකාල දීමනා	30,070,131	-	11,455,885	41,526,015	7,637,256	49,163,272	41,024,445
සේවක පුහුණු වියදම්	-	-	2,991,648	2,991,648	3,807,552	6,799,200	5,891,258
නිල ඇදුම්	2,568,115	-	906,950	3,475,065	1,154,301	4,629,366	4,422,756
රෝහල් ගාස්තු ප්‍රතිපූරණය	3,033,755	-	2,961,127	5,994,883	3,768,708	9,763,590	8,929,532
අර්ථසාධක	36,785,915	-	22,872,962	59,658,877	29,111,042	88,769,919	75,328,265
වාර්ෂික ප්‍රසාද දීමනා	4,652,883	-	3,044,390	7,697,274	3,874,679	11,571,952	11,143,523
මාසික පැමිණීමේ දීමනා	9,670,000	-	4,704,282	14,374,282	5,987,268	20,361,550	19,887,950
ක්‍රීඩා සමාජ	-	-	845,326	845,326	1,075,870	1,921,196	2,309,328
වාර්ෂික ලාභාංශ ප්‍රසාද දීමනා	57,249,026	-	38,471,248	95,720,275	48,963,407	144,683,682	90,231,636
පාරිතෝෂිකය	-	-	17,939,611	17,939,611	22,832,233	40,771,844	32,216,995
ඉඩම්/නිවාස ණය පොළී	3,829,884	47,979	2,892,437	6,770,300	3,681,283	10,451,583	9,160,234
රා.ඖ.නි.ස. සංවත්සර ගෙවීම්	-	-	704,059	704,059	896,075	1,600,134	3,673,496
එකතුව	**458,350,345**	**47,979**	**304,432,359**	**762,830,683**	**380,516,405**	**1,143,347,088**	**929,634,363**
ගමන් වියදම්							
විදේශීය ගමන් වියදම් - අධ්‍යක්ෂ	-	-	-	-	-	-	543,295
විදේශීය ගමන් වියදම් - වෙනත්	-	-	1,098,567	1,098,567	122,063	1,220,630	1,899,162
දේශීය ගමන් වියදම් - වෙනත්	455,406	15,055	4,196,566	4,667,027	466,285	5,133,312	4,439,799
එකතුව	**455,406**	**15,055**	**5,295,133**	**5,765,594**	**588,348**	**6,353,942**	**6,882,256**
සැපයුම් සහ අවශ්‍යතා							
මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය	6,450,712	27,419	15,006,288	21,484,419	5,002,096	26,486,515	20,951,042
අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වියදම්	-	-	41,630	41,630	13,877	55,506	74,510
සංග්‍රහ වියදම් - අනෙකුත්	-	-	637,272	637,272	212,424	849,696	579,805
රථ වාහන අළුත්වැඩියා	-	-	7,600,628	7,600,628	2,533,543	10,134,171	8,920,517
ඉන්ධන වියදම්	-	-	9,083,238	9,083,238	3,027,746	12,110,984	12,133,056
වාහන බලපත්‍ර ගාස්තු	-	-	145,471	145,471	48,490	193,961	433,505
එකතුව	**6,450,712**	**27,419**	**32,514,526**	**38,992,657**	**10,838,175**	**49,830,832**	**43,092,436**
අ ත්වැඩියා සහ නඩත්තු							
ගොඩනැගිලි	2,514,998	-	2,777,566	5,292,563	2,777,566	8,070,129	8,819,802
ලී බඩු, සවිකිරීම් හා උපකරණ	2,990,921	-	2,090,263	5,081,184	2,090,263	7,171,447	5,941,969
පරිගණක	97,143	-	2,291,376	2,388,519	2,291,376	4,679,895	3,316,857
එකතුව	**5,603,061**	**-**	**7,159,205**	**12,762,266**	**7,159,205**	**19,921,471**	**18,078,629**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

සටහන 13

පරිපාලන පිරිවැය	රා.ඖ.ස. වෙළඳ කටයුතු			මුළු වෙළඳාම	මුළු වෙළඳාම	මුළු වෙළඳාම	මුළු වෙළඳාම
	ඔසුසල	පිවනි ඒකකය	තොග වෙළඳාම	රා.ඖ.ස.	රා.බෙ.ග.	2018	2017
	රු	රු	රු	රු	රු	රු	රු
ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගිතා හා වෙනත් සේවා							
කුලි	22,785,810	-	1,809,088	24,594,898	-	24,594,898	22,929,233
කල්බදු කුලි	1,031,662	-	275,050	1,306,712	-	1,306,712	1,312,427
වරිපනම් හා ගාස්තු	812,887	-	566,940	1,379,827	566,940	1,946,767	2,394,997
චතුර බිල්	983,761	114,486	473,538	1,571,785	473,538	2,045,324	2,047,334
විදුලිය	20,689,530	-	13,289,030	33,978,560	13,289,030	47,267,590	47,207,323
තැපැල්, විදුලිපණිවුඩ හා දුරකථන ගාස්	1,893,134	126,202	7,568,748	9,588,084	7,568,748	17,156,832	17,863,753
වෙළඳ දායකත්ව සහ සභරා	372,330	-	125,422	497,752	125,422	623,175	917,966
වෘත්තිය ගාස්තු	-	-	959,013	959,013	959,013	1,918,027	2,134,516
රක්ෂණ	-	-	2,129,519	2,129,519	2,129,519	4,259,037	3,007,925
පුවත්පත් දැන්වීම්	-	-	4,826,611	4,826,611	11,262,092	16,088,703	12,983,430
ආරක්ෂක සේවා	23,435,467	613,985	6,450,893	30,500,345	6,450,893	36,951,238	37,243,532
ක්ෂය කිරීම්	19,545,693	-	23,011,519	42,557,212	23,011,519	65,568,730	53,018,613
පරිගණක මෘදුකාංග ක්‍රමක්ෂය	1,714,117	-	90,530	1,804,647	-	1,804,647	1,804,647
බෙහෙත් බලපත්‍ර ගාස්තු	972,077	-	9,758,204	10,730,281	-	10,730,281	7,750,238
විවිධ වියදම්	141,757	112	212,805	354,674	100,143	454,817	353,105
අධ්‍යක්ෂ ගාස්තු	-	-	285,000	285,000	285,000	570,000	855,000
විගණන ගාස්තු	-	-	1,285,298	1,285,298	1,285,298	2,570,595	2,589,005
ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් ගාස්තු	-	-	2,758,684	2,758,684	6,436,929	9,195,613	8,095,441
සේවක සුභසාධන වියදම්	19,560,048	-	14,700,182	34,260,230	18,709,323	52,969,553	46,852,283
සේවක වෛද්‍ය වියදම්	5,332,337	-	3,479,509	8,811,846	4,428,466	13,240,312	13,167,018
වාජ්පු නිශ්කාෂනය හා ප්‍රවාහන සේවා සැපයීම වෙනුවෙන් වූ රු 40.651.7894/- ක ගෙවීම් රඳවා පොලිය සමඟ අයකර ගැනීමට එරෙහිව අදාල කරුණ වී.වී. කරුණාරත්න සහ සමාගම විසින් බේරුම් කිරීමේ මණ්ඩලයකට යොමු කර ඇත.

30.1.8. රාජ්‍ය ඖෂධ සංස්ථාවට හා තවත් අයට එරෙහිව සඳලේබා අමිල භාෂිනී සේනානායක - 4/2017/Writ

සිතාවක නගරසභාව විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග හා ඒ අනුව ගත් තීරණ අවලංගු කරන ලෙසත් පෙත්සම්කරු සමඟවු සියළුම ලිඛිත හා වාචික එකඟතා හා කොන්ත්‍රාත්තුව නැවත බලගන්වන ලෙසත් පෙත්සම් කරුට නගර සභාව විසින් පවරන ලද භූමියේ භුක්තිය නැවත ලබාදීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා ඉහත පෙත්සම් කරු විසින් රිට් අයදුම් පතක් යොමුකර ඇත.

30.2 රාජ්‍ය ඖෂධ සංස්ථාව පැමිණිලිකරු ලෙස රු. 38,935,941.42 ක අලාභ හා නීතිගාස්තු අයකර ගැනීම සඳහා අවස්ථා හයකදී නීති මඟින් ක්‍රියාකර ඇත.

30.2.1 ඔසුසල මිගමුව - Case No. L 30202

මිගමුව රාජ්‍ය ඔසුසලේ මුදල් භාරකාරුගේ අයතා මුදල් පරීහරණය හේතුවෙන්, රුපියල් 3,863,609.77 ක අලාභයක් මිගමුව ඔසුසලෙන් වාර්තා විය. සංස්ථාව එම මුදල් ලබා ගැනීම සඳහා නිතිමය වශයෙන් කටයුතු කර ඇති අතර මෙම අසම්භාව්‍ය වත්කම මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි පෙන්වා නොමැත.

30.2.2. නෙස්ටර් ෆාමසියුටිකල් සමාගම, ඉන්දියා එරෙහිව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

හරපත් වටිනාකම රු 4.813.512/-ක් ඇ.ඩො. 41.896 ක් අයකර ගැනීම සඳහා රාජ්‍ය ඖෂධ සංස්ථාව, ඉන්දියාවේ නෙස්ටර් ෆාමසියුටිකල් සමාගමට එරෙහිව මෙම නඩුව ගොනුකර ඇත.

30.2.3. යුනිබයෝස් ලැබොරටරිස් සමාගම, ඉන්දියා හා තවත් අයට එරෙහිව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

තත්වයෙන් අසමත් ඖෂධ වටිනාකම සඳහා වූ හරපත් වටිනාකම රු 1.207.885.59 (ඇ.ඩො. 10.604.80) ක් අයකර ගැනීම සඳහා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව ඉන්දියාවේ යුනිබයෝස් ලැබොරටරිස් සමාගමට එරෙහිව මෙම නඩුව ගොනුකර ඇත.

30.2.4 එස්.ඒ.එස් ෆාමසියුටිකල් SAS Pharmaceuticals - Case No. 7078 M

ගෙවීම් පැහැර හැරීම නිසා සංස්ථාව විසින් රු.769,825.00 ක අලාභයක් අයකර ගැනීමට බෙදාහරින්නෙකු වූ එස් ඒ එස් ෆාමසියුටිකල් ආයතනයට එදිරිව මෙම නඩුව පවරා ඇත. දිස්ත්‍රික් උසාවිය මඟින් හා මහාධිකරණය මඟින් සංස්ථාවට වාසිදායක තීන්දු ලබා දුන් අතර එස් ඒ එස් ෆාමසියුටිකල් ආයතනය එම තීන්දු වලට එරෙහිව මෙම නඩුව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත්කර ඇත.

30.2.5 ලොයිඩ් ෆාමසියුටිකල් Lloyed Pharmaceuticals – Case No. 6799 M

ඖෂධ බෙදාහරින්නෙකු වන ලොයිඩ් ෆාමසියුටිකල් ආයතනයෙන් ලැබිය යුතු රු.2,368,958.28 ක් අයකර ගැනීම සඳහා රාජ්‍ය ඖෂධ සංස්ථාව විසින් කලුතර දිස්ත්‍රික් අධිකරණයේ මෙම නඩුව ගොනුකර ඇත.

30.2.6 M/S Anhui Tiankang Medical Products Co. Ltd. එරෙහිව රාජ්‍ය ඖෂධ සංස්ථාව

ඉන්ඩෙන්ටු අංක DHS/SWW/45/341R/07 හා DHS/SU/172/194K/08-09 යටතේ ලැබුණු තත්වයෙන් බාල ඖෂධ වල අලාභය වන ඇ.ඩො. 8412.00 ක් හා ඇ.ඩො. 305,510.30 (රු. 930,670 හා රු. 11,423,342) ක් අයකර ගැනීම වෙනුවෙන් නිකුත්කර තිබූ හරපත් වටිනාකම ගෙවීම පැහැර හැරීම නිසා සංස්ථාව මෙම කරුණ බේරුම් කරණයට යොමුකර ඇත.

30.3 මූල්‍ය බැඳීම්

2018.12.31 දිනට ඖෂධ මිලදි ගැනීම සඳහා විවෘත කර තිබූ ණයවර ලිපි වටිනාකම රු. මිලියන 14,334 ක් විය.

සටහන 31

මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු හා ප්‍රතිපත්ති

රාජ්‍ය ඖෂධ සංස්ථාවේ ප්‍රධාන මූල්‍ය වගකීම් යටතට ණය ගැනීම් සහ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු වටිනාකම් අයත්වේ. මෙම මූල්‍ය වගකීම් වල ප්‍රධාන කාර්යභාරය වනුයේ සංස්ථාවේ මෙහෙයුම් සඳහා මුදල් ප්‍රසම්පාදනය කිරීමයි. මෙහෙයුම් තුලින් ඇතිවූ වෙළඳ හා අනෙකුත් ලැබීම්, සහ මුදල් හා කෙටිකාලීන තැන්පතු සංස්ථාව සතුව පවති. රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව ණය අවදානමට හා ඇවර කිරීමේ අවදානමට මුහුණදෙයි. සංස්ථාවේ ජේෂ්ඨ කළමනාකාරීත්වය මෙම අවදානම් කළමනාකරණය කරයි. සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කර අනුමත කරන ලද අවදානම් කළමනාකරණය කිරීමේ ප්‍රතිපත්ති පහතින් දැක්වේ.

ණය අවදානම

වෙළඳ ණය

පාරිභෝගික ණය අවදානම ඒ ඒ ව්‍යාපාරික ඒකක විසින් කළමනාකරණය කරයි.

	2018	2017
රා.ඖ.ස SPC	රු. 878,860,394	රු 967,042,539
ර.ඖ.ග DHS	රු. 16,998,983,680	රු. 9,267,922,705

සෑම වාර්තා කරන දිනකදීම ප්‍රධාන සේවා දායකයන්ගේ අගය අඩුවීම (impairment) තනි තනිව ගෙන විශ්ලේෂණය කරයි. එයට අමතරව සුළු ලැබිය යුතු දෑ සාමූහික වශයෙන් සලකා අගය අඩුවීම තක්සේරු කරයි. සියලු ගණනය කිරීම් සත්‍ය වශයෙන් දරණ ලද, ඓතිහාසික පිරිවැය මත සිදුකරන අතර බෙදාහරින්නන්, වරලත් ඔසුසල හා බලයලත් වෙළඳුන් ගෙන් සුරක්ෂිත තාවය සඳහා බැංකු ඇපකර ලබාගනී. මෙයට අමතරව ඇපකරයේ වටිනාකමට වැඩි ප්‍රමාණයන් මිලට ගැනීමට අවශ්‍ය සේවාදායකයන් ගෙන් අමතර ගෙවීමක් ලබාගනී.

ඈවර කිරීමේ අවදානම

රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවේ අරමුණ වන්නේ අරමුදල් ගලාඒමේ අඛන්ඩතාව හා අරමුදල් භාවිතා කිරීමේ සුනම්‍යතාව තුලනය කිරීමයි. වට්ටම් රහිතව ගිවිසුම්ගත ගෙවීම් පදනම්ව සංස්ථාවේ මූල්‍ය වගකීම් කල්පිරීමේ සාරාංශය පහත සටහනෙහි දක්වා ඇත.

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර :	**රු.**	**කල්පිරීම**
පොලි සහිත ණය හා අනෙකුත් ගෙවිය යුතුදේ	2,639,032,817	බැංකු අයිරාව ඉල්ලූ විට ගෙවිය යුතුවේ.
වෙළඳ හා අනෙකුත් ණයහිමියෝ	10,396,979,347	සාමාන්‍යයෙන් මාස 3 කි

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර :	**රු.**	**කල්පිරීම**
පොලි සහිත ණය හා අනෙකුත් ගෙවිය යුතුදේ	1,361,443,839	බැංකු අයිරාව ඉල්ලූ විට ගෙවිය යුතුවේ.
වෙළඳ හා අනෙකුත් ණයහිමියෝ	3,996,134,208	සාමාන්‍යයෙන් මාස 3 කි

	2018	**2017**
	රු.	**රු.**
පොලි සහිත ණය හා අනෙකුත් ගෙවිය යුතුදේ	2,639,032,817	1,361,443,839
වෙළඳ හා අනෙකුත් ණයහිමියෝ	10,396,979,347	3,996,134,208
අඩුකලා මුදල් හා කෙටිකාලීන තැන්පතු	(1,021,184,699)	(312,050,520)
ශුද්ධ ණය	**12,014,827,465**	**5,045,527,527**
ස්කන්ධය		
ප්‍රාග්ධනය හා ශුද්ධ ණය	21,715,464,949	11,963,537,834

සම්බන්ධිත පාර්ශව අතර ගනුදෙනු

32.1 රාජ්‍ය හා රාජ්‍ය හිමිකම ඇති ආයතන අතර ගනුදෙනු

සංස්ථාව සිය මෙහෙයුම් වලදි සබැඳි පාර්ශවයන් සමඟ ගනුදෙනු වලට එලඹෙයි. සබැඳි පාර්ශවයනට ශ්‍රී ලංකා රජය (රජය සංස්ථාවේ හිමිකරු වශයෙන්), විවිධ රජයේ දෙපාර්තමේන්තු හා රජය විසින් පාලනය කරනු ලබන ආයතන ඇතුලත්ය. රජය හා රජය විසින් පාලනය කරනු ලබන ආයතන සමඟ සංස්ථාව ගිවිසගෙන ඇති තනිව වැදගත් වන්නා වූ හෝ සමහර ගනුදෙනු සම්බන්ධයෙන් තනි තනිව නොව සාමූහික වශයෙන් වැදගත් වන්නා ගනුදෙනු හා විධිවිධාන පිළිබඳ විස්තර පහත දැක්වෙන පරිදි වේ.

ගනුදෙනු වල ස්වාභාවය	**2018**	**2017**
ගනුදෙනුව	**රු.**	**රු.**
විකුණුම්	38,895,306,533	32,563,691,394
හිඟව ඇති ශේෂවට		
රජයේ බෙහෙත් ගබඩාවෙන් ලැබිය යුතු	16,998,983,680	9,267,922,705
හමුදා වලින් ලැබිය යුතු	212,104,145	349,782,737
රජයේ රෝහල් වලින් ලැබිය යුතු	241,805,728	205,221,465
අනෙකුත් රජයේ ආයතන වලින් ලැබිය යුතු	30,414,261	26,758,075

30.2 ප්‍රධාන කළමනාකාරිත්වය සමඟ ගනුදෙනු

ප්‍රධාන කළමනාකාරිත්වයට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යතුමා හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුලත් වේ.

	2018	**2017**
	රු.	**රු.**
කෙටිකාලීන සේවක ප්‍රතිලාභ	4,706,000	4,738,343

සටහන 33

ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂපත්‍ර දිනට පසු සිදුවූ සියළුම වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශනයෙහි අවශ්‍ය අවස්ථාවන්හිදී යෝග්‍ය වෙනස්කම් සිදුකර ඇති අතර, අවශ්‍ය තැන්හිදී මූල්‍ය ප්‍රකාශයට අනාවරණයන් සිදුකර ඇත.

SLFRS 9 ට අනුකූලවීමේදී ඇතිවූ බලපෑම හා ගිණුම්කරණ ඇස්තමේන්තු හා තීරණයන් ගේ වෙනස් කිරීම් වල බලපෑම

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරණ ප්‍රමිත අංක 9 මුල්වරට යොදාගැනිම නිසා මූල්‍ය සාධන පත්‍ර වර්ගීකරණය, ඇගයීම හා ඉදිරිපත් කිරිමේ වෙනස්කම් ඇතිවිය. 2018 ජනවරි 1 වන දිනට මූල්‍ය වත්කම් හානිකරණය (impairment) නිසා ඇතිවූ වටිනාකමේ වෙනස්වීම රු. 89.624.714 කි. තවදුරටත් පෙර වසර වල භාවිතා කළ ඇස්තමේන්තු හා තීරණයන් ගේ වෙනස් කිරීම් නිසා ඇතිවූ අගය අඩුවීම රු. 1.107.619.070 කි. එයින් ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනයට ඇතිවූ ශුද්ධ බලපෑම රු. 1.017.994.355 කි.

SLFRS 9 මුල්වරට යොදාගැනීම නිසා ඇතිවූ බලපෑම

මූල්‍ය උපකරණ අගය කිරීම හා වර්ගීකරණය

2018 ජනවාරි 1 වන දිනට මූල්‍ය වත්කම් හා වගකිම් වල මිනුම් කාණ්ඩය හා පොත් අගය LKAS 39 හා SLFRS 9 ට අනුව සැසඳිමක් පහතින් දැක්වේ.

	LKAS 39		SLFRS 9	
මූල්‍ය වත්කම්	මිනුම් කාණ්ඩය	පොත් අගය (රු.)	මිනුම් කාණ්ඩය	පොත් අගය (රු.)
අතැති මුදල් හා බැංකු මුදල්	ක්‍රමක්ෂේපිත පිරිවැයට (ණය හා ලැබිය යුතු)	252,005,797	ක්‍රමක්ෂේපිත පිරිවැයට	252,005,797
සේවක ණය	ක්‍රමක්ෂේපිත පිරිවැයට (ණය හා ලැබිය යුතු)	78,238,674	ක්‍රමක්ෂේපිත පිරිවැයට	78,238,674
වෙළඳ ණය	ක්‍රමක්ෂේපිත පිරිවැයට (ණය හා ලැබිය යුතු)	8,867,573,316	ක්‍රමක්ෂේපිත පිරිවැයට	8,777,948,602
කෙටිකාලීන භාණ්ඩාගාර බිල්	ක්‍රමක්ෂේපිත පිරිවැයට (කල්පිරෙන තුරු රඳවාගත්)	60,044,705	ක්‍රමක්ෂේපිත පිරිවැයට	60,044,705

මූල්‍ය වගකිම් අගය කිරීම හා වර්ගීකරණයෙහි වෙනසක් වී නොමැති අතර අගය කිරීම හා වර්ගීකරණය ලාභාලාභ ගිණුම හරහා සාධාරණ අගයට (FVPL) ගනන් ගැනෙන මූල්‍ය වගකිම් සංස්ථාව සතුව නොමැත.

LKAS 39 සිට SLFRS 9 තෙක් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ශේෂ සංසන්දනය

සංස්ථාව විසින් මූල්‍ය වත්කම් හා කළමනාකරණය කරනු ලබන ව්‍යාපාරික ආකෘතිය හා ඒවායින් මුදල් ගලාඒමේ ලක්ෂණ පිළිබඳව විස්තරාත්මක විශ්ලේෂණයක් සිදුකරණ ලදි.

පෙර අගයකල ක්‍රමය වන LKAS 39 සිට 2018 ජනවාරි 1 වන දින සිට ඒවායේ නව අගය කිරීමේ ක්‍රමවේදය වන SLFRS 9 දක්වා මූල්‍ය වත්කම් වල පොත් අගයන් පහත දත්ත සටහනේ සංසන්දනය කර දක්වා ඇත.

	2017 දෙසැම්බර් 31 දිනට LKAS 39 ට අනුව පොත් අගය (රු.)	නැවත වර්ගීකරණය (රු.)	නැවත අගයකිරීම (රු.)	2018 ජනවාරි 1වන දිනට SLFRS 9 ට අනුව පොත් අගය (රු.)
ක්‍රමක්ෂේපිත පිරිවැය				
අතැති මුදල් හා බැංකු මුදල්	252,005,797	-	-	252,005,797
සේවක ණය	78,238,674	-	-	78,238,674
වෙළඳ ණය	8,867,573,316	-	(89,624,714)	8,777,948,602
කෙටිකාලීන භාණ්ඩාගාර බිල්	60,044,705	-	-	60,044,705
	9,257,862,492	-	(89,624,714)	9,168,237,778

LKAS 39 සිට SLFRS 9 මූල්‍ය වත්කම් හානිකරණ වටිනාකමේ (impairment allowance) ශේෂ සංසන්දනය

LKAS 39 සිදුවූ පාඩු ආකෘතිය (incurred loss model) අනුව පෙර වසර අවසානය තෙක් ගණනය කරන ලද අගය අඩුවීමේ වටිනාකම හා 2018 ජනවාරි 1 වන දිනට SLFRS 9 අපේක්ෂිත පාඩුක්‍රමයට (expected loss model) අනුව නව අගය අඩුවීමේ වටිනාකම පහත දත්ත සටහනේ සංසන්දනය කර දක්වා ඇත.

මිනුම් වර්ගය	LKAS 39 ට අනුව	නැවත වර්ගීකරණය	නැවත අගයකිරීම	SLFRS 9ට අනුව
වෙළඳ ණය	1,367,391,928	-	89,624,714	1,457,016,642
	1,367,391,928		89,624,714	1,457,016,642

ගිණුම්කරණ ඇස්තමේන්තු හා තීරණයන් වෙනස් කිරීමේ බලපෑම

සංස්ථාවේ ගිණුම්කරණ ඇස්තමේන්තු හා තීරණයන් වෙනස් කිරීම නිසා ඇතිවන බලපෑම පිළිබඳ දළ විශ්ලේෂණයක් මෙම සටහන මඟින් ලබාදෙයි. වෛද්‍ය සැපයුම් අංශයේ වසර 5 කට වඩා පැරණී ශේෂ සම්බන්ධයෙන් සම්පූර්ණ වෙන්කිරීමක් සිදුකිරීම සංස්ථාවේ ගිණුම් ප්‍රතිපත්තිය වේ. කෙසේ වුවත් මැතදී අනුමත කිරීම් සම්බන්ධ තොරතුරුවලට අනුව ඉහත ණයගැති ශේෂය සම්බන්ධ තීරණය වෙනස් කර ඇත. ඒ අනුව ණයගැතියාගේ අගය අඩුවීම ගණනය කිරීම සඳහා තථ්‍ය පාඩු පැහැරහැරීම් අනුපාතය (actual loss given default (LGD) rates) භාවිතා කිරීමට සංස්ථාව තීරණය කරනලදී. මූල්‍ය ප්‍රකාශන සඳහා එම තීරණයෙන් ඇතිවන බලපෑම රු. 1.107.619.070ක් විය.

එව්එස්එම්/ඒ/එස්පීසී/1/18/30 2019 මැයි 29

සභාපති

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිතිවල සඳහන් නියමයන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කර නොතිබුණි.

(අ) ශ්‍රී ලංකා මූල්‍යවාර්තාකරණ ප්‍රමිත (SLFRS) 13

ප්‍රමිතයේ 91 ඡේදය ප්‍රකාරව,වත්කම් හා වගකීම්වල සාධාරණ අගය පුනරාවර්තන හෝ පුනරාවර්තන නොවන පදනම මත මැනීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තිය සංස්ථාව විසින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1

ප්‍රමිතයේ 32 ඡේදය ප්‍රකාරව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර වත්කම් හා වගකීම් නිලව් නොකළ යුතුවේ. එසේ වුවද 2018 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ගිණුම්වල පැවති රු.2,590,505 ක බැර ශේෂ එදිනට රු.878,860,394 ක් වූ හර ශේෂවලට එරෙහිවද, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල් නමින් වූ මාර්ගස්ථ තොග ගිණුමේ පැවති රු.2,703,133 ක බැර ශේෂ එදිනට රු.253,016,979 ක්වූ හර ශේෂවලට එරෙහිවද, ගෙවිය යුතු නියෝජිත කොමිස් ගිණුමේ පැවති රු.6,610,270 ක හර ශේෂ එදිනට රු.60,011,028 ක්වූ බැර ශේෂවලට එරෙහිවද හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. වෙළඳ ණයගැති ගිණුමේ හා මාර්ගස්ථ තොග ගිණුමේ බැර ශේෂයන් හා නියෝජිත කොමිස් ගිණුමේ හර ශේෂය පිළිබඳව සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8
ප්‍රමිතයේ 30 සහ 31 ඡේද ප්‍රකාරව, නිකුත්කර ඇති එහෙත් තවමත් බලාත්මක නොවන ශ්‍රීලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියක් (SLFRS) අස්ථිත්වයක් විසින් ව්‍යවහාරකර නොමැති විටෙක, ආයතනය විසින් එම කරුණු සහ ආරම්භක ව්‍යවහාරය කරනු ලබන කාලපරිච්ඡේදය තුළ අස්ථිත්වයේ මූල්‍ය ප්‍රකාශන වලට අළුත් SLFRS ව්‍යවහාර කිරීමෙන් ඇතිවිය හැකි බලපෑම තක්සේරු කිරීමට අදාළ, දන්නා හෝ ඇස්තමේන්තු කළ හැකි තොරතුරු හෙළිදරව් කළ යුතු වුවද, සංස්ථාව විසින් එලෙස වාර්තා කරන දිනට නිකුත්කර ඇති එහෙත් බලාත්මක නොවන නව හෝ සංශෝධිත ප්‍රමිති (උදාහරණ SLFRS 16 - කල්බදු) සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10
ප්‍රමිතයේ 17ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධිකාරිය ලද දිනය හා නිකුත් කිරීමෙන් පසු මූල්‍ය ප්‍රකාශන සංශෝධනය කිරීමට ඇති බලය පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12
ප්‍රමිතයේ 81(උ) ඡේදය ප්‍රකාරව, සෑම වර්ගයකම තාවකාලික වෙනස්කමක් සඳහා සහ සෑම වර්ගයකම ප්‍රයෝජනයට නොගත් බදු අලාභ හා ප්‍රයෝජනයට නොගත් බදු බැර සඳහා සෑම කාලපරිච්ඡේදයකදීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ බදු වගකීම්වල විස්තරාත්මක හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16
ප්‍රමිතයේ 51 සහ 55 ඡේද ප්‍රකාරව, වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිතකාලය අඩු තරමින් සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂිත තත්ත්වයන් ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම් ගත කළ යුතු අතර වත්කමක් ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සුදානම් තත්ත්වයට ගෙන ආ පසුව වේ. එසේ වුවද සංස්ථාව විසින් ක්ෂය සඳහා අනුගමනය කර තිබුණු ගිණුම්කරණ ප්‍රතිපත්තිය අදාළ ප්‍රමිතියේ ප්‍රතිපාදනවලට අනුගත නොවූ අසම්පූර්ණ එකක් වූ අතර වත්කම් ක්ෂය වීම ආරම්භවන අවස්ථාව පිළිබඳ හෙළිදරව් කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2018 දෙසැම්බර් 31 දින වන විට හරපත් නිකුත් කර වෛද්‍ය සැපයුම් අංශය වෙත භාරදී තිබුණු ඖෂධ තොගයක පිරිවැය රු.4,080,000 ක් ගෙවිය යුතු බැංකු බිල්පත් ගිණුමට හර කරමින් මාර්ගස්ථ තොග ගිණුමට බැර කර නොතිබීම හේතුවෙන් ඊට සමාන අගයකින් මාර්ගස්ථ තොග ගිණුම හා ගෙවිය යුතු බැංකු බිල්පත් ගිණුම වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායමරු.222,180 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ නැවත ආයෝජනය කරන ලද භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම රු.300,377ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2018 දෙසැම්බර් 31 දිනට ඇසුරුම් ද්‍රව්‍ය ඉතිරි තොගය රු.299,642 කින් අඩුවෙන් අගයකර ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රු.531,025 ක ගොඩනැගිලි කුලී ආදායම විකුණුම් ආදායමක් ලෙස සලකා ගිණුම් ගත කර තිබුණි.

1.2.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

(අ) 2018 දෙසැම්බර් 31 දිනට වෙළඳණයහිමියන් 247 කට අදාළ රු.2,983,839,668 ක්වූ මුළු ශේෂයෙන් සියයට 64.18ක්වූ වෙළඳණයහිමියන් 176කට අදාළ රු.1,915,058,173 ක ශේෂ තහවුරු කර ගැනීම සඳහා ශේෂ සනාථන විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 ප්‍රකාරව, සංස්ථාවේ ණයගැතියන් හා වෛද්‍ය සැපයීම් අංශය වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට සිදුකර තිබුණු අඩමාණ ණය ප්‍රතිපාදනය පිළිවෙලින් රු.55,538,918 ක් හා රු.2,419,472,081ක් සඳහා උපලේඛන හෝ ගණනය කළ පදනම විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.2.4 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනය අනුව, සමස්ත ණයගැතියන්ගෙන් සියයට 95.08 ක් හෙවත් රු.16,998,983,680ක් වෛද්‍ය සැපයීම් අංශයෙන් ලැබිය යුතුව තිබුණු නමුත් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම අනුව එම ශේෂය රු.16,787,391,787ක් විය.ශේෂ සැසඳුම් ප්‍රකාශ පිළියෙල කරමින් රු.211,591,893ක්වූ වෙනසට හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

1.2.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

(අ) වෛද්‍ය සැපයීම් අංශයෙන් ලැබිය යුතු රු.16,998,983,680 ක ශේෂයෙන් රු.211,591,893ක්වර්ෂ 9 ත් වර්ෂ 20 ත් අතර කාලයක් පැරණි ණය ශේෂ විය.

(ආ) සංස්ථාවේ ප්‍රතිපත්තිය අනුව,විකුණු දින සිට දින 30 ත් දින 45 ත් අතර කාලය තුළදී වෙළඳ ණයගැතියන්ගේ ණය අයකරගත යුතු වුවද, 2018 දෙසැම්බර් 31 දිනට වූ රු.878,860,394ක ණය ශේෂයෙන් පුද්ගලික, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලින් රු.12,408,417ක් වර්ෂ 5කට වැඩි කාලයක සිටද,ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙන් රු.14,621,371ක් වර්ෂයකට වැඩි කාලයක සිටද අයකර ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි. ඉන් රු.3,138,783 ක ණය ශේෂපමණක් අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන තිබුණි.

(ඇ) 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රක්ෂණ වන්දි රු.2,279,937ක්වූ අතර ඉන් රු.525,006 ක් වර්ෂ 2 ත් වර්ෂ 9ත් අතර කාලයක සිට අයකර ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි.

(ඈ) 2018 දෙසැම්බර් 31 දිනට බහාලුම් තැන්පතු ගිණුමේ ශේෂය රු.11,848,455ක්වූ අතර ඉන් රු.6,219,806ක් වර්ෂ 2 ත් වර්ෂ 11 ත් අතර කාලයක සිට ආපසු අයකර ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි.

(ඉ) පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2014 වර්ෂයේදී නිකුත්කර තිබුණුරු.150,000 ක අත්තිකාරම්, 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ සැපයුම්කරුවන්ට නිකුත්කර තිබුණු රු.1,237,753ක අත්තිකාරම්හා සමාලෝචිත වර්ෂය තුළදී ආයතන 02ක් වෙත නිකුත්කර තිබුණු රු.118,550 ක අත්තිකාරම් 2019 මැයි 07 දින වන විටත් පියවා නොතිබුණි.

(ඊ) 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බැංකු බිල්පත් ගිණුමේ ශේෂය රු.6,995,499,499ක් විය.ඉන් රු.1,195,759ක් වර්ෂ 4 කට වඩා වැඩි කාලයක්ද, රු.27,673,516ක් වර්ෂ 3 කට වඩා වැඩිකාලයක්ද, රු.76,784,033 ක් වර්ෂ 2 කට වඩා වැඩි කාලයක්ද පැරණි සැපයුම්කරුවන්ට නොගෙවූ සියයට සියයක ණයවර ලිපි වටිනාකම හා රැඳවුම් මුදල් වලින් සමන්විත වී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව,සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවටවන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- මෙම වාර්තාවේ 1.2.4 ඡේදයේ දැක්වෙන නිරීක්ෂණය හැර,2018 අංක 19 දරන ජාතික විගණන පනතේ6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ,පහත සඳහන් නිරීක්ෂණ හැර ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති හා රෙගුලාසිවලට යොමුව		විස්තරය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසිසංග්‍රහය	
(i)	මුදල් රෙගුලාසි 103, 104 හා 105	(i) ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී කල් ඉකුත් වූ වෛද්‍ය සැපයුම්වල මුළු පිරිවැය රු.123,610,942 ක් වූ අතර මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කිරීමට හා අදාළ පරිදි අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාව සතු වාහන 09 කට අදාළව අවස්ථා 12 කදී සිදුවූ අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රාරම්භක පරීක්ෂණ හා පූර්ණ පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කිරීමටද එම පරීක්ෂණ වාර්තා අදාළ පාර්ශව වෙත ඉදිරිපත් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ii)	මුදල් රෙගුලාසි 571(2)	2018 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.8,512,448ක් වූ ඉකුත් තැන්පතු නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.
(iii)	මුදල් රෙගුලාසි757(2)(අ)	2018 දෙසැම්බර් 31 දිනට සිදුකළ යුතු භාණ්ඩ සමීක්ෂණවල වාර්තා 2019 මැයි 10 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් නොකෙරුණි.
(iv)	මුදල් රෙගුලාසි770 (2)	2017 දෙසැම්බර් 31 දිනට සිදුකර තිබුණු භාණ්ඩ සමීක්ෂණවල වාර්තා අනුව පිරිවැය රු.1,718,850 ක්වූ ඉන්වෙන්ට්‍රි අයිතම 54ක් හානිවී තිබුණද, මුදල් රෙගුලාසිය ප්‍රකාරව සමීක්ෂණ මණ්ඩලයක් පත්කර පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ හඳුනාගෙන විකිණීමට හෝ විනාශ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.
(ආ)	2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	ධාවනය කළ නොහැකි මට්ටමේ පවතින සංස්ථාව සතු වාහන 04ක වටිනාකම තක්සේරුකර අපහරණය කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

  ලෝක සෞඛ්‍ය සංවිධානයේ 143 වන විධායක මණ්ඩලයේ නියෝජ්‍ය සභාපති ධුරය ලැබීම වෙනුවෙන් ගරු සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙත උපහාර පිරිනැමීම සඳහා පවත්වා තිබුණු උත්සවයක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,000,000 ක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

  (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගෙන් බැහැරවීම්

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව,සංස්ථාවේ අලෙවිය සඳහා මිලදී ගන්නා වෛද්‍ය සැපයුම් සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කරමින් රු.1,530,229 ක් වැය කර කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව, කල් වේලා ඇතිව තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් දැනුවත්කර නොතිබීම, සියලුම ලංසු කැඳවීමේ ලේඛන තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පරීක්ෂා කොට අනුමත කර නොතිබීම, අවශ්‍ය විධිමත් අනුමැතීන් ලබාගැනීමට ප්‍රමාණවත් කාලයක් සැලසෙන පරිදි ලංසු ඇගයීම සිදුකර නොතිබීම හා ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කර නොතිබීම වැනි අඩුපාඩු නිරීක්ෂණය විය.

සැපයීම ප්‍රමාදවූ එක් ඇණවුමකට අදාළව ප්‍රමාද ගාස්තු අයකිරීම සඳහා වන කොන්දේසි ලංසු ලියවිලිවල නිශ්චිතව සඳහන් කර නොතිබීම හේතුවෙන්දින 124 ක ප්‍රමාද කාලය සඳහා ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළදීරු.57,675,670 ක් වැය කර Rituximab Injection ඖෂධයෙන් 100mg in 10ml vials 720ක් හා 500mg in 50ml vials 920ක් සීමිත තරහකාරී ක්‍රමයට ජාත්‍යන්තර වෙළඳපලින් මිලදී ගෙන තිබුණි.ලංසුකරුවන් පෙර සැපයුම්කරුවකු නොවීම හේතු කොට ගෙන ඔවුන්ගේ ලංසු ප්‍රතික්ෂේප කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුවකට බලය නොමැති නමුත්, එම හේතුව මත අවම ලංසුව ප්‍රතික්ෂේප කර තිබුණි.
දෙවන හා තුන්වන අවම ලංසු ඉදිරිපත් කළ ලංසුකරුවන් වෙත මුළු ඇණවුමෙන් සියයට 50 බැගින් ප්‍රදානය කිරීමට ලබාදී තිබුණු තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය සඳහා ප්‍රසම්පාදන කමිටුව අනුමැතිය ලබාදී තිබුණු නමුත් තුන්වන අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරුද පෙර සැපයුම්කරුවකු නොවීය. අවම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය නොකිරීම හේතුවෙන් සංස්ථාවට දැරීමට සිදුවූ අතිරේක පිරිවැය රු.5,421,827 ක් විය.

(iv) Rituximab Injection ඖෂධයෙන් 100mg in 10ml vials 540 ක් සහ 500mg in 50ml vials 690 ක් රු.67,768,500 ක් වැය කර දේශීය වෙළඳපලින් මිලදී ගෙන තිබුණු අතර ඖෂධ ආනයන මිලට වඩා වැඩි මිලක් ගෙවා තිබීම හේතුවෙන් වැය කර තිබුණු අතිරේක පිරිවැය රු.21,606,922 ක් විය. අදාළ සැපයුම්කරුගෙන් කාර්යය සාධන සුරක්ෂණයක් ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි.
තාක්ෂණික ඇගයීම් කමිටුවට විශේෂඥ වෛද්‍යවරු දෙදෙනෙකු පත්කළ යුතු වුවද එක් විශේෂඥ වෛද්‍යවරයෙකු පමණක් පත්කරතිබුණි.ලංසුකරුවන් පෙර සැපයුම්කරුවකු නොවීම හේතු කොට ගෙන ඔවුන්ගේ ලංසු ප්‍රතික්ෂේප කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුවකට බලය නොමැති නමුත්, එම හේතුව මත අවම ලංසුව හා දෙවන අවම ලංසුව ප්‍රතික්ෂේප කර තිබුණි.
හතරවන අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරු වෙත ඇණවුම ප්‍රදානය කර තිබීම හේතුවෙන් වැය කර තිබුණු අතිරේක පිරිවැය රු.44,545,500ක් විය.

(v) සමාලෝචිත වර්ෂය තුළදී රු.10,904,714 ක් වැයකර සීමිත ජාත්‍යන්තර තරඟකාරී ක්‍රමයට Blood Glucose Testing Strips with Blood Lancet ඒකක 1,102,600ක් හා Blood Glucose Testing Meters ඒකක 974 ක් මිලදී ගෙන තිබුණි.

ප්‍රසම්පාදන කාලසටහනින් බැහැරව පිළිවෙලින් අමතර සති 14 ක් හා සති 12 ක් බැගින් තාක්ෂණික ඇගයීමට හා ප්‍රසම්පාදන කටයුතු සඳහා ගත කර මාස 06ක කාල ප්‍රමාදයක් සහිතව ඇණවුම වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණි.

එම ප්‍රමාද වීම හේතුකොට ගෙන Blood Glucose Testing Strips with Blood Lancet ඒකක 2,878,150 ක් රු.47,259,233 ක් වැයකර සෘජු කොන්ත්‍රාත් ක්‍රමයට ප්‍රධාන ඇණවුම මිලදී ගත් සැපයුම්කරුගෙන්ම මිලදී ගෙන තිබුණි.

එමදෙවන ප්‍රසම්පාදනයට අදාළ ප්‍රසම්පාදන කමිටු නිර්දේශය 2018 ජූලි 17 දින ලබා දී තිබුණු නමුත් එදිනට පෙර දිනය වූ 2018 ජූලි 16 දින ගැණුම් ඇණවුම නිකුත් කර තිබුණි.

එම දෙවන ඇණවුම තවත් ඒකක 1,439,075 කින් වැඩිකිරීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව 2018 අගෝස්තු 08 දින නිර්දේශ කර තිබුණු නමුත් ඊට දින දෙකකට පෙර ඒ සඳහා මිලදී ගැනීමේ ඇණවුම නිකුත් කර තිබුණු අතර භාණ්ඩ 2018 අගෝස්තු 07 දින වන විටත් වෛද්‍ය සැපයීම් අංශය වෙත භාරදී තිබුණි.

ප්‍රධාන ඇණවුම මගින් Blood Glucose Testing Strips with Blood Lancet ඒකකයක් රු.9.89 කට මිලදී ගෙන තිබුණු නමුත් දෙවන ඇණවුම මගින් සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ඒකකයක් රු.16.42ක බැගින් ඒකක 4,317,225 ක් මිලදී ගැනීම නිසා සිදුවී තිබුණු පාඩුව රු.28,191,479 ක් විය.

සැපයුම්කරුගෙන් කාර්යය සාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණු අතර ගිවිසුමකට එළඹීමටද කටයුතු කර නොතිබුණි.

(vi) Sterile Single Use Plastic Syringes Size 50 ml ශල්‍ය උපකරණ අයිතමයෙන් ඒකක 240,000 ක් රු.10,045,000 ක් වැය කර මිලදී ගෙන තිබුණි.අදාළ සැපයුම්කරු විසින් එකඟවී තිබුණු පරිදි නියමිත ලේබල්කරණය සිදුකර නොතිබීම හේතුවෙන් වෛද්‍ය සැපයීම් අංශය විසින් මෙම උපකරණ ඒකක 240,000 ප්‍රතික්ෂේප කර තිබුණු අතර එම උපකරණ තොගය රඳවා තබා ගැනීමට හා බහාලුම් ප්‍රමාද ගාස්තු ලෙස රු.1,597,563 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. ඉන් රු.712,759 ක් පමණක් සැපයුම්කරුගෙන් අයකර තිබුණු නමුත් සංස්ථා සේවකයින්ගේ වගකීම වෙනුවෙන් අයකර ගත යුතු රු.884,804 ක් සංස්ථා කාර්යමණ්ඩලයෙන් අයකර ගෙන නොතිබුණි.

(vii) වෛද්‍ය සැපයීම් අංශය සඳහා සංස්ථාව විසින් සිදුකරනු ලබන ප්‍රධාන සැපයීම් ප්‍රමාදවන අවස්ථාවලදී හා රෝගීයාගේ නමින් ඖෂධ ඉල්ලුම් කරනු ලබන අවස්ථාවලදී ඖෂධ ඇතුළු වෛද්‍ය සැපයීම් වර්ග දේශීය වෙළඳපලින් මිලදී ගෙන තිබුණද, මිලදීගැනීම් ක්‍රියාපරිපාටි හා පිළිවෙත් නිශ්චයකර ඒ සඳහා වන ලිඛිත උපදෙස් හෝ මාර්ගෝපදේශ පිළියෙල කර නොතිබුණි.

සංස්ථාව විසින් වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයන වෛද්‍ය සැපයීම් වෙනුවෙන් එම අංශය වෙතින් මුදල් ලැබුණු පසු සැපයුම්කරුවන් වෙත ගෙවීම් කළ යුතු බවට වූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය දැක්වෙන කොන්දේසියක් ලංසු ලේඛනවල ඇතුළත් කර නොතිබුණි.

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශයෙහි සඳහන් මූල්‍ය සීමාවන් ඉක්මවා ප්‍රසම්පාදනයන් පිරිනමා තිබුණු අතර,සභාපති විසින් පත්කළ යුතු තාක්ෂණික ඇගයීම් කමිටු කළමණාකාර අධ්‍යක්ෂ විසින්පත්කර තිබුණි.

ලංසු සමඟ සාම්පල් ඉදිරිපත් කළ යුතු බව ලංසු ලේඛනවල සඳහන් කර තිබුණු නමුත් ඇගයීම් අවස්ථාවන්හිදී එම අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන නොතිබුණු අතර සැපයුම්කරුවන් සමඟ කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

(i) කොන්ත්‍රාත් වටිනාකම රු.106,305,300 ක්වූ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණු කොන්ත්‍රාත්කරු වෙත 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළදී ගෙවා තිබුණු රු.88,926,577ක් තුළ නිසි අනුමැතියකින් තොරව ඉටුකළ අතිරේක වැඩ සඳහා ගෙවන ලද රු.6,824,841ක්ද විය.

කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව 2019 මැයි 10 දින වන විටත් ඉදිකිරීම් නිමකරවා ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණු අතර එදින වන විට වර්ෂ 04ඉක්මවා තිබුණු ප්‍රමාද කාලය සඳහා ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.

කාර්යසාධන සුරක්ෂණය 2016 පෙබරවාරි 24 දින කල් ඉකුත්වී තිබුණු නමුත් 2019 මාර්තු 18 දින වන විටත් එහි වලංගු කාලය දිර්ඝ කරවා ගෙන නොතිබුණි.

පිරිවැය රු.4,010,742 ක්වූ අවශ්‍ය පිරිවිතරයන්ට අනුකූල නොවන හා තත්ත්වය අසමත් වූ පරීක්ෂණ සහතික සහිත විදුලි සෝපානයක් සවිකර තිබුණි.

සවිකර තිබුණු වායුසමීකරණ යන්ත්‍ර 24ක් වෙනුවෙන් රු.5,732,000 ක් 2016 වර්ෂයේදී ගෙවා තිබුණු නමුත් ඒවායේ වගකීම් කාලය ඉකුත් වන තෙක්ම පාවිච්චි කර නොතිබුණි.

විදුලිය බෙදාහැරීමේ පුවරු 07ක් සවිකිරීමේ කටයුතු 2019 මාර්තු 18 දින වන විටත් නිමකර නොතිබුණු නමුත් 2016 වර්ෂයේදී ඒ සඳහා රු.284,900ක් ගෙවා තිබුණි.

(ii) කොන්ත්‍රාත් වටිනාකම රු.49,355,000ක් වූ ව්‍යාවසාය සම්පත් සැලසුම් පද්ධතිය (Enterprise Resource Plan)ගොඩනැගීම සඳහා 2016 දෙසැම්බර් 19 දින අත්සන් කර තිබුණු ගිවිසුම ප්‍රකාරව, එදින සිට සති 61ක් ඇතුළත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර අවසන් කළ යුතු වුවද, 2019 මාර්තු 25 දින වන විටත් එය අවසන් කර නොතිබුණු අතර ප්‍රමාද කාලය සති 55 ක් විය.පිළිගත හැකි අත්තිකාරම් ගෙවීම් සුරක්ෂණයක් ලබා නොගෙන කොන්ත්‍රාත්කරු වෙත 2018 මාර්තු 12 දිනරු.4,935,500ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) කළමනාකරණ ක්‍රියාකාරකම්

(i) සංස්ථාව පිහිටුවීමට අදාළ 1971 සැප්තැම්බර් 22 දිනැති අංක 14,976/8 දරන ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර තිබුණු, සියුම් රසායන ද්‍රව්‍ය නිපදවන කර්මාන්ත පිහිටුවීම හා ඒවාට අනුග්‍රහ දැක්වීම සහ ඖෂධ අලෙවිය පිළිබඳ ලංකාවෙත් විදේශ රටවලත් පර්යේෂණ කටයුතු ඇරඹීම යන ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට හැකි වන පරිදි 2016 - 2018 වර්ෂ සඳහා වූ සංයුක්ත සැලැස්ම හා 2018 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ii) සංස්ථාව විසින් 2016 - 2018 කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම්වල කාර්යසාධන නිර්ණායක නිශ්චිතව, ප්‍රමාණාත්මකව මෙන්ම මැනිය හැකි මට්ටමින් දක්වා නොතිබීම හේතුවෙන් 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 06ක් ඉටුකර ගැනීමේ ප්‍රගතිය නිශ්චිතව ඇගයීමට නොහැකිවිය.

(iii) 2016 - 2018 කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්ම තුළ ඇතුළත් 2016 සහ 2017 වර්ෂවලදී සපුරාගත නොහැකිවූ ක්‍රියාකාරකම් 06 ක් 2018 වර්ෂය සඳහාවූ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. 2015 වර්ෂයේ සිට ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු ව්‍යාපාර සම්පත් සැලසුම්කරණ පද්ධතිය හා එය බාහිර පද්ධති සමග සම්බන්ධීකරණය කිරීම, ව්‍යාපාර තිර සැලැස්ම වැඩිදියුණු කිරීම, බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම, කළමණාකරණ තනතුරු සඳහා අනුප්‍රාප්තික සැලැස්ම පිළියෙල කිරීම හා ශ්‍රේණිගත උසස්වීම් ලබාදීමට කටයුතු කිරීම යන ක්‍රියාකාරකම් ඉටුකරගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි.

(ආ) මෙහෙයුම් ක්‍රියාකාරකම්

(i) සංස්ථාවේ අලෙවිය සඳහා මිලදී ගෙන තිබුණු නමුත් ඉකුත් වර්ෂයේදී තත්ත්වයෙන් අසමත් හා කල් ඉකුත්වූ ඖෂධවල මුළු පිරිවැය පිළිවෙලින් රු.23,561,218 ක් හා රු.80,834,686 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී තත්ත්වයෙන් අසමත් හා කල් ඉකුත්වූ ඖෂධවල පිරිවැය පිළිවෙලින් රු.13,979,105 ක් හා රු.42,776,256 ක් විය.

(ii) වෛද්‍ය සැපයුම් අංශයට තත්ත්වයෙන් අසමත් හා හානි වූ ඖෂධ සපයා තිබීම සහ ඖෂධ අඩුවෙන් සපයා තිබීම වෙනුවෙන් දරන ලද පිරිවැය, පරිපාලන ගාස්තු හා එම තොග විනාශ කිරීමේ වියදම් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීම සඳහා 2018 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කර තිබුණු හරපත්වල වටිනාකම රු.1,754,661,431ක්වූ නමුත් ඉන් රු.811,195,059 ක් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි. ඒ තුළ වූ රු.47,106,121 ක් අසාධ්‍ය ලේඛනගත සැපයුම්කරුවන්ගෙන් හා රු.283,811,421 ක් ගෙවීම් පැහැරහැර ඇති සැපයුම්කරුවන්ගෙන් අයකර ගත යුතු බැවින් එම අයකිරීම් අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාකාරීව පැවති ඔසුසල් 40 න් ඔසුසල් 24කින් ලැබී තිබුණු මුළු අලාභය රු.45,139,259ක් විය.එම මුළු අලාභයෙන් සියයට 32ක්ම අවිස්සාවෙල්ල, මීනුවන්ගොඩ, දියතලාව, තංගල්ල, හම්බන්තොට, යාපනය හා රත්මලාන යන නගරවල පිහිටි ඔසුසල් 7න් ලැබී තිබුණු අතර එම ඔසුසල් 07 2013 වර්ෂයේ සිට අඛණ්ඩව අලාභ ලබා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති.

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සටිබන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාමේ පිළිතුරු ප්‍රකාශය.

2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

(අ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත (SLFRS) 13

(SLFRS) 13 ට අනුව පුනරාවර්තනය නොවන පදනම මත වන Business Combination හෝ Non Current Asset Held for Sale (පුනරාවර්තනය නොවන විකිණීම සඳහා පවත්වා ගෙන යන වත්කම්) අප ආයතනය සතුව නොමැත. පුනරාවර්තන පදනම මත වන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් ආරම්භක හඳුනා ගැනීම, අගය කිරීමේ ක්‍රමය හා මිනුම් සම්බන්ධව විස්තරාත්මක හෙලිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන මඟින් හෙලිදරව් කර ඇත.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 32 වන ඡේදයට අනුව වත්කම් හා වගකීම් හිලවු නොකල යුතු වේ. නමුත් සඳහන්කර ඇත්තේ එකම ගිණුමේ පවතින හර හා බැර ශේෂ පිළිබඳව වේ.

උදා:-

ණයගැති ශේෂ අතරේ පවතින ණයගැතියන් ගෙන් ලද අත්තිකාරම්, බැරපත් හා වැඩිපුර ගෙවීම් වන අතර එකම ගිණුමේ පවතින ශේෂ වසර අවසානයේදී වෙන වෙනම දැක්වීම ප්‍රායෝගිකව අපහසුවේ. මාර්ගස්ථ තොග හා නියෝජිත කොමිස් ගිණුම් වලද සඳහන් කර ඇත්තේ එවැනිම ශේෂයන්ය. ගණුදෙනුවල යථාස්වරූපය අනුව (Substance) හා මූල්‍ය ප්‍රවාහය නිවැරදිව දැක්වීමේ පදනම මත මෙසේ දක්වා ඇත.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8

නිකුත්කළ නමුත් බලාත්මක නොවන නව ගිණුම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය ප්‍රකාශන වලට ඇතිවන බලපෑම ප්‍රමාණාත්මක නම් හෝ බලපෑම තක්සේරු කළයුතු නම් එය හෙළිදරව් කිරීමට සංස්ථාව කටයුතු කරණු ලබයි.

කල්බදු පදනම මත වත්කම් මිලදී ගැනීම සිදුනොකරන බැවින් ගිණුම්කරණ ප්‍රමිත SLFRS 16 සෘජුවම අදාල නොවේ. නමුත් 2013 වසරේ වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් අනුමත කල SOAT -Right to sue of Land on lease අනුව බදු පදනම මත ලබාගෙන ඇති රත්මලාන ගබඩාව පවත්වා ගෙන යනු ලබන ඉඩම හදුනාගෙන ඇති අතර ඒ අනුව ගිණුම් ගතකර ඉදිරිපත්කර ඇත.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10

මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම හා වෙනස් කිරීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. එම අධිකාරී බලය ගිණුම් ප්‍රකාශනයේ ශේෂපත්‍රයේ දක්වා ඇති අතර මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට ඇති අධිකාරී බලය මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ දිනය හා සංශෝධනය කිරීමට ඇති බලය පිළිබඳ තොරතුරු සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ හෙලිදරවු කරයි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12

අප විසින් ඉදිරිපත් කර ඇත්තේ පෞද්ගලික විගණන ආයතනයක් විසින් ලබාදෙන ලද සාරාංශ ගත ඉදිරිපත් කිරීමක් වේ. නමුත් ඉදිරියේදී පහත පරිදි සවිස්තරාත්මකව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

		තාවකාලික වෙනස්කම්රු
විලම්බිත බදු වගකීම		
ගොඩනැගිලි		220,391,466
වාහන		65,926,658
දැවභාණ්ඩ හා සවිකිරීම්		29,535,841
උපකරණ		51,692,284
යන්ත්‍ර හා පිටියත		17,288,618
පරිගනක		15,344,706
		400,179,573
විලම්බිත බදු වත්කම්		
විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව		221,192,102
		221,192,102
වලදායී බදු අනුපාතය	28 %	
විලම්බිත බදු, වගකීම		(112,050,280)
විලම්බිත බදු, වත්කම්		61,933,789
2018 දෙසැම්බර් 31 වන දිනට ශේෂය		**(50,116,492)**
2017 දෙසැම්බර් 31 වන දිනට ශේෂය		(32,134,929)
වසර සඳහා අයකිරීම		**17,981,562**

(ඊ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

වර්ෂ අවසාන භාණ්ඩ සම්ක්ෂණය සිදුකරන විට වත්කම් වල ආයු ගණනය පිළිබඳ විශේෂ අවධානය යොමු කර සමාලෝචනය කරන අතර අවශ්‍ය අවස්ථාවන්හි ගිණුම් වල අවශ්‍ය ගැලපීම සිදුකරනු ලබයි.

වත්කම් ක්ෂය කිරීමේ පදනම ගිණුම්කරණ ප්‍රතිපත්ති 4.1.3 යටතේ පැහැදිලිව දක්වා ඇති අතර වත්කම් ක්ෂය කිරීම ආරම්භ කරනුයේ එය භාවිතා කිරීම ආරම්භකල පසුව වන අතර එසේ ක්ෂය නොකරන වත්කම් ද පවති. එබැවින් ගිණුම්කරණ ප්‍රමිත 16 යේ ප්‍රතිපාදනවලට අනුගත නොවූ අසම්පූර්ණ ගිණුම් ප්‍රතිපත්තියක් බව පිළිගැනීම අපහසුය.

(උ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38**

සංස්ථාව අස්පෘශ්‍ය වත්කම් ලෙස දක්වා තිබුණේ දැනට භාවිතයෙන් ඉවත් කිරීමට අපේක්ෂා කරන MYPOS නැමති මෘදුකාංගයකි. එහි ආයුකාලය වෙනසක් අපේකෂා නොකරන බැවින් අදාල ඇස්තමේන්තුව වෙනස් කර නොමැති අතර 2018 වසරේ දී ක්ෂය කිරීම අවසන්වී ඇත.

2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) අප විසින් ඉන්ඩෙන්ටු වටිනාකම් පදනම් කරගනිමින් ගෙවිය යුතු බිල් ගිණුමෙන් මාර්ගස්ථ තොග ගිණුමට මාරුකිරීම් සිදුකරණු ලබයි මෙහි සඳහන් කර ඇති LP/DHS/RSS/RQ/151/1075RD/16 දරණ ඉන්ඩෙන්ටුවට අදාලව ඉන්වොයිස් 2 කි. (Inv No 74590 හා Inv No 74806) සම්පූර්ණ ගෙවීම් කර තිබුණද අයිතම කිහිපයකට අදාල ඉහත ඉන්වොයිස් දෙකෙන් එකක් නොලැබී තිබූ බැවින් ගෙවිය යුතු බිල් ගිණුමෙන් මාර්ගස්ථ තොග ගිණුමට මාරුකර නොමැත එසේ වන්නේ ලැබිය යුතුව ඇති හරපතෙහි/ඉන්වොයිසියේ වටිනාකම විවිධ හේතූන් නිසා ගෙවා ඇති මුදලට වඩා වෙනස් විය හැකි බැවින් වටිනාකම තහවුරු කරගෙන මාරු කලයුතු බැවිනි.

(ආ) හා (ඇ) මෙම ගණනය කිරීමේ දෝෂ 2019 වසරේදි නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඇ) මෙම වරද 2019 ජනවාරි මස JV 14 මඟින් නිවැරදි කර ඇත

(ඉ) සඳහන් කර ඇති සියලු වියදම් 2018 වසරේ වියදම් ලෙස සලකා ගිණුම් ගතකර ඇති බැවින් නැවත උපචිත පදනමට ගිණුම් ගත කිරීමට අවශ්‍යතාවක් පැන නගින්නේ නැත.

(ඊ) මෙය VAT ගණනය කිරීමේදි සිඳුවූ වරදකි ඉදිරියේදි මෙවැනි අත පසුවීම් නොවීමට කටයුතු කර ඇත.

(උ) වෛද්‍ය සැපයුම් අංශයේ ණයගැතියන් වෙනුවෙන් සිදුකරන ලද 2017 දෙසැම්බර් 31 දිනට අතිතානුයෝගි නැවත ප්‍රකාශ කළ අඩමාන ණය වෙන්කිරීම සඳහා MOORE STEPHENS AIYAR සමාගම විසින් ඉදිරිපත්කර ඇති අවසාන වාර්තාවේ පිටපතක් මේ වන විට විගණනයට ඉදිරිපත්කර ඇත.

ඒ අනුව ආදායම් බදු ගණනය කිරීමේදි ගලපා ඇති අඩමාන ණය වෙන්කරීම වන රු. 992,894,846 වටිනාකම නිවැරදි වන අතර සඳහන්කර ඇති පරිදි ආදායම් බදු වගකිමෙහි රු. 1,476,169 ක අඩුවක් ඇති නොවේ. සඳහන්කර ඇති රු. 222,180 ක භාණඩාගාර බිල් පත් වටිනාකමේ වෙනස සමඟ එකඟවෙමි.

(ඌ) රාජ්‍ය ඖෂධ සංස්ථාව සතු රත්නපුර ඔසුසල ගොඩනැගිල්ලෙන් කොටසක් පිටස්තර පාර්ශවයකට කුලි පදනම මත ලබාදි ඇත.

ඔසුසල ආදායම ගණනය කිරීමේදි කුලි ආදායම ඔසුසල ආදායමේ කොටසක් ලෙස සැලකිමත් මුලු ගොඩනැගිල්ලටම අදාල වාර්ෂික ක්ෂය වටිනාකම ඔසුසලේ වියදමක් ලෙස සැලකිමත් කලමනාකරණ තිරණයක් මත වසර ගණනාවක සිට සංස්ථාව විසින් ක්‍රියාත්මක කරයි.

මුලු ගොඩනැගිල්ලෙහි ක්ෂයවීම ඔසුසල ආදායම ගණනය කිරීමේ දි ඇතුලත් කිරීම නොගැලපෙන බැවිනුත් ඔසුසලට අදාල ක්ෂය ප්‍රමාණය හඳුනා ගැනීම අපහසු බැවිනුත් මෙලෙස ක්‍රියාකර ඇත.

2.3 නොසැසඳු පාලන ගිණුම්

	රු.
ර.බෙ.ග සඳහා දේශිය මිලදි ගැනුම්	920,317
ර.බෙ.ග ලැබිය යුතු තිරුඹදු	51,927,472
ර.බෙ.ග සඳහා ආනයන	158,744,104
	211,591,893

සඳහන් කර ඇති වෙනස ඉහත පරිදි ගිණුම් ප්‍රකාශන වල දක්වා ඇති අතර සඳහන්ව ඇත්තේ 2008 ට පෙර රජයේ බෙහෙත් ගබඩාවට කරන ලද සැපයුම් හා තිරුඹදු වලට අදාල වවිනාකම් වේ. කෙසේ වුවත් වෛද්‍ය සැපයුම් අංශයේ අධ්‍යක්ෂ විසින් එවන ලද 2017 ජූලි මස 12 වන දිනැති ලිපිය මඟින් දන්වා ඇත්තේ 2007 වසරට පෙර ආනයන වලට අදාල හර පත් ගෙවීම සඳහා භාර නොගන්නා බවයි.

එහෙයින් රාජ්‍ය භාණ්ඩාගාරයේ හා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ලියා හැරීමට කටයුතු කරමින් සිටී.

2.4 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

2018 දෙසැම්බර් 31 දිනට මුළු ණයහිමියන් 247 ට අදාල රු. 2,983,839,668 ක් වූ වෙළඳ ණයහිමි ශේෂයෙන් රු. 834,130,145 ණයහිමියන් පමණක් මෙතෙක් පියවී නොමැත. මුදල් ලැබුණු විට ගෙවීමේ පදනම මත ලබාගෙන ඇති අදාල පාර්ශවයන්ගෙන් මුදල් ලැබී නොමැති ණය හිමියන් කොටසක්ද මෙහි අන්තර්ගතය. ශේෂය තහවුරු කර ගැනීමට විගණනය සඳහා ඉදිරිපත් නොවූ රු 2,556,685,131ක ශේෂයන් මේ වන විට ගෙවී ඇති රු 1,722,554,986 කට අදාළ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කරන ලදි

2.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

(අ) ඉහත 2.3 හි දැක්වූ පරිදි රාජ්‍ය භාණ්ඩාගාරයේ හා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ලියාපැරීමට කටයුතු කරමින් සිටී.

(ආ) ණයගැති ශේෂය වූ රු. 878,860,394 හි 2019.03.31 දිනට හිඟ ශේෂය ලෙස ඉතිරිව ඇත්තේ රු. 210,346,536 කි. ඒ තුල පාර්ලිමේන්තු සංකීර්ණයට ලබා දුන් ඖෂධ වෙනුවෙන් අයවිය යුතු රු. 14,621,371 අයකර ගැනීම සඳහා කථානායකතුමා, සෞඛ්‍ය ලේකම්තුමා සහ අදාල පාර්ශවයන් සමඟ කිහිප වතාවක් සාකච්ඡා කලද මෙම හිඟ මුදල ගෙවා පියවීම සම්බන්ධයෙන් සතුටුදායක පිළිතුරක් අප වෙත නොලැබුණු අතර රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභාවේදි ද මේ පිළිබඳව සාකච්ඡා කෙරුණි මෙම අයකර ගැනීම පිළිබඳව ගැටලුවක් ඇති නිසා 2017 වර්ෂයේදි මෙම මුලු අගයටම බොල් සහ අඩමාන ණය වෙන් කිරීමක් කර ඇත. වසර 5 ඉක්මවූ හිඟ ශේෂය වන රු. 12,408,417 හි නිතිමය පියවර සඳහා යොමු කල රු. 10,440,049 ද රාජ්‍ය අංශයෙන් ලැබිය යුතු රු. 1,677,256 ද පුද්ගලික අංශයෙන් ලැබියයුතු රු.272,872 ද ඇතුලත්ය. මෙම මුලු අගයටම බොල් සහ අඩමාන ණය වෙන්කිරීමකර ඇත.

(ඇ) විගණන පේදය අනුව 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රක්ෂණ වන්දි වටිනාකම වන රු.2,279,937.00 න් රු. 198,671.00ක වටිනාකමක් 2019.04.30 දින වන විට නිරවුල් වී ඇති අතර ඉන් තව දුරටත් අය කර ගැනීමට ඇති වටිනාකම වනුයේ රු. 2,081,266.00කි. තොග විනාශ කිරීමෙන් අනතුරුව රක්ෂණ හිමිකම් ලැබීමට නියමිත රු. 1,607,828.00 ක වටිනාකමකින් යුත් Hyoscinie Butylbromide Tablets නමැති ඖෂධ අඩංගු භාණ්ඩ තොගයක් තවදුරටත් අය විය යුතු වටිනාකම තුල ඇතුලත් වේ. තව ද විගණන පේදය අනුව වර්ෂ 2 ත් වර්ෂ 9 ත් අතර කාලයට අයත් ශේෂය වන රු. 525,006.00 න් 2019.04.30 දින වන විට රු. 159,450.00ක් නිරවුල් වී ඇත. ඉතිරි වටිනාකම වන රු. 365,556.00 ට අදාලව රක්ෂණ හිමිකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය සියලු ලිපි ලේඛන රක්ෂණ ආයතනයට ලබා දී ඇති අතර හිමිකම ලැබීමට නියමිතය.

(ඈ) විගණන පේදයේ දක්වා ඇති පරිදි 2018/12/31 දිනට ලැබිය යුතු බහාලුම් තැන්පතු වටිනාකම රු. 11,848,455 වුවද 2019.04.30 දින වන විට එම අගය රු. 9,479,455.00 දක්වා අඩු වී ඇත. එම වටිනාකමෙන් වර්ෂ 2ත් වර්ෂ 11ත් අතර කාලසීමාවට අයත් රු. 5,764,322.00ක අගයක් රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් පසුව ගිණුම් වලින් කපා හැරීම සඳහා භාණ්ඩාගාරය වෙත යොමු කල අතර භාණ්ඩාගාරයේ උපදෙස් මත ඒ සඳහා අවශ්‍ය විධි විධාන ඇතුලත් කොට නැවත භාණ්ඩාගාරය වෙත යොමු කිරීමට නියමිතය. අයකර ගැනීමට ඇති ඉතිරි මුදලින් රු. 2,704,000.00 ක අගයක් ලංකා නැව් සංස්ථාවෙන් අය කර ගැනීමට නියමිත අතර ඉතිරි මුදල වන රු. 1,011,133.00 සැපයුම් කරුවන් ගෙන් අය කර ගැනීමට කටයුතු කරමින් පවති.

(ඉ) පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීම - 150,000/-

මෙම මුදල ගෙවා ඇත්තේ, University of Colombo, වෙත E- Tender පද්ධතිය ස්ථාපිත කිරීම වෙනුවෙනි. ඉතිරි මුදල ගෙවා ගනුදෙනුව නිරවුල් කල හැක්කේ ERP පද්ධතිය ස්ථාපිත කර අවසන් වූ පසුවය.

සැපයුම් කරුවන්ගෙන් අයකර ගතයුතු අත්තිකාරම් රු 1,237,753 මෙම සැපයුම් කරුවන් බෙහොමයක් සංස්ථාව සමග දැනට ගනුදෙනු නොකරන බැවින් ඉදිරියේදි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ලියා හැරීමට කටයුතු කරමි.

ආයතන 10ක් වෙත නිකුත්කර තිබුණු රු.859,239 ක අත්තිකාරම් මුදලින් මේ වන විට පියවී ඇති අත්තිකාරම් විස්තර විගණනය වෙත ඉදිරිපත්කර ඇත. ඉතිරිය වූ රු.195,525 ක මුදලට අදාල අත්තිකාරම් වල වර්තමාන තත්ත්වය පහත දක්වා ඇත.

Commissioner General of Examination Rs. 96600/-

ප්‍රතිවල සනාථ කිරීමේ අයදුම්පත් සඳහා ගෙවන ලද රු. 96600/- කට අදාල රිසිටිපත් මේ වන තෙක් විභාග දෙපාර්තමේන්තුවෙන් එවා නොමැති අතර ඉදිරි සතිය ඇතුලත මෙම රිසිටිපත් ලබාදීමට එවුන් එකඟවී සිටින බවට මානව සම්පත් කළමනාකරු පවසා සිටී.

E.W.Information System Ltd. Rs. 21900/-

මෙම ආයතනය වෙතින් අපේක්ෂිත කාර්යය මෙතෙක් නිම කොට නොමැති බව පරිගණක කළමනාකරු පවසා සිටී.

Southland Collage Past Pupils Association Rs. 50000/-

මෙය විකුණුම් ප්‍රවර්ධන වියදමක් ලෙස 2018 වසරේ ගිණුම් ගතකර ඇත. අත්තිකාරම් ලේඛණයේ සටහන්වීම නිවැරදි විය යුතුය.

Islandwide Scientific (Pvt) Ltd. Rs.27025

අදාළ අංශයට දන්වා ඇති අතර එය ඉක්මණින් පියවීමට ORS- කළමනාකරු එකඟ වී ඇත.

Welfare Society of Health Ministry Rs.50000/-

මෙය පියවන ලෙස අදාල අංශයට දැනුම් දී ඇත.

අත්තිකාරම් දුන් දිනය	චෙක්පත් අංකය	ආයතනයේ නම	වටිනාකම රු.	පියවූ දිනය
28.12.2018	032435	LANKA SATHOSA	561,000.00	3.5.2019
20.12.2018	032261	D SAMSON & SONS (PVT) LTD	4,200.00	11.4.2019
20.12.2018	032263	D SAMSON & SONS (PVT) LTD	4,200.00	25.04.2019
20.12.2018	032261	D SAMSON & SONS (PVT) LTD	4,200.00	11.04.2019
20.12.2018	032259	D SAMSON & SONS (PVT) LTD	4,200.00	11.4.2019
6.12.2018	032261	D SAMSON & SONS (PVT) LTD	4,200.00	11.4.2019
07.12.2018	031963	STAE TRADING CORPORATION	6,700.00	11.2.2019
26.11.2018	031807	TOTAL TOOLS LANKA(PVT) LTD	20,214.00	11.4.2019
26.12.2018	032423	CONSTRUCTION INDUSTRY DEVELOPMENT	4,750.00	02.5.2019
		මුලු වටිනාකම	**613,664.00**	

(ඊ) විවිධ හේතූන් නිසා සංස්ථාව විසින් ගෙවීම් අත්හිටවූ සැපයුම් කරුවන් හා සැපයුම් කරුවන් විසින් අදාල ලේඛණ වල මුල් පිටපත් බැංකුව වෙත ලබානොදුන් අයිතම මෙලෙස ගෙවිය යුතු බිල් ලෙස ගිණුමේ ඉතිරිව ඇත.

කෙසේ වෙතත් වසර 3කට වඩා වැඩි කාලයක් පවතින ගෙවියයුතු බිල්පත් ආනයන අංශයේ නිර්දේශ ඇතිව නිරවුල් කිරීමට හෝ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම සංස්ථාවේ ගිණුම් ප්‍රතිපත්තිය වේ. ඉතිරිව ඇත්තේ ඉදිරියේදී ගෙවීමට හෝ නිරවුල් කිරීමට නියමිත බවට ආනයන අංශය විසින් සනාත කළ ශේෂයන් වේ.

(උ) නියෝජිත කොමිස් ගිණුමේ ශේෂය වන රු 53,400,758 ක බැර ශේෂය ර.බෙ.ග වෙත අයකර ගැනීමට හරපත් යවා ඇති නමුත් සැපයුම් කරුවන්ට ගෙවා නොමැති අගයන් වන අතර හර ශේෂ සැපයුම් කරුවන්ට ගෙවා ඇති නමුත් ර.බෙ.ග අයකර ගතයුතු වටිනාකම් වේ. 2019 වසරේදී මෙම වටිනාකම් නිරවුල් කිරීමට කටයුතු කරමි.

3. සංස්ථාවේ කර්තව්‍ය හා කාර්යයන්ට පරිභාහිරව කර ඇති ගෙවීම්

දක්වා ඇති උත්සවය රටක් වශයෙන් ශ්‍රී ලංකාවට ලෝක සෞඛ්‍ය ක්ෂ්ත්‍රයේ සුවිශේෂී ස්ථානයක් හිමි කරදීම සම්බන්ධයෙන් පවත්වන ලද දෙස් විදෙස් සෞඛ්‍ය ක්ෂ්ත්‍රයන්හි විවිධ පාර්ශවයන් සහභාගිවූ අවස්ථාවකි. එම අවස්ථාවට අනුග්‍රාහකත්වය ලබාදෙමින් සහභාගිවුවන් අතර ආයතනය සහ එහි පාර්ශවයන් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂ්ත්‍රයේ දක්වන දායකත්වය සම්බන්ධව දැනුවත් කිරීම් තුලින් ප්‍රවර්ධන වාසියක් ආයතනයට ලබාගැනීමට කටයුතු කර ඇත.

4. නීති රීති රෙගුලාසි හා කලමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම

(අ)

(i) 2018 වර්ෂයේ වාහන අනතුරු 12 ක් සිදුවී ඇති අතර, ඉන් අනතුරු 6 කට සිදුවූ අලාභයේ සම්පූර්ණ මුදල රක්ෂණ සමාගම විසින් ගෙවා ඇත. එසේම තවත් අනතුරු 5 කට අදාල අලාභයෙන් කොටසක් රක්ෂණ සමාගම විසින් ගෙවා ඇති අතර, ඉතිරි මුදල අයකර ගැනීමට වගකිව යුත්තන් නිශ්චය කිරීමට කටයුතු කරමින් පවති. තවත් එක් අනතුරක් සඳහා රක්ෂණ වන්දි ලබාගැනීමට අදාල ලේඛණ රක්ෂණ සමාගම වෙත යවා ඇත.

(ii) **මුදල් රෙගුලාසි 571**

සඳහන්කර ඇත්තේ ගෙවිය යුතු ටෙන්ඩර තැන්පතු ගිණුමේ හා බැංකු ආරක්ෂණ වෙනුවෙන් වූ මුදල් තැන්පතු ගැනුම් වල ඇති තැන්පතු වටිනාකම් වේ. මෙම වටිනාකම් සැපයුම් කරුවන් ඉල්ලූ විට ගෙවියයුතු වන අතර සාමාන්‍යයෙන් වසර 5කට වඩා වැඩි අගයන් අදායම් ලෙස ගිණුම් ගත කරයි.

මෙයින් බොහොමයක් දිගින් දිගටම සංස්ථාව සමඟ ගනුදෙනු කරනු ලබන ගනුදෙනු කරුවන්ගේ තැන්පතු හා ආනයන අංශය විසින් ගනුදෙනු කරුවන්ගේ වන්දි අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින තැන්පතු වන අතර එම නිර්දේශ ලැබෙන තුරු වැඩි කාලයක් රඳවා ගතයුතු වේ. කෙසේ වෙතත් ආදායම් ලෙස ගිණුම් ගතකල හැකි වටිනාකම් හඳුනාගෙන එලෙස ගිණුම් ගත කිරීමට විටින්විට කටයුතු කරයි.

(iii) **මුදල් රෙගුලාසි 757 (2) (අ)**

මේ වන විට සියලු රාජ්‍ය ඔසුසලවල හා රත්මලාන ගබඩා සංකීරණයේ භාණ්ඩ සම්ක්ෂණ කටයුතු නිමකර ඇති අතර ප්‍රධාන කාර්යාලයේ භාණ්ඩ සම්ක්ෂණ කටයුතු සිදුවෙමින් පවති. මේ මස තුලදී අදාල වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන අතර ඉදිරි වර්ෂයේ දී ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(iv) අදාල නිරීක්ෂණය සමඟ එකඟ වන අතර හඳුනාගෙන ඇති භාණ්ඩ විනාශ කිරීමට/විකිණීමට අදාල කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.

(ආ) දැනට ධාවන තත්ත්වයේ නොමැති වාහන තුනක් සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලයෙන් උපදෙස් ඉල්ලා සිටි අතර එම වාහන සඳහා නැවත වෙනත් ස්වාධීන ආයතනයකින් තක්සේරු වාර්තාවක් ලබා ගන්නා ලෙස උපදෙස් ලැබුණි. අදාළ උපදෙස් අනුව නැවත ස්වාධීන ආයතනයක් මඟින් එම වාහන තුන සඳහා තක්සේරු වාර්තා ලබා ගෙන අවශ්‍ය උපදෙස් සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය වෙත ලිපි ගොනුව නැවත යොමු කරන ලදි.

එසේම දැනට ප්‍රධාන කාර්යාලයේ ඇති ත්‍රිරෝදරථය අපහරණය කිරීම සඳහා ප්‍රසම්පාදන මණ්ඩලය වෙත අනුමැතිය සඳහා යොමු කළ අතර ඒ සඳහා ද ස්වාධීන ආයතනයක් මඟින් තක්සේරු වාර්තාවක් හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රවාහන අංශයේ වාර්තාවක් ද ලබා ගන්නා ලෙස උපදෙස් ලබා දී තිබුණි.

ඒ අනුව මේ වන විටත් ස්වාධීන ආයතනයක් මඟින් තක්සේරු වාර්තා ලබා ගෙන ඇති අතර සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ලබාදිය යුතු වාර්තාව මෙතෙක් ලැබී නොමැත. මේ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තාක්ෂණ නිලධාරිතුමා වෙත දුරකථන මඟින් සිහිකැඳවා ඇති අතර අදාල වාර්තාව කඩිනමින් ලබාදීමට කටයුතු කරන බව අප වෙත දැනුම් දීමක් කර ඇත.

5.1 කළමනාකරණ හා මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) සංස්ථාවේ ප්‍රමුඛ අරමුණු වලට අවධානය යොමු කරමින් කටයුතු කර ඇත.

(ආ) මෙම තත්ත්වය ඉදිරියේදී නිවැරදි කරගැනීමට කටයුතු කරමි.

(ඇ)

(i) **නිරීක්ෂණ සමඟ එකඟ වේ**

(ii) ERP ව්‍යාපෘතිය ඉක්මන් නිම කරවීමට කටයුතු කරමින් පවතී.

(iii) මෙම කරුණ ද ERP ව්‍යාපෘතිය නිමවීමත් සමඟ ඉටුකර ගැනීමට කටයුතු කරමි.

(iv) සියලුම වෘත්තිය සමිති නියෝජිතයන් විශේෂ තනතුරු දරන කණ්ඩායමි හා තනි තනි පුද්ගලයන් ඉදිරිපත් කර තිබූ ගැටලු අංශ ප්‍රධානීන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් ඇතුලුව සංස්ථාව නියෝජනය කරන සියලුම කණ්ඩායමි සමඟ සාකච්ඡා පවත්වා යෝජනා අන්තර්ගත කරමින් කෙටුම්පත සකස්කර අවසන් අදියරේ පවතී. එය ඉහළ කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කිරීමට නියමිතය.

(v) ඉහත දක්වන ලද බඳවා ගැනීම් පටිපාටිය සංශෝධනය කිරීම යටතේ "කළමනාකරණ අභ්‍යාසලාභී පුහුණු" ලෙස නව තනතුරක් හඳුන්වාදීමට යෝජිත අතර එමඟින් අදාල සුදුසුකම් සපුරා ඇති අභ්‍යන්තර හෝ බාහිර අයදුම්කරුවන් ආයතනයේ එක් එක් අංශයේ කටයුතු සම්බන්ධව වසරක පුහුණුවක් ලබා ගන්නා අතර කළමනාකාර තනතුරක් පුරප්පාඩු වී අදාල බඳවා ගැනීමේ දී සලකා බලනු ඇත.

කළමනාකාර තනතුරක් පුරප්පාඩු වීමට නියමිත අවස්ථාවලදී එය පෙර හඳුනා ගනිමින් ඒ සඳහා සුදුසු අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන් ආකර්ෂණය සඳහා තනතුරු පුරප්පාඩු වීමට පෙර අදාල බඳවා ගැනීමේ පටිපාටින්ට අනුකූලව කටයුතු කරනු ලැබේ.

(vi) අදාල පරීදි උසස්වීම් ලබා දී ඇත.

(vii) ආයතනය තුළ පවතින එක් එක් සේවක කාණ්ඩ අතර සාමූහික කණ්ඩායම් සංවර්ධනය ඇති කිරීමට ආකල්ප වැඩිදියුණු කිරීම සඳහා බැහැරගත පුහුණු වැඩ සටහන් මෙන්ම ඒ ඒ විෂය ක්ෂේත්‍රයන්ට අදාල වූ සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත.

තවද සේවක මහත්ම මහත්මීන්ගේ සාමූහික කණ්ඩායම් හැඟීම හා ක්‍රියාකාරිත්වය වර්ධනය අරමුණු කර ගනිමින් 2017 වර්ෂයේ කම්කරු ශ්‍රේණිය සඳහා දෙදින බැහැරගත පුහුණු වැඩ සටහන්ද 2018 වර්ෂයේ සියලු කළමනාකාර සහකාර ශ්‍රේණි සඳහා දින 02 ක බැහැරගත පුහුණු වැඩ සටහනක් පැවැත්වීම විශේෂිතය. එසේම 2019 වර්ෂයේදී විධායක ශ්‍රේණියේ අවශ්‍යතා පූර්ණය වන පරීදි බැහැරගත පුහුණු වැඩ සටහන් සංවිධානය කිරීමට නියමිතව ඇත.

(ඈ) මානව සම්පත් අංශය මඟින් විවිධ විමර්ශන/විනය කටයුතු කරගෙන යාම හේතුවෙන් සේවකයින් 06 දෙනෙකු සඳහා ඔවුන්ගේ අවසාන ගෙවීම් කටයුතු සිදු කොට නැත. මෙම සේවකයින් 06 දෙනා දැනටමත් අප සංස්ථාවේ සේවයෙන් ඉවත්වී ඇත. නමුත් විමර්ශන/විනය කටයුතු අවසන් වූ පසු මෙම සේවකයින් වෙනුවෙන් අවසාන ගෙවීම් කටයුතු සිදුකරන විට ඔවුන්ගේ හිඟ ආපදා ණය මුදල් අයකර ගැනීමට හැකි වේ. මෙම හේතුව නිසා සංස්ථාවට කිසිදු මූල්‍යමය අලාභයක් සිදු නොවන බව දන්වන අතර දැනට සේවයේ යෙදී සිටින සේවකයන්ගෙන් නිසි පරීදි ආපදා ණය මුදල් අයකර ගැනීම සිදුවේ.

සේවකයින් දෙදෙනකුගේ හිඟ ආපදාණය මුදල අවසාන ගෙවීම මඟින් අඩුකර ගෙන එය 2019 වසරේ දී ගිණුම් ගත කොට නිම කර ඇත.

(ඉ) මෙම අයිතම වලින් සමහරක් මේ වන විට නිරවුල්වී ඇත, ඉතිරිව ඇත්තේ ආනයන අංශය මඟින් සිදුවී ඇති වැරදීම් සමහරකි. ඒවා ආනයන අංශය සමඟ සාකච්ඡාකර නිරවුල් කිරීමට කටයුතු කරමි.

(ඊ) සංස්ථාවේ අලෙවිය සඳහා 2017 වර්ෂය තුල ගෙන්වන ලද ඖෂධ වලින් වර්ෂය අවසානයේ තොග පරීක්ෂාවට අනුව (Stock Verification) තත්වයෙන් අසමත් වූ ඖෂධ වල වටිනාකම රු.මිලියන 44.9 වූ අතර එයින් රු. මිලියන 17.8 ක් පියවා ගත හැකි විය. ඉතිරි මිලියන 27 ඉදිරියේ දී පියවා ගැනීමට කටයුතු කරමින් පවතී.

2017 වර්ෂයේ රු මිලියන 70 ක වටිනාකමින් යුත් ඖෂධ කල් ඉකුත් වූ අතර එයින් මිලියන 17 ක් පියවා ගෙන ඇත. ඉතිරිය පියවා ගැනීම සඳහා සෑම උත්සාහයක්ම තව දුරටත් දරයි.

සමාලෝචිත වර්ෂයේ (2018) අවසන් තොග පරීක්ෂාවට අනුව (Stock Verification) තත්ත්වයෙන් අසමත් වූ ඖෂධ වල වටිනාකම රු.මිලියන 14 ක් වූ අතර ඉන් 99% පමණ පියවා ගෙන ඇත. මෙම වසරේ කල් ඉකුත් වූ ඖෂධ වල වටිනාකම රු.මිලියන 37 වූ අතර ඉන් රු.මිලියන 3.7 ක් පියවා නොමැත. තව දුරටත් පියවා ගැනීමට කටයුතු කෙරේ.

අදාල විස්තරාත්මක වගුව විගණන අංශයට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

(උ) සමාලෝචිත වර්ෂය තුල ඔසුසලවල් 39 න් 24 ක් අලාභයක් පෙන්වයි. එයින් අවිස්සාවේල්ල, මිනුවන්ගොඩ, දියතලාව, තංගල්ල, යාපනය හා හම්බන්තොට ඔසුසල් වල විකුණුම් වර්ධනයක් පෙන්වන අතර අලාභය අඩු වී ඇත.

2017 වර්ෂයට අනුගාමිව 2018 වර්ෂයේ නව ඔසුසල් 4ක් විකිණුම් ජාලයට එකතු විය. මේවා වසර පුරා විවිධ මාස වල විවෘත වූ අතර නව ප්‍රාග්ධනයන් යටතේ ආරම්භ කල නිසා එකවරම නව ඔසුසල් වල ලාභයක් එකවරම බලාපොරොත්තු විය නොහැක. එසේම එකවරම ඖෂධ වල මිල පාලනයකින් යුතුව නිකුත් කිරීමට සිදුවීම හා ඔසුසල් වල ගොඩනැඟිලි වලට විශාල මාසික කුලියක් ගෙවීමට සිදුවීම තවත් අමතර හේතූන් වේ. මෙම කාරණා වලින් මිදීම සඳහා විවිධ උපාය මාර්ගයන් ඉදිරි වසර වල යොදා ගැනීමට බලාපොරොත්තු වෙමු.

(ඌ) විගණනය මඟින් දක්වා ඇති පරීදි 01.01.2012. සිට 31.12.2018 කාලය තුළ සැපයුම් කරුවන්ගෙන් අයකර ගැනීම සඳහා නිකුත් කරන ලද හරපත් වල වටිනාකම රු. 1,754,661,431 ක අගය නිවැරදිවේ

මෙම වටිනාකමින් 31.12.2018 දින වන විට රු.943,466,372 ක වටිනාකමක් සැපයුම්කරුවන් ගෙන් අයකරගෙන තිබූ අතර, එදින වන විට තවදුරටත් අයකලයුතු ලෙස දක්වන ලද වටිනාකම රු. 811,195,059 ක් විය.

විගණන විමසුමෙහි රු.47,106,121 ක වටිනාකමක් අසාදු ලේඛණගත සැපයුම්කරුවන් ගෙන් අයකර ගත යුතු අවිනිශ්චිත අගයක් ලෙස දැක්වුවද 31.12.2018 දිනට අසාදු ලේඛණගත සැපයුම්කරුවන්ගෙන් අයකරගත යුතු වටිනාකම රු. 283,811,421 ක් ලෙස නිවැරදි විය යුතුය. අදාල ලේඛන විගණන අංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

හරපත් නිකුත්කල පසු සැපයුම්කරුවන්ගන් අයකර ගැනිමේ කාර්යය පහසු කාර්යයක් නොවුවද සංස්ථාව ඉන් බැහැර නොවන අතර වාරික වශයෙන් හෝ හරපත් වටිනාකම් අයකර ගැනිමේ ක්‍රියාවලියේ නිරතවේ. ඒ අනුව 31.12.2018 දිනට අයකර ගත යුතු ලෙස දක්වන ලද රු.811,195,059 ක වටිනාකමින් 30,04,2019 වන විට රු 44,760,118.38 ක් අයකරගෙන ඇති අතර අසාදු ලේඛණගත සැපයුම් කරුවන්ගෙන් අදාළ වටිනාකම් නීතිකටයුතු මඟින් හෝ අයකර ගැනිම සඳහා සංස්ථාව විසින් කටයුතු කරයි

(ඒ) මෙම ගිණුම් විවිධ අවශ්‍යතා මත කොමර්ෂල් බැංකුවේ විවෘත කල බැංකු ගිණුම්වේ. දැනට ප්‍රධාන වශයෙන් රාජ්‍ය බැංකු සමඟ ගිණුම් කටයුතු සිදුකරන බැවින් ඉහත ගිණුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව වසා දැමීමට කටයුතු කරමි.

5.2 ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු හා බැහැරවීම්

(අ) නිරීක්ෂණය සමඟ එකඟ වේ. නමුත් ප්‍රසම්පාදනයේ ස්වභාවය මත දක්වා ඇති පරිදි කටයුතු කිරීම ප්‍රායෝගිකව කල නොහැකිය.

(ආ)

I. අදාල නිරීක්ෂණය සමඟ එකඟ වන අතර ඉදිරි ප්‍රසම්පාදන ක්‍රියාවලින්හිදි එකී අඩුපාඩු නිවැරදි කරගනිමින් කටයුතු කරන බව සඳහන් කරනු කැමැත්තෙමි.

II. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.1 (ඈ) වගන්තිය ප්‍රකාරව ලංසු කැදවීමේ ලේඛණ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය වෙත ඉදිරිපත් කොට සියලුම ලේඛණ සඳහා අනුමැතිය ලබා ගෙන ඇති බව ඔබගේ කාරුණික අවධානය පිණිස යොමු කිරීමට කැමැත්තෙමි. තවද අදාල ලේඛණ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අනුමත කර නොමැති බව දක්වා ඇති නිරීක්ෂණය සමඟ එකඟ වන අතර ඉදිරි ප්‍රසම්පාදන ක්‍රියාවලින්හිදි එකී අඩුපාඩු නිවැරදි කරගනිමින් කටයුතු කරන බව සඳහන් කරනු කැමැත්තෙමි.

III. අදාල නිරීක්ෂණය සමඟ එකඟ වන අතර ඉදිරි ප්‍රසම්පාදන ක්‍රියාවලින්හිදි එකී අඩුපාඩු නිවැරදි කර ගැනිමට කටයුතු සම්පාදනය කරමි.

IV. අදාල නිරීක්ෂණය සමඟ එකඟ වන අතර ඉදිරි ප්‍රසම්පාදන ක්‍රියාවලින්හිදි එකී අඩුපාඩු නිවැරදි කර ගැනිමට කටයුතු සම්පාදනය කරමි.

V. අදාල නිරීක්ෂණය සමඟ එකඟ වන අතර ඉදිරි ප්‍රසම්පාදන ක්‍රියාවලින්හිදි එකී අඩුපාඩු නිවැරදි කර ගැනිමට කටයුතු සම්පාදනය කරමි.

(ඇ)

(i) රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 මාර්ගෝපදේශයට, 2017 මාර්තු 15 දින නිකුත් කරන ලද 31 වන අතිරේකයට අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියට අයත් කාල රාමුව සති 8ක් ලෙස දක්වා තිබුණද ජීවිතාරක්ෂක ඖෂධ ප්‍රසම්පාදන කටයුතු ජාත්‍යන්තර තරගකාරී ලංසු ක්‍රමය හෝ සීමිත තරඟකාරී ලංසු ක්‍රමය අනුගමනය කරමින් ක්‍රියාත්මක කරන විට ප්‍රසම්පාදනයන් සඳහා මෙම කාල රාමුව ප්‍රායෝගිකව විවිධ හේතූන් මත අදාල කර ගැනිම දුෂ්කර වේ. ඖෂධ ප්‍රසම්පාදනයට අදාල එක් එක් පියවර වලට ගත වන කාලය එම සාමාන්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ (General Guideline) හි විශේෂිතව දක්වා නොමැත. එම නිසා ජීවිතාරක්ෂක ඖෂධ ප්‍රසම්පාදනයන් සාමාන්‍ය ද්‍රව්‍ය මිලදි ගැනිමට කරන ප්‍රසම්පාදනයන්ගෙන් වෙනස් වන අතර එහි සමහර පියවර ප්‍රසම්පාදන අස්ථිත්වයේ පාලනයෙන්ද තොර වේ.

එබැවින් ජීවිතාරක්ෂක අයිතම මිලදි ගැනිමට අදාලව පවතින ප්‍රසම්පාදන රාමුව තුල දක්වා ඇති මෙම කාල රාමුවට අනුගත වීමට ප්‍රායෝගික ගැටළු පවති. ඖෂධ කළමනාකරණ අත්පොතේ ඇමුණුම III ට අනුව ඖෂධ වල ප්‍රසම්පාදන කටයුතු සඳහා රාජ්‍ය ඖෂධ සංස්ථාවට ඇණවුම් නිකුත් කල යුතු ආකාරය විස්තර වේ.

කරුණු එසේ වුවද මෙම විගණන විමසුමට අදාල ඇණවුමට ප්‍රසම්පාදනය හදිසි ප්‍රසම්පාදනයක් ලෙස සලකා අනෙකුත් ඖෂධ ප්‍රසම්පාදනයන් අතර ප්‍රමුඛතාවය දී කටයුතු කර අනෙකුත් ප්‍රසම්පාදනවලට සාපේක්ෂව ඉතා කෙටි කාලයකින් නිම කරන ලදි.

තවද මෙහිදි මෙම කාලය තුල මෙම ඖෂධයට අදාලව මිල පාලනයක් ක්‍රියාත්මක වීම හේතුවෙන් නැවත ලිපිගොනුව ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කිරීම ආදි අපගේ පාලනයෙන් තොර ක්‍රියාවලි සඳහා ද ගත වූ අතර අමතර කාලයද මෙයට ඇතුලත් වී ඇති බවද සඳහන් කල යුතුය.

(ii) ටෙන්ඩරය ප්‍රදානය කර ඇත්තේ නිර්දේශ කරන ලද අවම මිල ගණනට බැවින් අතිරේක පිරිවැයක් ලෙස දැක්වීම නිවැරදි නොවේ.

(iii) ඖෂධ තොග සැපයීමට එකඟවී තිබූ දිනයක් පිළිබඳව විගණන විමසුමෙහි දක්වන්නේ කුමක්දැයි අපැහැදිලිය. මේ පිළිබඳ විමසිමේදි එය වෛද්‍ය සැපයීම් අංශය විසින් එවන ලද ඇමුණුමේ දක්වා ඇති ලැයිස්තුගත දිනය ලෙස දන්වන ලදි.

2018.05.30 දිනැති 2018/SPC/E/R/P/00559 ඖෂධ ඇණවුම ඖෂධ සංස්ථාවට ලැබුනේ 2018.06.06 දිනයි. එහි ලැයිස්තු ගත දිනය (scheduled date) ලෙස දක්වා ඇත්තේ 2018.06.15 දිනයි. එබැවින් දින 09ක් (7 working days) ඇතුලත රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කොට ලංසු කැදවීමෙන් ඖෂධ ප්‍රසම්පාදනයක් සිදු කිරීම කිසිසේත් ප්‍රායෝගික නොවේ. එබැවින් විගණන විමසුමේ සඳහන් ආකාරයට මෙම ඇණවුමට අදාලව සැපයීම් ප්‍රමාදයක් හේතුවෙන් දේශීය වෙළඳපොළෙන් මිලදි ගැනිමට සිදුවීම යනුවෙන් දැක්වීම මෙයට අදාල නොවේ..

(iv) හදිසි අවශ්‍යතාවය සලකා බලා සභාපතිතුමා විසින් ලබාදුන් උපදෙස් අනුව ලංසු ඉදිරිපත් කිරීම සඳහා වැඩ කරන දින 1ක් පමණක් ලබාදී ඇත.

(v) මෙම මිලදි ගැනිම හදිසි මිලදි ගැනිමකි. හදිසි මිලදි ගැනිමකදි සීමිත කාලයක් තුල ලංසු ලබාගැනිම කලයුතු බැවින් ලංසු සුරක්ෂණ ලබාගැනිමක් සිදුකර නොමැත. හදිසි මිලදි ගැනිම් සඳහා සාමාන්‍යයෙන් අනුගමනය කරන ක්‍රියාමාර්ගය මෙය වේ.

(vi) මෙම මිලදි ගැනිම හදිසි මිලදි ගැනිමකි. හදිසි මිලදි ගැනිමකදි සීමිත කාලයක් තුල ලංසු ලබාගැනිම කලයුතු බැවින් කාර්යය සාධන සුරක්ෂණයක් ලබාගැනිමක් සිදුකර නොමැත. හදිසි මිලදි ගැනිම් සඳහා සාමාන්‍යයෙන් අනුගමනය කරන ක්‍රියාමාර්ගය මෙය වේ.

(vii) ණයවර ලිපි කොන්දේසියට අනුව සම්පූර්ණ ගෙවීම සිදුකිරීමට නියම කර ඇත්තේ සැපයීම සිදුකර දින 45 කට පසුවය. ඒ අනුව සම්පූර්ණ මුදලම දින 45 ක් දක්වා රඳවා තබා ගැනිමට කටයුතු කර ඇත. ඔබගේ නිරීක්ෂණය සමඟ එකඟ විය නොහැක.

(viii) සාමාන්‍ය ක්‍රමවේදය අනුව, රුපියල් මිලියන 50 - 100 අතර මිල ගණන් ඇති ටෙන්ඩර වල තාක්ෂණික ඇගයීම් සඳහා 05 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් ක්‍රියා කරයි. මෙම කමිටුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (තාක්ෂණ රසායනාගාර හා නිෂ්පාදන), අදාළ ක්ෂේත්‍රයේ විශේෂඥ වෛද්‍යවරු 02 ක්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙක්, හා රාජ්‍ය ඖෂධ සංස්ථාවේ මූල්‍ය අංශය නියෝජනය කරමින් ගණකාධිකාරිවරයෙක් යන අයගෙන් සමන්විතය. කරුණු මෙසේ වුවද ප්‍රාදේශිය මිලදි ගැනීම් හා හදිසි මිලදි ගැනීම් වලදි ලංසු ඇගයීම සඳහා තාක්ෂණ අංශයට ලබාදි ඇත්තේ දින 03 ක කාලයක් පමණි. මෙහිදි ලංසු ඇගයීමේ මූලික කාර්යයන් වන ඖෂධයේ ලියාපදිංචිය, පිරවිතර වලට අනුකූලද යන බව, පෙර පැමිණිලි, සාමිපල ලබාදි ඇත්ද යන බව යන කරුණු සොයා බැලීම ද සිදුකළ යුතු අතර වේ කාලය ඇතුලත තාක්ෂණික ඇගයීම් සඳහා ඉහත කී සාමාජිකයින් 05 දෙනා රැස්වීමට කැඳවා ගැනීම ප්‍රායෝගිකව සිදුකල නොහැකි කරුණකි.

විශේෂයෙන්ම ජ්‍යෙෂ්ඨ විශේෂඥ වෛද්‍යවරු ඉතා කාර්යබහුල බැවින් ඔවුන්ව මේ සඳහා කැඳවා ගැනීම ඉතා අපහසුය මෙකී කරුණු සලකා බලා, ඖෂධය ඉතා ඉක්මනින් රෝගින් වෙත ලබා දීමේ අවශ්‍යතාවය මත පදනම්ව තාක්ෂණික ඇගයීම් සඳහා එක් වෛද්‍යවරයෙකුගේ පමණක් නිර්දේශ ලබා ගැනීමට සංස්ථා සභාපති අනුමැතිය ලබා දි ඇත.

(viii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.8.4 අනුව තාක්ෂණ ඇගයීම් සඳහා යෝග්‍ය පුද්ගලයන් පත් කිරීමේ බලය ආයතන ප්‍රධානියාට ඇති අතර ආයතන ප්‍රධානියා වන සභාපතිතුමා විසින් එම අධිකාරි බලය කළමනාකාර අධ්‍යක්ෂතුමා වෙත පවරා තිබුණි. එසේ පවරන ලද අධිකාරි බලයමත කළමනාකාර අධ්‍යක්ෂකතුමා විසින් නම් කරන ලද විශේෂඥ වෛද්‍යවරු විසින් ඉදිරිපත් කරන ලද තාක්ෂණ ඇගයීම් වාර්තා ආයතන ප්‍රධානියා වන සභාපතිතුමා මුලසුන දරණ ප්‍රසම්පාදන කමිටුවලදි අනුමත කිරීම මඟින් එම අධිකාරි බලය කළමනාකාර අධ්‍යක්ෂකතුමා වෙත පවරා තිබුණු බව ඔහු විසින්ම තහවුරු කර ඇත.

(ix) තාක්ෂණික ඇගයීම සිදුකිරිමේදි ඔබ විසින් දක්වා ඇති කරුණු සලකා බැලිය නොහැකිය යනුවෙන් කිසිදු ප්‍රතිපාදනයක් නොමැති බව පෙන්වා දෙමි. තාක්ෂණික ඇගයීම් කරන විශේෂඥ වෛද්‍යවරයාගෙන් ලබාගන්නා මතය හෝ නිර්දේශයට පරිභාහිරව ඖෂධ සම්බන්ධයෙන් කටයුතු කිරීම සුදුසු නොවන බව සාමාන්‍ය වැටහිම බවද පෙන්වා දෙමි. විශේෂයෙන්ම හදිසි අවශ්‍යතා සඳහා කරන මිලදි ගැනීම් වලදි ඇගයීම කරන විශේෂඥ වෛද්‍යවරු ඉදිරිපත් කර ඇති අයිතමය සම්බන්ධයෙන් නිර්දේශ ලබාදිය නොහැකි බව දන්වා ඇති විටක එම අයිතමය නොසලකා හැරීම හැර වෙනත් විකල්පයක් නොමැත. නිර්දේශිත සැපයුම්කරුට ලංසුව පිරිනමා ඇති බැවින් නිර්දේශ නොවූ සැපයුම් කරුවන්ගේ මිලගනන් සමඟ සසඳා බලා අතිරේක පිරිවැය වශයෙන් දක්වා සිටීම නිවැරදි නොවේ.

(ඇ) Blood Glucose Testing Strips මිලදී ගැනීම පිළිබඳව පරීක්ෂාව

(i) එකවර ලංසු කරුවන්ට ෆැක්ස් කිරීමට අපහසු වූයේ පහත සඳහන් කරුණු මතය.

මෙම ටෙන්ඩරය සඳහා දේශීය හා විදේශීය සැපයුම්කරුවන් 38 දෙනෙකු සඳහා ලංසු ලේඛණ ෆැක්ස් කළයුතුවූ අතර දිනයන් 03කදි ලංසු ලේඛණ ෆැක්ස් කරන ලද්දේ පළමු දින සමහරක් සැපයුම් කරුවන්ගේ ෆැක්ස් අංක මඟින් ප්‍රතිචාරයක් නොදැක්වීම හේතුවෙනි. එය සහතික කිරීම සඳහා එම ෆැක්ස් යන්ත්‍රය මඟින් කිසිදු වාර්තාවක් නොලැබෙන අතර මෙම ටෙන්ඩරය සඳහා ඇති ලංසු ලේඛණය පමණක් නොව සෑම ෆැක්ස් ලිපියක්ම තෙවරක් උත්සාහ දරා ප්‍රතිචාර නොදැක්වූ විට ඒ සඳහා නැවත කාලයක් එදිනම වෙන්කිරීමට නොහැකි වේ. මන්ද තවද මෙවැනිම ඇණවුම් වල ලංසු ලේඛණ එදිනම ෆැක්ස් කිරීමට ලැබී ඇති හෙයිනි. ප්‍රතිචාර නොදක්වන සැපයුම්කරුවන්ගේ ෆැක්ස් අංක සඳහා අප ආයතනය වගකිව යුතු නොමැති අතර දින 03 තුල හෝ ප්‍රයත්නදරා කෙසේ හෝ එම ලංසු වෙත ෆැක්ස් කර ඇත. ඒ අනුව අප ආයතනය විසින් ලංසු ලේඛණ ෆැක්ස් කිරීම සම්බන්ධයෙන් උපරිම සාධාරණයක් කර ඇති බව සඳහන් කරමි.

තවද ලංසු ඉදිරිපත් කිරීම සඳහා එම දින තුනම ගතවූ පසුවද සාධාරණ කාලයක් සියලු ලංසුකරුවන්ට ලැබී ඇති බව පෙන්වා දෙමි.

(ii) කරුණ නිවැරදිය. එහෙත් ලංසු බැදුම්කරයේ වලංගු කාලය ලෙස 08.01.2018 සිට 04.09.2018 දක්වා දින 210 කට වැඩි කාලයක්, ඉඩදි ඇති බැවින් ලංසුවේ වලංගුතාවය වෙන්ව දක්වා නොතිබුණ ද බැදුම්කරයෙහි කාලයතුල ආවරණයක් ලැබී ඇත. පදවිනාමය නොමැති වුවත් අදාල සමාගමේ නිළ මුද්‍රාව තබා අත්සන් කර ඇත. නිරීක්ෂණය සමඟ එකඟවේ. මෙම කරුණ වටහාගෙන ටෙන්ඩර මණ්ඩලය මඟින් ඉහත අධිකාරිය පැවරීමේ ලිපිය ලබාගැනීමෙන් පසුව ඉදිරි කටයුතු කරන ලෙස තිරණයකර ඇත. අදාල නිෂ්පාදකයාගේ නම ලංසු ලියවිලි වල සඳහන් නොවූවත් ලංසු ලියවිලි සමඟ එහිම කොටසක් ලෙස ටෙන්ඩරය සමඟ ඉදිරිපත් කරන ලද ලියාපදිංචි සහතිකයෙහි ඖෂධ නිෂ්පාදකයාගේ නම පැහැදිලිව සඳහන්වේ.

(iii) ඇගයීම් කටයුතු සිදු කිරිමේදි අත්‍යාවශ්‍යයෙන්ම යොමු විය යුතු කාර්ය පටිපාටිමය කරුණු වලට යම් කාලයක් ගතවී ඇති අතර සාමාන්‍ය මිලදි ගැනීමකට වඩා වෙනස් වූ සංකීර්ණ පිරිවිතර සහිත අයිතමයක් වන මෙම අයිතමය වැනි අයිතම ඇගයීමට ලක් කිරීමේ දි වැඩිපුර කාලයක් ගතවීම නොවැලැක්විය හැක. මෙම ටෙන්ඩරය දෙවරක් අගයීම් කිරීමට සිදුවීම නිසා ද අමතර කාලයක් ගත වී ඇත. තවද ඉහත කී කාලය අතරතුර මෙම ටෙන්ඩරයට අමතරව තාක්ෂණික අංශය මඟින් දළ වශයෙන් අයිතම 1300 කට අධික සංඛ්‍යාවක් ඇගයීම් සම්පූර්ණ කර අදාල අංශ වෙත යොමු කර ඇත.

(iv) මෙම ටෙන්ඩරය සීමිත ජාත්‍යන්තර තරඟකාරී ක්‍රමයට කැඳවා ඇති අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල දක්වා ඇති කාල සීමාව තුල විශේෂිත ප්‍රසම්පාදනයක් වූ මෙම ප්‍රසම්පාදනය කල නොහැකි වී ඇත. මෙම ප්‍රසම්පදානයේ දි සිදු කලයුතුව තිබූ කාර්ය පටිපාටිමය පියවර නිසි පරිදි සම්පූර්ණ කර ගැනීමේ දි ප්‍රායෝගිකව ඔබ විසින් දක්වා ඇති කාලය ගත වී ඇත.

(v) වෛද්‍ය සැපයුම් අංශය මෙම ඇණවුම් ලැයිස්තුව සංස්ථාව වෙත එවා ඇත්තේ 06.10.2017 දින වන අතර පළමු තොගය ඉල්ලා ඇත්තේ 01.01.2018 මෙම දින වකවානු සලකා බැලීමෙන් වෛද්‍ය සැපයුම් අංශය මාස 4ක් වැනි ඉතා කෙටි කාලයක් අප වෙත ලබාදීම ප්‍රායෝගික නොවේ. ප්‍රායෝගිකව අදාල පටිපාටිය අනුගමනය කරමින් මෙම කාලය සාමාන්‍යයෙන් ගත වන කාලයයි. මාස 9 1/2 කටත් පෙර පළමු තොගය සපයා ඔවුන්ගේ අවශ්‍යතාවය ඉටු කර ඇත.

(vi) 2018/SPC/L/R/D/00366 දරන ඇණවුම මඟින් ඉල්ලා ඇති අයිතම සම්බන්ධයෙන් එම අයිතම සෘජු මිලදි ගැනීම් ක්‍රමයටම දක්වා ඇති සැපයුම් කරුගෙන් ලබා ගතයුතු බවට වෛද්‍ය සැපයුම් අංශයෙන් ලිඛිතවම දැනුම් දී ඇති අතර ඒ අනුව එම සෘජු මිලදි ගැනීම් සිදුකිරීමට කටයුතු කර ඇත.

(vii) අයිතමයේ හදිසි අවශ්‍යතාවය මත සලකා බලා සභාපතිතුමා විසින් ප්‍රසම්පාදන කමිටුවේ ආවරණ අනුමැතිය ලබාගැනීමට යොමු කරමින් ලබාදුන් අනුමැතිය මත ඇණවුම නිකුත් කර ඇත.

(viii) හදිසි අවශ්‍යතාවය සලකා බලා ඇණවුම වැඩි කිරීමට ප්‍රසම්පාදන කමිටුවට යොමුකර තිබියදී ප්‍රසම්පාදන කමිටුවේ ආවරණ අනුමැතිය ලබාගන්නා ලෙස දක්වමින් සභාපතිතුමා විසින් ලබාදුන් අනුමැතිය මත මෙම ඇණවුම නිකුත්කර ඇත.

(ix) අතිරේක පිරිවැය සම්බන්ධයෙන් දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් එකඟ වෙමි. එම අතිරේක පිරිවැය ප්‍රධාන සැපයුම ප්‍රමාදවීම නිසා දරන්නට සිදුවූයේ නම් ප්‍රධාන සැපයුම කරන ලද සැපයුම් කරුගෙන් අයකර ගැනීමේ ක්‍රමවේදයක් ඇති බවද පෙන්වා දෙමි.

(x) මෙම මිලදි ගැනීම හදිසි මිලදි ගැනීමකි. හදිසි මිලදි ගැනීමකදි සීමිත කාලයක් තුල ලංසු ලබාගැනීම කලයුතු බැවින් ලංසු සුරක්ෂණය ලබාගැනීම, කාර්යය සාධන සුරක්ෂණය ලබාගැනීම, ගිවිසුම් අත්සන් කිරීම සිදුකර නොමැත. හදිසි මිලදිගැනීම් සඳහා සාමාන්‍යයෙන් අනුගමනය කරන ක්‍රියාමාර්ගය මෙය වේ.

(xi) හදිසි අවශ්‍යතාවයට මෙම ක්‍රම දෙකටම මිලදිගත් භාණ්ඩ වෛද්‍ය සැපයිම් අංශයෙන් භාරගෙන ඇත.

(xii) වෛද්‍ය සැපයිම් අංශය මඟින් එවන ඇණවුම් සඳහා ප්‍රමාණවත් මුදල් අප සංස්ථාව වෙත නියමිත වේලාවට නොලැබෙන තත්ත්වයක් යටතේ මෙවැනි තත්ත්වයන් උද්ගත වන බව දන්වනු කැමැත්තෙමි. කෙසේ වුවද අයකර ගැනීම සඳහා භර නිවේදන නිසිපරිදි වෛද්‍ය සැපයිම් අංශය වෙත යවා ඇති බව පෙන්වා දෙමි.

(ඉ) දක්වා ඇති අතිරේක පිරිවැය සම්බන්ධව සංස්ථාවේ සේවකයින් වෙත වගකිම පැවරේද යන්න සොයා බලා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළදි රු. 21,202,500 ක් වැය කර Imatinib Mesilate Capsules 100mg ඖෂධ තොග ඒකක 300,000 ක් හා 250,000 ක් වශයෙන් පිළිවෙළින් 2018 මාර්තු හා අගෝස්තු මාසයේදි සැපයිය යුතුව තිබූ අතර ඒ පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

(i) මෙම ප්‍රසම්පාදනයට අදාලව 2017 සැප්තැම්බර් 14 දින ප්‍රසම්පාදන කමිටු නිර්දේශය අවම ලංසුව ඉදිරිපත් කරනලද සැපයුම්කරු වෙත ප්‍රදානය සඳහා වුවද, එය සෘජු ප්‍රදානයක් නොවීය. එය කරුණු 2 කට යටත්ව කරන ලද ප්‍රදානයකි. එහිදි අධ්‍යක්ෂක වෛද්‍ය සැපයිම් අංශයේ අනුමැතිය ලබාගත යුතු කරුණු වශයෙන්, ගබඩාකර තැබිය යුතු උෂ්ණත්වය හා 'DHS' ලාංඡනය දක්වා ඇත. ("subject to obtaining the acceptance from D/MSD for offered storage temperature & printing 'DHS' mark on capsules shell,") මෙහි 'DHS' යන අකුරු කැප්සියුලයේ සටහන් කිරීමට නොහැකි බව ලංසුකරු ඔහුගේ ලංසුවේ සටහන් කර තිබුනි.

පසුව මෙම ප්‍රසම්පාදන කමිටු නිර්දේශයට අතිරේක ලේකම් ප්‍රසම්පාදනයේ එකඟතාවය ආදි වශයෙන් ප්‍රසම්පාදන අංශයෙන් සිදුකල යුතු කාර්ය පටිපාටියන් අවසන් කිරීමෙන් පසු ප්‍රසම්පාදන තීරණය සහිත ලිපිගොනුව ආනයන අංශය වෙත යොමු කරන ලදි. නමුත් ඉහත කි ප්‍රසම්පාදන කමිටු තීරණයෙහි සටහන් කරුණු වලට වෛද්‍ය සැපයුම් අංශයෙන් පිළිතුරු ලබාදිමට කාලයක් ගත කොට ඇති අතර ඇති වන ප්‍රමාදය වළක්වා ගැනිමට අවසානයේදි වෛද්‍ය සැපයිම් අංශයෙන් පිළිතුරු ලැබිමට ප්‍රථම ඉහත කි ප්‍රසම්පාදන කමිටු තීරණයේ අඩංගු කොන්දේසි වලට යටත්ව සැපයුම්කරු වෙත ලංසු ප්‍රදානය දැනුම් දෙන ලදි.

සැපයුම්කරු විසින් පළමු ඖෂධ තොගය සැපයිය යුතු දිනට සැපයීම සිදුකර නොනිබිමට අදාලව සැපයුම් කරුගෙන් ටෙන්ඩර් කොන්දේසි වලට අනුකූලව අයකිරීමට පියවර ගනු ලබේ.

(ii) වෛද්‍ය සැපයිම් අංශය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනය එක් එක් ඖෂධ අභ්‍යන්තර හා බාහිර ඇසුරුම් තුල මුද්‍රණය නොකොට, අත ඇති තොග (ex-stock quantity) වලින් පළමු තොගයෙන් කොටසක් භාර ගැනිමට එකඟතාවය පලකරන ලදි.

සැපයුම්කරු විසින් සැපයිමට ඉතිරිව තිබූ තොගයේ බාහිර ඇසුරුමේ පමණක් රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර භාරගැනිමට වෛද්‍ය සැපයිම් අංශය විසින් දෙවනුව අනුමැතිය දෙන ලදි.

(iii) (iv) (v) හදිසි මිලදි ගැනිමක් බැවින් දක්වා ඇති කරුණු සම්පූර්ණ කරගැනිමට නොහැකිවී ඇති බව පෙනි යයි.

(උ) කර්ණ ශංඛ බද්ධ උපකරණ මිලදි ගැනිම සම්බන්ධයෙන්,

(i) 2017 වර්ෂයේ අවශ්‍යතාවයට අදාළ ප්‍රසම්පාදනය සඳහා ටෙන්ඩර් කැඳවීමේ ලිපි 2017/05/05 දින යොමු කර ඇති අතර ටෙන්ඩරය වසන ලද්දේ 2017/05/26 දින වන අතර දින 21ක කාල පරාසයක් සහිතව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරවය.

(ii) දිප ව්‍යාප්ත ටෙන්ඩර සඳහා සෑම අදාල ප්‍රධාන තොරතුරු ප්‍රචාරක දැන්වීම් මඟින් රජයේ පුවත්පතෙහි ද, SPC වෙබ් අඩවියෙහිද, විදේශ කටයුතු අමාත්‍යාංශ වෙබ් අඩවි හරහා කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම් කරුවන් සහභාගි වීමට අවකාශ ඇති රටවල තානාපති කාර්යාලවලට හා වෙළඳ නියෝජිතයින් වෙත දැනුම් දීමට කටයුතු කර ඇත. ඒ අනුව අදාල ප්‍රසම්පාදනය සඳහා උපරිම ප්‍රචාරයක් ලබාදි තරඟකාරීත්වය ආරක්ෂා කර ඇති බව දන්වමි.

(iii) සෑම ඇණවුම් ලැයිස්තුවකම පිරිවිතරය සකස් කර එවනු ලබන්නේ වෛද්‍ය සැපයුම් අංශයෙන් වන අතර එම පිරිවිතරය Formulary Revision Committee මඟින් අනුමත කරන ලද පිරිවිතරයන්ය. මෙම පිරිවිතර වෙනස් කිරීමට හා කිසිදු සංශෝධනයක් කිරීමට ඇත්නම් නැවතත් අධ්‍යක්ෂක වෛද්‍ය සැපයිම් හරහා එම කමිටුවටම යොමු කරනු ලබයි, එමෙන්ම ඇණවුම් ලැයිස්තුවක අඩංගුවන අයිතම සංඛ්‍යාවද අධික බැවින් එකිනෙක පිරිවිතර අනුමත කරගැනිම ප්‍රායෝගිකව අපහසු අතර ප්‍රසම්පාදනයේ ප්‍රමාදයන්ද ඇති කරයි.

(iv) කරුණු පිළිගත නොහැක. අදාල වාර්තාව පරිපාලන අංශය මඟින් පවත්වාගෙන යනු ලබන අතර එහි මෙම ටෙන්ඩරයට අදාල පිටපතක් ඔබගේ දැනගැනිම සඳහා අමුණා ඇත

(v) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 මාර්ගෝපදේශයට අදාළ අංක 31 දරන අතිරේකය නිකුත් කර ඇත්තේ 2017 මාර්තු 15 වන දින වන අතර මෙම ප්‍රසම්පාදනය සඳහා ඇණවුම් ලැයිස්තුව ලැබී ඇත්තේ 2016/02/24 වන දිනය

(vi) මෙම ලිපිගොනුව අදාල තිරණයන් දෙනු ලබන ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කර ඇති අතර ප්‍රසම්පාදන තිරණය ගැනිම ප්‍රසම්පාදන කමිටුව සතුවන අතර එසේ ගනු ලබන තිරණය රාජ්‍ය අයතනයක් වශයෙන් රජයට උපරිම ඵලදායත්වයක් වන ආකාරයට සිදුකරනු ලබයි.

(vii) ලංසුකරුගේ අයිතිය බැහැර කිරීමට හේතු ලංසුකරු වෙත පැහැදිලිව දැනුම් දෙන ලද අතර විගණනය සඳහා ද තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තා පිටපතක් මේ සමඟ අමුණමි.

(viii) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත අනුව PCA-3 ලබා ගත්තේ නම් පනත ප්‍රකාරව දෙවන වරට ලියාපදිංචි කලයුතු බව ඖෂධ සංස්ථාව මඟින් පලකරන ටෙන්ඩර දැන්වීම (ඇමුණුම V) තුලම සඳහන් කර ඇත. කෙසේ හෝ නැවත මතක් කිරීමක් වශයෙන් 2018/07/06 වැනි දින සමාගම් රෙජිස්ට්‍රාර් අමතා ලිපියක් ද එහි පිටපතක් අදාල සැපයුම්කරු වෙත ද තැපෑලෙන් යවා ඇත.

5.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

(අ) ප්‍රස්තුත ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු වලට අදාල වන කොන්ත්‍රාත් විවලනයන් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන අත්පොතෙහි 8:13:4 වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමට හා අලුතින් හඳුනාගත් වැඩ සඳහා නව ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුලින් හෝ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3:5:1 මාර්ගෝපදේශයෙහි සඳහන් උපදෙස් ප්‍රකාරව සෘජු කොන්ත්‍රාත් ක්‍රමය අනුගමනය කරමින් නව කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් ලබා දී තිබූ උපදෙස් වලට අනුගත වෙමින් මේ වන විට එකී ගොඩනැගිල්ලෙහි කටයුතු අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනයකර ඇති බවට ඔබගේ කාරුණික අවධානය යොමු කරමි.

(ආ)

I. අදාල නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. නමුත් ප්‍රස්තුත අළුත්වැඩියාව/ වැඩිදියුණු කිරීම විශේෂ තාක්ෂණික අවස්ථානුගත කටයුත්තක් වන බැවින් අදාල නියෝජිත ආයතනය විසින් ඉටුකළ යුතුව ඇති නිසා ඔවුන්ගේ තාක්ෂණික වාර්තාව හා මිලගණන් පදනම් කර ගනිමින් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කිරීමෙන් අනතුරුව අදාල නියෝජිත ආයතනය සමඟ එකී අළුත්වැඩියාව/ වැඩිදියුණු කිරීම සඳහා ගිවිසුම්ගත වීමෙන් සහ අදාල කොන්ත්‍රාත්තුව සඳහා නියමිත කාර්යසාධන සුරක්ෂණයන් ලබාගැනිමෙන් අනතුරුව එකී අත්තිකාරම් මුදල නිදහස් කර ඇත.

II. ප්‍රස්තුත අළුත්වැඩියාව/ වැඩිදියුණු කිරීම අත්තිකාරම් මුදල ලැබූ දින සිට සති 10 ක් ඇතුලත නිමකල යුතුව ඇති බව කොන්ත්‍රාත් ගිවිසුමෙහි සඳහන් වන බව සත්‍යක් වුවද මෙම කටයුත්ත විශේෂ හා තාක්ෂණික අවස්ථානුකූල කටයුත්තක් වන බැවින් ඊට අදාල තාක්ෂණික උපාංග ආනයනය කිරීමේදී සිදුවූ ප්‍රමාදයන් හේතුවෙන් අළුත්වැඩියාව/ වැඩිදියුණු කිරීම නිමකිරීමට කිසියම් කාලයක් ගතවී ඇති බව අපගේ හැඟීමයි. තවද, මෙම විදුලි සෝපානයෙහි අළුත්වැඩියාව/ වැඩිදියුණු කිරීම රත්මලාන ගබඩාවේ දෛනික මෙහෙයුම් කටයුතු සිදුකරන අතරතුරදී සිදුකිරීම තුලත් කිසියම් ප්‍රමාදයක් සිදුවූ බව අපගේ හැඟීමයි. කෙසේ නමුත් ප්‍රස්තුත අළුත්වැඩියාව/ වැඩිදියුණු කිරීම. සාර්ථකව නිමකර අදාල නියෝජිත ආයතනයෙහි ආරක්ෂක කළමනාකරු (Safety Manager) හා සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ යාන්ත්‍රික ඉංජිනේරු (Mechanical Engineer) විසින් පරීක්ෂා කරන ලදුව එකී සහතික කිරීම සමඟ 2019-03-13 වන දින අප වෙත භාරදී ඇති බව වැඩිදුරටත් දන්වා සිටිමි.

III. ප්‍රස්තුත අළුත්වැඩියාව/ වැඩි දියුණු කිරීමේ කටයුත්ත ප්‍රමාදයක් සහිතව වුවත් අබණ්ඩව සිදුකෙරේ. පවතින ක්‍රියාවලියක් බැවින්ද අදාල අළුත්වැඩියාව/ වැඩිදියුණු කිරීම රත්මලාන ගබඩාවේ දෛනික මෙහෙයුම් කටයුතු සඳහා ඉතා අත්‍යවශ්‍ය හා වැදගත් කටයුත්තක් වන බැවින්ද, එම කටයුත්ත නිසිලෙස නියෝජිත ආයතනය මඟින්ම නිමකර ගැනීමේ අරමුණින් යුතුව සහ නැවත ටෙන්ඩර් කැඳවීමෙන් ආර්ථික ප්‍රතිලාභයක් හෝ වාසියක් නොලැබෙන හෙයින්ද නියෝජිත ආයතනය විසින් ඉදිරිපත් කර ඇති කාර්යසාධන සුරක්ෂණය මුදල්කර ගැනීමේ අවශ්‍යතාවයක් පැන නොනැගී බව අපගේ අදහසයි.

සභාපති,
රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව,
2019 මැයි මස 09 වන දින

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව
මානව සම්පත් විශ්ලේෂණය

සේවක වර්ගීකරණය



සේවක කාල පරිච්ඡේදය



සේවක වයස් විශ්‍රහය



(රු.000)



ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිර්මාණ සංස්ථාව
වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු - ආදායම් වාර්තාව

රු. "000"

පිරිවැටුම

විස්තරය	2018 රු.	2017 රු.	2016 රු.	2015 රු.	2014 රු.	2013 රු.	2012 රු.	2011 රු.	2010 රු.	2009 රු.
පිරිවැටුම - රා.ඖ.ස	7,458,320	6,593,401	6,127,478	5,286,876	4,865,151	4,320,300	4,283,232	4,806,170	4,197,759	4,015,962
පිරිවැටුම - රා.බෙ.ග	31,436,986	25,970,290	26,127,912	19,176,807	17,269,008	16,815,666	16,608,492	12,569,290	10,968,571	9,990,429
මුළු පිරිවැටුම	**38,895,306**	**32,563,691**	**32,255,390**	**24,463,683**	**22,134,159**	**21,135,966**	**20,891,724**	**17,375,460**	**15,166,330**	**14,006,391**
දළ වෙළඳ ලාභය - රා.ඖ.ස	1,810,383	1,680,368	1,656,938	1,410,722	1,247,074	1,136,403	991,541	1,043,453	995,371	894,232
දළ අතිරික්තය - රා.බෙ.ග	2,125,052	1,887,026	1,850,650	1,386,731	1,333,198	1,185,004	1,193,214	780,735	688,145	622,071
අතිරික්තය	**3,935,435**	**3,567,394**	**3,507,588**	**2,797,453**	**2,580,272**	**2,321,407**	**2,184,755**	**1,824,188**	**1,683,516**	**1,516,303**

පොදුකාර්ය පිරිවැය

වෙනත් ආදායම්	73,072	53,004	43,085	51,259	25,738	17,537	15,105	23,231	20,414	18,107
පොදුකාර්ය පිරිවැය	(1,535,277)	(1,288,183)	(1,101,435)	(1,057,970)	(969,744)	(786,904)	(670,635)	(614,019)	(605,475)	(573,322)
වෙනත් මෙහෙයුම් වියදම්	(691,967)	(741,459)	(580,843)	(563,357)	(749,825)	(791,794)	(745,230)	(492,631)	(285,777)	(203,520)
මෙහෙයුම් ලාභය	1,781,263	1,590,756	**1,868,392**	**1,227,385**	**886,441**	**760,246**	**783,995**	**740,769**	**812,678**	**757,568**
මූල්‍ය පිරිවැය	(1,512)	(1,295)	(1,071)	(1,599)	(124)	(227)	(17)	(3,661)	(17,734)	(8,841)
බැංකු අයිරා මත පොළි	(67,406)	(35,199)	(5,434)	(734)	(149,659)	(1,384)	(290,877)	(419,235)	(315,070)	(350,841)
මුළු පොදුකාර්ය පිරිවැය	**(2,296,162)**	**(2,066,136)**	**(1,688,783)**	**(1,623,660)**	**(1,869,352)**	**(1,580,309)**	**(1,706,759)**	**(1,529,546)**	**(1,224,056)**	**(1,136,524)**
මූල්‍ය ආදායම්	7,436	5,765	5,721	5,086	4,896	4,357	3,959	4,102	3,900	3,302
බදු පෙර ලාභය	**1,719,781**	**1,560,027**	**1,867,608**	**1,230,137**	**741,554**	**762,992**	**497,060**	**321,975**	**483,774**	**401,188**
ආදායම් බදු	766,632	470,595	625,863	610,539	192,145	320,008	205,282	228,473	243,907	144,883
වර්ෂය සඳහා ශුද්ධ ලාභය	**953,149**	**1,089,432**	**1,241,744**	**619,598**	**549,409**	**442,984**	**291,778**	**93,502**	**239,867**	**256,305**
විදාමික පාරිනෝමික බැඳියාව	30,453	(59,575)	10,049	239,887	(212,044)	(31,574)	(14,281)	11,325	-	-
එකතු විස්තීරණ ආදායම	**983,603**	**1,029,856**	**1,251,794**	**859,485**	**337,365**	**411,410**	**277,497**	**104,827**	**239,867**	**256,305**



මූලික අනුපාත

දළ ලාභ අනුපාතය - රා.ඖ.ස (%)	24.3	25.5	27.04	26.68	25.63	26.3	23.15	21.71	23.71	22.27
දළ ලාභ අනුපාතය - රා.බෙ.ග (%)	6.76	7.27	7.08	7.23	7.72	7.05	7.18	6.21	6.27	6.23
දළ අතිරික්තයට විකුණුම් (%)	10.12	10.96	10.87	11.44	11.66	10.98	10.46	10.50	11.10	10.83
වාර්ෂික විකුණුම් වර්ධනය - රා.ඖ.ස (%)	13.12	7.60	15.90	8.67	12.61	0.9	(10.88)	14.49	4.53	13.21
වාර්ෂික විකුණුම් වර්ධනය- රා.බෙ.ග (%)	21.05	(0.60)	36.25	11.05	2.6	1.2	32.1	14.59	9.79	7.35
සමස්ථ විකුණුම් වර්ධනය (%)	19.44	0.96	31.85	10.52	4.72	1.17	20.24	14.57	8.28	8.97

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිර්මාණ සංස්ථාව
වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු - මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

රු. "000"

විස්තරය	2018 රු	2017 රු	2016 රු	2015 රු	2014 රු	2013 රු	2012 රු	2011 රු	2010 රු	2009 රු
දායක ප්‍රාග්ධනය හා සංචිත	**125,117**	**125,117**	**125,117**	**125,117**	**125,117**	**125,117**	**125,117**	**3,502,607**	**3,412,780**	**2,418,452**
ජංගම වත්කම්										
තොගය - රා.ඖ.සේ	2,792,111	1,798,403	2,009,502	2,364,091	1,385,477	1,703,222	1,231,857	987,733	979,315	777,682
මාර්ගස්ථ තොගය - ර.ගෙ.ගෙ	286,587	630,130	540,693	788,342	528,710	809,462	734,963	1,985,991	2,755,465	1,105,247
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු	16,319,413	7,901,244	4,521,175	3,051,445	2,370,323	8,881,602	11,113,022	5,123,702	3,453,354	2,139,755
තැන්පතු හා පෙර ගෙවීම්	61,219	57,979	37,614	33,046	37,964	32,948	24,073	24,479	22,369	11,564
අතැති මුදල් හා බැංකු මුදල්	1,021,185	312,050	244,947	790,525	801,717	1,200,667	216,359	600,807	671,104	263,769
මුළු ජංගම වත්කම්	**20,480,515**	**10,699,807**	**7,353,931**	**7,027,449**	**5,124,191**	**12,627,901**	**13,320,274**	**8,722,712**	**7,881,607**	**4,298,017**
ජංගම වගකීම්										
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු	10,423,896	3,996,134	2,657,620	3,347,410	2,235,194	3,649,362	3,032,684	1,784,156	1,551,401	739,514
ගෙවිය යුතු ආදායම් බදු	447,869	337,976	519,770	397,758	180,617	290,045	191,440	219,332	232,469	200,169
විලම්බිත ආදායම්	1,345	927	1,103	1,005	748	889	1,292	318	1,559	-
ජංගම මූල්‍ය වගකීම්	2,639,033	1,361,444	39,703	56,689	78,739	6,254,353	7,896,709	4,716,655	4,131,544	1,458,538
මුළු ජංගම වගකීම්	**13,512,143**	**5,696,481**	**3,218,196**	**3,802,862**	**2,495,298**	**10,194,649**	**11,122,125**	**6,720,461**	**5,916,973**	**2,398,221**
ජංගම නොවන වත්කම්	2,222,544	2,179,335	2,166,630	2,156,615	2,138,973	1,858,832	1,698,279	1,605,438	1,561,496	639,231
ජංගම නොවන වගකීම්	271,308	264,651	192,213	233,394	372,220	158,803	124,558	105,082	113,350	120,575
ශුද්ධ වත්කම්	**8,919,608**	**6,918,010**	**6,110,152**	**5,147,807**	**4,395,646**	**4,133,281**	**3,771,870**	**3,502,607**	**3,412,780**	**2,418,452**
මූලික අනුපාත										
වත්කම් පිටිවැටුම් අනුපාතය (වාර)	1:1.71	1:2.53	1:3.39	1:2.66	1:3.05	1:1.46	1:1.39	1:1.68	1:1.61	1:2.84
ජංගම අනුපාතය (වාර)	1:1.51	1:1.88	1:2.29	1:1.85	1:2.05	1:1.24	1:1.2	1:1.3	1:1.33	1:1.79
ද්‍රවශීලතා අනුපාතය (වාර)	1:1.28	1:1.45	1:1.49	1:1.01	1:1.28	1:0.99	1:1.02	1:0.85	1:0.7	1:1.
පොලි ආවරණය (වාර)	26.51	45.32	344.6	1676.9	5.95	552.3	2.7	1.8	2.5	2.1
තොග පිටිවැටුම් අනුපාතය (වාර) රා.ඖ.සේ	2.46	2.58	2.04	2.07	2.34	2.17	2.97	3.83	3.65	3.5

විකුණුම් ජාලය

ප්‍රධාන කාර්යාලය

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව
75, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 01. ශ්‍රී ලංකාව.
දුරකථන: 011-2320356 – 9 ෆැක්ස්: 011-2447118 වෙබ් අඩවිය: www.spc.lk විද්‍යුත් තැපෑල්: spc@spc.lk

විකුණුම් අංශය
109 කඳවල වත්ත
රත්මලාන.
දු.ක. 011-2632288
ෆැක්ස්: 011-2632962

ගබඩාව
109 කඳවල වත්ත
රත්මලාන.
දු.ක. 011-2634318
ෆැක්ස්: 011-2636715

පිවනි අංශය
109 කඳවල වත්ත
රත්මලාන.
දු.ක. 011-2622334

මහනුවර ගබඩාව
10/B/1, හේවාහැට පාර,
තැන්නේකුඹුර, මහනුවර.
දු.ක. 081-2240274

රාජ්‍ය ඔසුසල්

ඔසුසල අම්පාර
පන්සල් හන්දිය,
ඩී.එස්. සේනානායක මාවත,
අම්පාර. දු.ක. 063-2223088

නව ඔසුසල බදුල්ල
සතොස ගොඩනැගිල්ල
බණ්ඩාරවෙල පාර,
බදුල්ල. දු.ක. 055 2229837

ඔසුසල කොළඹ 01
75 ශ්‍රීමත් බාරොන් ජයතිලක
මාවත
කොළඹ 01.
දු.ක. 011-2328046

ඔසුසල ඇඹිලිපිටිය
102, පල්ලේගම,
ඇඹිලිපිටිය.
දු.ක. 047-2261177

ඔසුසල හම්බන්තොට
නො 3 බැරැක්ක විදිය,
හම්බන්තොට.
දු.ක. 047-2222163

ඔසුසල කරාපිටිය
175,හිරිඹුර පාර,
කරාපිටිය.
දු.ක. 091 2226947

ඔසුසල මාතර
23 බී. වාරිකාරාමය
අනගාරික ධර්මපාල මාවත,
මාතර දු.ක. 041-2231871

ඔසුසල මිගමුව
නො. 134, කොළඹ පාර,
මිගමුව.
දු.ක. 031- 2228599

ඔසුසල - පේරාදෙණිය
1157, ගැටඹේ,
පේරාදෙණිය,
දු.ක. 081-2386045

ඔසුසල රත්මලාන
මෙගා ස.තො.ස.
ගොඩමඩම හංදිය, ගාලපාර,
රත්මලාන.
දු.ක. 011-3043789

ඔසුසල - අක්කරෙයිපත්තුව
74, T.D.02 කෙළින්විදිය,
අක්කරෙයිපත්තුව.
දු.ක. 067-2057625

ඔසුසල බන්ඩාරගම
රෝහල පරිශ්‍රය,
හොරන පාර, බන්ඩාරගම.
දු.ක. 038-2288671

ඔසුසල කොළඹ 04
85 ගාල පාර,
කොළඹ 04.
දු.ක. 011-2587128

ඔසුසල කොටුව
කොටුව දුම්රිය ස්ථානය,
කොටුව.
දු.ක. 011-2336926

ඔසුසල ජයවර්ධනපුර
ශ්‍රී ජයවර්ධනපුර රෝහල,
ශ්‍රී ජයවර්ධනපුර.
දු.ක. 011-2779414

ඔසුසල (මහනුවර දුම්රිය ස්ථානය,)
මහනුවර දුම්රියපළ,
මහනුවර.
දු.ක.081-2225176

ඔසුසල මිනුවන්ගොඩ
24. පරණ නගරසභා ගොඩනැගිල්ල
කොළඹ පාර, මිනුවන්ගොඩ.
දු.ක. 011-2295120

ඔසුසල නින්දවූර්
අංක. 40, කෙලින් විදිය,
නින්දවූර්.
දු.ක. 067-2058208

ඔසුසල පිළියන්දල
1A/21,විද්‍යාල මාවත,
පිළියන්දල.
දු.ක. 011-2613640

ඔසුසල රත්නපුර
32 නන්ද එල්ලාවල මාවත,
රත්නපුර.
දු.ක. 045-2223014

ඔසුසල අනුරාධපුර
බැංකු විදිය
අනුරාධපුර
දු.ක. 025-2222181

ඔසුසල බේරුවල
M.P.C.S.ගොඩනැගිල්ල
ගාලපාර, බේරුවල.
දු.ක. 034-2278578

ඔසුසල කොළඹ 07
255, ධර්මපාල මාවත,
කොළඹ 7. දු.ක.011-2694716,
011-2672293

ඔසුසල ගාල්ල
61ඒ වක්වැල්ල පාර
ගාල්ල.
දු.ක. 091-2234726

ඔසුසල යාපනය
149A, කේ.කේ.එස්.පාර,
යාපනය
දු.ක. 021- 2219262

ඔසුසල කුරුණෑගල
28, විරතුංග ගොඩනැගිල්ල,
බෞද්ධාලෝක මාවත,
කුරුණෑගල.
දු.ක. 037-2230840

ඔසුසල - මොනරාගල
31, පොතුවිල් පාර,
මොනරාගල
දු.ක. 055-2277712

ඔසුසල නුගේගොඩ
145A/1,එස්.ද.එස්. ජයසිංහ
මාවත නුගේගොඩ
දු.ක. 011-2856641

ඔසුසල පොළොන්නරුව
රෝහල හන්දිය,
කදුරුවෙළ පාර,
පොළොන්නරුව.
දු.ක.027 2225465

ඔසුසල තංගල්ල
අංක 8 ඉදිපොකුණුගොඩ පාර,
තංගල්ල.
දු.ක. 047 2241221

ඔසුසල අවිස්සාවේල්ල
G 33/34/35,
මධ්‍යම වෙළඳපල,
අවිස්සාවේල්ල.
දු.ක. 036-2222501

ඔසුසල බොරැල්ල
ළමා රෝහල පරිශ්‍රය,
බොරැල්ල.
දු.ක. 011-2697660

ඔසුසල දියතලාව
කෙලින් විදිය
දියතලාව
දු.ක. 055- 3551624

ඔසුසල ගම්පහ
266, කොළඹ පාර
ගම්පහ.
දු.ක. 033-2234516

ඔසුසල මහනුවර
14ඒ, ළමාගාර මාවත,
මහනුවර.
දු.ක.081-2225175

ඔසුසල මහරගම
71/9 අල්විස් ගොඩනැගිල්ල
පරණ පාර, මහරගම.
දු.ක. 011-2745640

ඔසුසල නාගොඩ
නො. 313, මතුගම පාර,
නාගොඩ, කළුතර,
දු.ක. 034- 2222818

ඔසුසල පානදුර
159, MPCS ගොඩනැගිල්ල,
ගාලපාර, පානදුර.
දු.ක. 038-2234767

ඔසුසල රාගම
අංක 61ඒ, මහබාගෙ පාර,
රාගම.
දු.ක. 011- 2955219

අලෙවි හා විකුණුම් අංශය

නො 75, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01. දුරකථන : 011-2430778,011-2328507,011-2320356 - 9

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

75, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව